# ඉස්ලාමයට එරෙහි පදනම් විරහිත චෝදනාවන්ට පිළිතුරු ගොනුව

ඉකුත් කාලයේදී සමස්ත ලංකා ජම්ඉයියතුල් උලමා සංගමයට ඉදිරිපත් කළ ඉස්ලාමයට එරෙහි පදනම් විරහිත චෝදනාවන්ට පිළිතුරු ගොනුව

جمعية علماء سريلانكا
සමස්ථ ලංකා ජම්ඉයියතුල් උලමා
அகில இலங்கை ஜம்இய்யத்துல் உலமா
ALL CEYLON JAMIYYATHUL ULAMA

# ඉස්ලාමයට එරෙහි පදනම් විරහිත චෝදනාවන්ට පැහැදිලි විග්‍රහයන්

සමීප කලක පටන් ඉස්ලාම් විරෝධී වෙබ් අඩවි මගින් හා සමාජ මාධ්‍යය ඔස්සේ පිවිතුරු ඉස්ලාමයට කැළලක් එක් කිරීමට ඉස්ලාම් විරෝධීන් උත්සුක වීම අප නිතර සවන් දෙන්නෙමු. එමෙන්ම විවිධ චෝදනා ඉදිරිපත් කර තිබීම ද අප අසා ඇත්තෙමු.

අප සංවිධානය සහෝදර ලාංකේය ප්‍රජාවට ඉස්ලාමය පිළිබඳව මතුවන්නා වූ ගැටළු පහදා දීමට බැඳී සිටින අතර ඉස්ලාමය පිළිබඳව කරුණු විකෘති කරමින් පල වන්නා වූ වෙබ් අඩවි කරා නොගොස් ඔබගේ ප්‍රශ්න අප වෙත යොමු කරන මෙන් දන්වා සිටින්නෙමු. වර්තමානයේ ඉස්ලාමය විකෘති කිරීම හා එවන් ඉස්ලාම් භීතිකා ප්‍රචාර ප්‍රචලිත කිරීම ජාත්‍යන්තරව ඉතා ලාභදායි කර්මාන්තයක් බවට පත්ව ඇත. මේ සියල්ල කිසිදු පදනමකින් තොර වූ ඉස්ලාම් වෛරය හා පිළිකුල ඇති කිරීම සඳහා තුනී වාතයෙන් අහුලා ගත් හුදු හිස් ප්‍රලාප බව අවධාරණය කරන්නෙමු.

ඇතැම් ඉස්ලාම් විරෝධීන් විසින් ඉස්ලාමය පිළිබඳ නොයෙකුත් ව්‍යාජ මතයන් සමාජ ගත කරමින් "බොරුව හා මුලාව, හිංසනය හා භීෂණය හා සමාජ සංහිඳියා විරෝධී ක්‍රියා" යනාදිය ඉස්ලාමයේ සංකල්පයන් බව දැක්වීමට වෙර දරා ඇති අන්දම අපට ඉතා පහසුවෙන් වටහා ගත හැක.

ලොව පවතින අනෙකුත් ආගම් වලට සමානව හෝ ඊටත් වඩා ඉස්ලාමය සහජීවනය හා සංහිඳියාව අවධාරණය කරන්නක් බව දන්වා සිටින්නට කැමැත්තෙමු. මේ පිළිබඳව නිදසුන් රාශියක් තිබෙන අතර ශ්‍රී ලාංකේය මුස්ලිම් ජනයා එම ඉගැන්වීම් වචනයට සීමා නොකොට ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ අන්දම ශ්‍රී ලාංකේය මුස්ලිම්වරුන්ගේ සහශ්‍රයකට අධික ඉතිහාසය ඊට කදිම නිදසුනක් ලෙස අප ඉදිරියේ පවතී. මෙම මාතෘකාව පහතින් සාකච්ඡා කරන අවස්ථාවේ දී මෙම නිදසුන් ගෙනහැර දක්වන්නට කටයුතු කර ඇත්තෙමු.

ඇතැම් ඉස්ලාම් විරෝධී විවේචකයින් ඉතා නුසුදුසු ප්‍රකාශ භාවිතයෙන් ඉස්ලාමයට චෝදනා ඉදිරිපත් කළද එලෙසින්ම සමාන වාක්‍යයන් හා වදන් උපයෝගී කර ගනිමින් කරුණු පහදා දෙන්නට හෝ පිළිතුරු සපයන්නට ඉස්ලාම් දහමේ ඉගැන්වීම් අනුව අනුමැතියක් නොමැති බව ඉතා නිහතමානීව ප්‍රකාශ කර සිටින්නෙමු. ජනයා සමග අන්තර් ක්‍රියාකාරකම් පවත්වා ගැනීමේ දී අල් කුර්ආනයේ හා මුහම්මද් තුමාණන්ගේ ශ්‍රේෂ්ඨ ඉගැන්වීම් හා මග පෙන්වීම් අනුව කටයුතු කිරීමට අපි බැඳී සිටින්නෙමු.

**යහපත මගින් අයහපත වළක්වාළීම**

"තවද යහපත හා අයහපත සම නොවන්නේය. (එබැවින්) ඉතා යහපත් දැයින් (අයහපත) වළක්වවු." (අල් කුර්ආනය 41:34)

**මෘදු ලෙස හැසිරීම සමාව දීම**

"තවද කවරෙකු ඉවසිලිමත් වී සමාව දුන්නේ ද සැබැවින්ම එය ස්ථිර කරුණු වලින්ය.[1]" (අල් කුර්ආන් 42:43)

"තවද මිනිසුන්ගෙන් නුඹගේ කම්මුල (අහංකාරයෙන්) හරවා නොගනිවු. මිහිතලයේ උඩඟු ලීලාවෙන් නොඇවිදිවු. සැබැවින්ම **අල්ලාහ්** ගර්වයෙන් යුතුව පුරසාරම් දොඩන්නන්ව ප්‍රිය නොකරන්නේය." (අල් කුර්ආන් 31:18)

"තවද ඔවුහු මහා පාපයන් හා අශික්ෂිත දැයින් වැළකෙති. තවද ඔවුහු කෝපයට පත් වූ විට සමාව දෙන්නන් වෙති." (අල් කුර්ආන් 42:37)

**යුක්තිගරුක වීම**

"විශ්වාස කළවුනි, **අල්ලාහ්** වෙනුවෙන් (ඔහුගේ නියෝගයන් පිළිපැදීමට) ස්ථිර වූවන් ලෙස හා යුක්තිය සඳහා සාක්ෂිකරුවන් ලෙස වවු. තවද සැබැවින්ම පිරිසකගේ ක්‍රෝධය නුඹලා යුක්තිය ඉටු නොකිරීම කෙරෙහි නුඹලාව පොලඹවිය නොයුතුය. (සෑම අවස්ථාවකම) නුඹලා යුක්තිය ඉටු කරවු. එය බිය

1) ෂරීආ පිළිවෙත අනුව අපරාධයකට සම ප්‍රතිදඬුවම් කිරීමේ අයිතිය තිබුණ ද එවන් අවස්ථාවන්හි දී ඉවසිලිවන්තව සමාව දීම උසස් ක්‍රියාවක් ලෙස සැලකේ. එබැවින් මෙම වැකියේ ස්ථිර කරුණ වශයෙන් අදහස් කරනුයේ මෙම උසස් ක්‍රියාවයි. සමස්තයක් වශයෙන් ෂරීආ පිළිවෙත ශ්‍රේෂ්ඨ මානුෂීය අගයන් මත ගොඩ නැගී ඇති බව මෙයින් පැහැදිලි වේ.

භක්තියට ඉතා සමීපය. තවද **අල්ලාහ්**ට බිය භක්තිමත් වවු. සැබැවින්ම නුඹලා කරන දෑ පිළිබඳව **අල්ලාහ්** අභිඥානවන්තය." (අල් කුර්ආන් 5:8)

එමෙන්ම මුහම්මද් තුමාණන් පවා මෙලොවට පැමිණි පරමාර්ථය වන්නේ යහකම හා සාරධර්ම පරිපුර්ණත්වයට ගෙන ඒමයි. තවත් නබි වදනට අනුකූලව සැබෑ මුස්ලිම්වරයෙකුගේ ගුණාංගයක් වන්නේ යහපත කථා කිරීම වන අතර යමක් තමන්ට නොදන්නේ නම් නිහැඬියාවෙන් සිටින ලෙස අණ කොට ඇත. (අල් බුහාරි, අහමද්)

එහෙයින් ඉහත ඉගැන්වීම් හා අනුකූලත්වකින් යුක්තව සැබෑ මුස්ලිම්වරයෙකු වශයෙන් ජීවත් වීමට අප සැදී පැහැදී සිටින අතර ඒ අයුරින්ම මෙම පැහැදිලි කිරීමේ පොත් පිංච සකසන්නට කටයුතු කොට ඇත්තෙමු.

## ඉස්ලාමය තුළින් සත්‍යය කථා කිරීමට දිරි ගැන්වීම

"නුඹලා දැනගෙන සිටින තත්ත්වයේ අසත්‍යය සමග සත්‍යය නොපටලවවු. තවද නුඹලා සත්‍යය නොසඟවවු". (අල් කුර්ආන් 2:42)

මුහම්මද් තුමාණන් මෙසේ පැවසුහ. "තමා නිවැරදි වුවද එය වෙනුවෙන් (අනිසි ලෙස) වාද විවාද කිරීමෙන් වැළකී සිටින පුද්ගලයාට ස්වර්ගය අවට නිවසක් ලබා දෙන බවටද, විහිළුවකට හෝ බොරුවක් නොකියන පුද්ගලයාට ස්වර්ගය මැද නිවසක් ලබා දෙන බවටද, තම චරිතය යහපත්ව තබා ගන්නා පුද්ගලයාට ස්වර්ගයේ ඉහළම කොටසේ නිවසක් ලබා දෙන බවටද මම සහතික වන්නෙමි." (සුනන් අබු දාවුද්)

මුහම්මද් තුමාණන් මෙසේ පැවසුහ. "පහත සඳහන් ගුණාංග හතර ඔබට තිබේ නම් ඔබට ලොවෙහි කිසිවිටෙකත් අලාභයක් ඇති නොවන්නේය. ඔබගේ භාරකාරත්වයේ තබන ලද දෑ රැකගැනීම, කථාවෙහි සත්‍යවාදී වීම, අලංකාර වූ හා යහපත් හැසිරීම, ආහාර අනුභවයෙහි මධ්‍යස්ථභාවය එම ගුණාංගයි" (අහමද් සහ බයිහාකි)

"මම ඔබට සත්‍යවාදී වන ලෙස දන්වමි. සැබැවින්ම සත්‍යවාදී වීම ධර්මිෂ්ඨත්වය කරා යොමු කරයි. ධර්මිෂ්ඨත්වය ස්වර්ගය කරා යොමු කරයි. අල්ලාහ් අභියස සත්‍යවාදියෙකු ලෙස ලියාගනු ලබන තෙක් මිනිසෙකු සත්‍යවාදීව කටයුතු කරන අතර සත්‍යවාදීත්වය උදෙසා ප්‍රයත්න දරයි. අසත්‍යවාදීකම ගැන ප්‍රවේසම් වන්න. අසත්‍යවාදීකම පාපය කරා යොමු කරයි. පාපය නිරා ගින්න කරා යොමු කරයි. අල්ලාහ් අභියස අසත්‍යවාදියෙකු ලෙස ලියාගනු ලබන තෙක් මිනිසෙකු අසත්‍යවාදීව කටයුතු කරන අතර අසත්‍යවාදීත්වය උදෙසා ප්‍රයත්න දරමින් සිටියි". (සහීහ් මුස්ලිම්)

### (1) චෝදනාව :

"සහීහ් අල් බුහාරී 2546/ සහීහ් මුස්ලිම් 2605

මොහොමද් දේශණා කලා : බොරුව හා මුලාව අවස්ථා තුනකදී හැරෙන්නට භාවිතා කිරීම සුදුසු නොවේ. (ඉස්ලාමයේ හලාල් කොට ඇති එම අවස්ථා තුන නම්),

01) ප්‍රශ්නයක් විසදා ගැනීම සඳහා පුරුෂයා විසින් තම භාර්යාවට බොරුකීම.

02) සටනක් කිරීමේදී විරුද්ධ පාර්ශවය මුලා කිරීම සඳහා බොරුකීම.

03) මිනිසුන් අතර යම්කිසි ප්‍රශ්නයකදී ඔවුන් සන්සුන් කිරීමේ උපායක් ලෙස බොරුකීම."

### විග්‍රහය :

## ඉස්ලාමයේ අසත්‍යය ප්‍රකාශ කිරීමට දී ඇති අවස්ථා

පහත නබි වදනෙහි සඳහන් අවස්ථාවන් තුනෙහි සහ අල් කුර්ආනයේ සඳහන් අවස්ථා දෙකක හැර ඉස්ලාමය බොරුව හා අසත්‍යවාදීත්වය සහමුලින්ම තහනම් කොට ඇත. අනුමැතිය දී ඇති මෙම අවස්ථා මිනිස් ජීවිතයේ යථාර්ථය සමග කෙතරම් බැඳි ඇතිදැ'යි පහත විග්‍රහයන්ගෙන් ඔබට පැහැදිලි වනු ඇත.

පළමුව, ඉස්ලාමයේ අසත්‍යය ප්‍රකාශ කිරීමට අනුමත කොට ඇති අවස්ථා පිළිබඳ විමසා බලමු. මේ පිළිබඳ මුහම්මද් තුමාණන්ගේ වැදගත් ප්‍රකාශනයක් මෙම කරුණු තුනම අන්තර්ගතව අත් තිර්මිදි මූලාශ්‍රයේ අංක 1939 හි සඳහන්ව ඇත.

මුහම්මද් තුමාණන් පැවසූ බව අස්මා තුමිය වාර්තා කරන්නීය : "**අවස්ථාවන් තුනකදී හැර අසත්‍ය පැවසීමට අනුමැතිය නැත. එනම්, පුද්ගලයෙකු තම බිරිඳ (අමනාපයෙන් සිටින අවස්ථාවකදී) ඇය සතුටට පත් කිරීම සඳහා අසත්‍ය පැවසීම, යුද බිමේදී අසත්‍ය පැවසීම, මිනිසුන් අතර (ගැටුම්) සමථයකට පත් කිරීම සඳහා අසත්‍ය පැවසීම.**" (අත් තිර්මිදි : 1939)

ඉස්ලාමය, මිනිස් ජීවිතයේ හරය නිසි අයුරින් සකසා ගෙන සාමය පදනම් වූ සාර්ථක දිවි පෙවෙතකට යථාර්ථවාදීව මග පෙන්වන දහමකි. එනිසාම ඉස්ලාමය ආධ්‍යාත්මික ජීවිතයට මගපෙන්වන දහමක් මෙන්ම පරිපූර්ණ ජීවන සැලැස්මක් යනුවෙන් ද හැඳින්වීම වඩාත් නිවැරදිය.

## පවුලේ සාමය ආරක්ෂා කිරීම උදෙසා යමක් ගොතා ප්‍රකාශ කිරීම

පවුල, මිනිස් සමාජයේ ක්ෂුද්‍ර ඒකකයයි. පවුල බිඳ වැටුණ විට අනාගත සමාජයේ වගකිව යුත්තන් වන දරු පරපුර විනාශය කරා යොමු වීමේ ඉඩකඩ වැඩියි. එමෙන්ම පවුල බිඳ වැටුණ විට සමාජය බිඳ වැටෙයි. සමාජය බිඳ වැටුණ විට රටම බිඳ වැටෙයි. හොද්දට ලුනු වැඩිවීම වැනි ඉතා අල්ප හේතූන් මත ආරම්භ වූ අම්හිරි කතාබහ කොතෙක් නම් දික්කසාදය දක්වා දුරදිගට ගොස් ඇතිදැ'යි කරුණාකර සොයා බලන්න. සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක අනුෂ්ක ගෝකුල මහතා පවසන අන්දමට දිනකට සිදුවන දික්කසාද ප්‍රමාණය 400 දක්වා වැඩි වී ඇති බවය. විවාහ වී වර්ෂයක් ඇතුළත සිදුවන දික්කසාද ප්‍රමාණය ඉතා භයානක අන්දමින් වැඩි වෙමින් පවතින බව ද එම මහතා තව දුරටත් දන්වා සිටී.

(මූලාශ්‍රයඃ http://newsfirst.lk/english/2014/03/better-half-becomes-bitter-half-hearts-fall-apart-quickly-sri-lanka-warning-alarm/23209)

මෙවන් භයානක සමාජ ව්‍යසනයක් වළක්වා ගැනීම සඳහා අසත්‍යවාදීත්වය සම්පූර්ණයෙන් තහනම් කොට ඇති ඉස්ලාමය ස්වාමි පුරුෂයා හා බිරිඳ අතරේ යහපත් දෙයක් ගොතා කියා තම පවුල් ජීවිතය ආරක්ෂා කර ගන්නට අනුමැතිය ලබා දී ඇත. මෙය වංචනිකත්වය හා ප්‍රෝඩාවක් පදනම් වූ ක්‍රියාවක් නොවන බව උගත් සැමට පහසුවෙන් වැටහෙනු ඇත.

## උපාය මාර්ගික යුද ප්‍රයෝග

යුද්ධය යනු මුළා කිරීමක් (සුනන් අබූ දාවූද් : 2637) යැයි මුහම්මද් තුමාණන් පවසා තිබීම ද ඇතැමුන්ගේ විවේචනයට ලක් වී තිබූ තවත් කරුණකි. අපි බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදීන් සමග දශක තුනක අවි ගැටුමක නිරත වී සිටියෙමු. අපගේ වීරෝධාර රණවිරුවන් මෙම ත්‍රස්තවාදීන් පරාජය කිරීම සඳහා යෙදූ උපාය මාර්ගයන් අතරේ සතුරා මුළා කිරීම ඉතා වැදගත් තැනක් ගත් ක්‍රියාවකි. මේ පිළිබඳ වාර්තා බොහොමයක් අපි පුවත්පත් මගින් කියවා ඇත්තෙමු. යුද උපායක් ලෙසින් පමණක් මෙම තත්ත්වය උපයෝගී කර ගත හැකි අතර ඉන් බැහැරව ඉස්ලාමිකයෙකුට කිසිම අයුරකින් අන් අයව මුළා කොට කටයුතු කිරීමට අනුමැතියක් නොමැත. යුද උපායයන් හා යුද පියවරයන් පිළිබඳව සතුරාව දැනුවත් කොට කටයුතු කරන සේනාධිනායකයෙකු වී නම්, ඔහු අත් කර ගන්නා අවාසනාවන්ත ඉරණම පිළිබඳව අමුතුවෙන් අටුවා ලියන්නට අවශ්‍ය නොවන බව සිතන්නෙමු. ඇමෙරිකානු යුද හමුදාවේ නිල වෙබ් අඩවි සඟරාවේ යුද්ධයක දී සතුරා මුළා කිරීම සම්මත ප්‍රධාන යුද උපායක් ලෙස දක්වා ඇත. ඒ පිළිබඳ විස්තර කරුණාකර පහත සඳහන් වෙබ් සම්බන්ධකයෙන් කියවා සත්‍යය අවබෝධ කර ගැනීමට කටයුතු කරන්න. (මූලාශ්‍රය : http://soldiers.dodlive.mil/2014/09/strategic-trickery-the-u-s-armys-use-of-tactical-deception/)

ඇමෙරිකාවේ උතුරු කරොලිනා රාජ්‍ය විශ්ව විද්‍යාලයේ හමුදා ඉතිහාසය පිළිබඳ මහාචාර්ය ජෝසෆ් කැඩෙල් මෙසේ පවසා සිටී. "යුද ක්‍රියාවලියේ මුළාව හමුදා ගැටුම් තරමට ඉපැරණි සිද්ධාන්තයකි. සතුරාව ව්‍යාකූලත්වයට පත් කිරීමේ යථාර්ථය අත්‍යවශ්‍ය කරුණකි. මෙමගින් සීඝ්‍ර යහ ප්‍රතිඵල ලබාගැනීම අපේක්ෂිතය." (Source:Caddell,Joseph,"Deception 101: Primer on Deception.")

ට්‍රෝයි නගරය ජය ගැනීම සඳහා ග්‍රීක හමුදාව යුද උපායක් වශයෙන් යෙදූ ට්‍රෝජන් අශ්වයා පිළිබඳව ඔබ බොහෝ විට දැනුවත් වී නැතැ'යි සිතන්නෙමු. නොදැනුවත් කම පදනම් කර ගෙන අන් දහම් විවේචනය කිරීම කෙතරම් සදාචාර සම්පන්නද යන්න කරුණාකර සිතා බලන්න.

## සමාජ සාමය හා එකමුතුව රැකගැනීම සඳහා

අසත්‍යය ප්‍රකාශ කිරීම සඳහා අවසරය දී ඇති තුන්වන අවස්ථාව ලෙස දක්වා ඇත්තේ ගැටුමකට මැදි වී ඇති දෙපාර්ශවය අතරේ සමාදානය ඇති කිරීම සඳහාය. අප නැවත වරක් අවධාරණය කළ

යුත්තේ ගැටුමක් ඇති වී මහා ව්‍යසනයක් වළක්වා ගැනීම සඳහා යමක් ගොතා කීම සමාජ යහපත සඳහා වූ ක්‍රියාවක් ලෙස සාධාරණ චින්තනයක් ඇති ඕනෑම අයෙකු අනුමත කරන ක්‍රියාවක් නොවන්නේ ද කියා කරුණාකර මොහොතකට සිතා බලන්න යනුවෙනි. අප මිනිස් ජීවිතය දෙස බැලිය යුත්තේ අහසේ පාවෙන අදහස් පදනම් කරගෙන නොව මහ පොළොවේ පය ගසා කරන්නා වූ යථාර්ථවාදී චින්තනයක් පදනම් කර ගෙනය.

## (2) චෝදනාව ඃ

"මෙලෙස අන්‍යාගමිකයින් ඉදිරියේ බොරු කියා මුලා කිරීමේ ඉස්ලාමික ක්‍රමවේදය අල් ටක්යා (ඉස්ලාමයේ වාසිය සඳහා අන්‍යාගමිකයින් බොරුවෙන් හා මුලාවෙන් රැවටීම) නමින් හැඳින්වේ."

## විග්‍රහය ඃ අල් තක්යා (ටක්යා) යනු කුමක් ද?

'අල් තක්යා' යන අරාබි පදයේ ශබ්ද කෝෂ අර්ථය පළමුව විමසා බලමු. "Lane's Lexicon" නමැති අරාබි - ඉංග්‍රීසි ශබ්ද කෝෂයට අනුව 'තක්යා' යන අරාබි පදයේ මුල් පදය වන්නේ 'වකා' යන්නයි. 'ආත්මාරක්ෂාව' හා 'ආරක්ෂා කර ගැනීම' වැනි අර්ථ එහි අන්තර්ගතය. සත්‍යය සැඟවීමෙන් 'ආත්මාරක්ෂාව' ඇති කර ගැනීම මෙහි ප්‍රායෝගික අර්ථයයි.

ආරම්භ අවදියෙහි ඉස්ලාම් විරෝධීන් විසින් මුස්ලිම්වරුන්ට නොයෙකුත් අන්දමින් හිරිහැර කොට විශාල වශයෙන් දේපල හානියන් සිදු කරන්නට ඉදිරිපත් වූහ. මෙවන් කුරිරු අවස්ථාවන් වලදී ඔවුන්ගේ ආත්මය හා දේපල ආරක්ෂා කර ගැනීම සඳහා "තමා මුස්ලිම් භක්තිකයෙකු නොවේ" යැයි මුවින් යමක් පවසා හෝ තමාව ආරක්ෂා කර ගැනීමට ඉස්ලාමය අනුමැතියක් පමණක් ලබා දී ඇත.

මෙහි අපරාධකරු කෙතරම් කුරිරු වුව ද මෙහි පරමාර්ථය වන්නේ තමාගේ ආරක්ෂාව පමණක් මිස එම අපරාධකරුවා නොමග යැවීම හා රැවටීම නොවේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ වුවද තම ආත්ම හා ධන ආරක්ෂාව සඳහා විරුද්ධවාදියාට පහර දීමට වුවද අනුමැතියක් ඇත. අප ඉතා ආඩම්බර වන කරුණක් නම් ලොවේ ජීවත් වන සෑම මිනිසෙකුටම තමන් මුහුණ දෙන්නා වූ සෑම අවස්ථාවකදීම හැසිරිය යුතු අන්දම හා විසඳුම් ඉස්ලාමය තුළින් පෙන්වා දී තිබීමයි.

අල් කුර්ආනයේ "අල් තකියා" යන්නෙන් පදයක් සඳහන් වී නොමැත. නමුත් "තුකාතන්" යැයි සඳහන් වී ඇත. මෙහි අරුත වන්නේ තම ධනය හා ප්‍රාණය සතුරාගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා යම් වාචිකව වැයමක් දැරීමයි. මෙය අන් සතු වස්තූන් පැහැර ගැනීම සඳහා භාවිත කිරීමට අනුමැතියක් නොවන්නේය. ඉස්ලාමයට එරෙහි ප්‍රචාරණ කටයුතු වල නියැළෙන්නෝ මෙම සංකල්පය විකෘති කිරීම සඳහා පහත සඳහන් අල් කුර්ආන් වැකි උපුටා දක්වති.

"තවද ආරක්ෂක උපායක් ලෙස ඔවුන්ගෙන් නුඹලා පූර්වාරක්ෂාව ලබා ගැනීමට මිස කවරෙකු මෙලෙස කරන්නේ ද ඔහු අල්ලාහ්ගෙන් වූ (දහමෙහි) කිසිවකින් (හිමිකරුවෙකු) නොවන්නේය." (අල් කුර්ආන් 3:28)

"කවරෙකු විශ්වාස කිරීමෙන් පසු අල්ලාහ්ව ප්‍රතික්ෂේප කළේ ද (ඔවුන් කෙරෙහි අල්ලාහ්ගේ කෝපය ඇත). කවරෙකු තම හදවත විශ්වාසයෙන් සැනසුමට පත් ව තිබිය දී (විශ්වාසයෙන් බැහැර වන මෙන්) බල කරනු ලබන්නේ ද ඔහු හැර ය." (අල් කුර්ආනය 16:106)

මෙම අල් කුර්ආන් වැකිය පහළ කිරීමට හේතු වූ ඓතිහාසික සිදුවීමක් කෙරෙහි අපගේ අවධානය යොමු කිරීමෙන් එහි සැබෑ අර්ථය පහසුවෙන් ඔබට අවබෝධ කර ගැනීමට හැකි වනු ඇතැ'යි විශ්වාස කරන්නෙමු. මුහම්මද් තුමාණන්ගේ සඟයෙකු වූ අම්මාර් තුමාගේ දෙමාපියන් යාසිර් හා සුමෙයා ය. ඔවුන් ඉස්ලාමය වැළඳ ගැනීම හේතුවෙන් මක්කාවේ විසූ ඉස්ලාම් විරෝධීන් විසින් ඔවුන්ව කුරිරු වධ හිංසා වලට ලක් කොට මරණයට පත් කරන ලදී. මෙවන් පීඩාකාරී තත්ත්වයකට පත්ව සිටි අම්මාර් තුමාව දිනක් ඉස්ලාම් විරෝධීන් විසින් මරණ තර්ජන ඉදිරිපත් කරමින් ඉස්ලාමය හා මුහම්මද් තුමාණන්ව ප්‍රතික්ෂේප කළ බව පවසන්නට බල කරනු ලැබීය. මෙලෙස තදබල අයුරින් බලපෑම් වලට ලක් වූ අම්මාර් තුමා කිසිවක් කරකියා ගන්නට නොහැකි තත්ත්වයක් තුළ සිතේ විශ්වාසය ශක්තිමත්ව තබා ගනිමින් ඉස්ලාම් විරෝධීන්ගේ ඉල්ලීමට අනුව එසේ ප්‍රකාශ කළහ. ඉන්පසුව ඉතා දැඩි සිත් තැවුලකට පත් වී මුහම්මද් තුමාණන් හමු වූ විට අම්මාර් තුමාව නිදොස් කරමින් ඉහත අල් කුර්ආන් වාක්‍ය අල්ලාහ් විසින් පහළ කරන ලදී.

ඉහතින් විස්තර කරන ලද පරිදි ජීවිත තර්ජන එල්ල වන ආකාරයේ බරපතළ අයුරින් බලපෑම් සිදු වූ විට ආත්ම ආරක්ෂාව සඳහා තම ආගමික විශ්වාසය පිළිබඳව සිතේ ඇති සත්‍යය තත්ත්වයට පටහැනි අයුරින් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ඇති අතර ඉන් බැහැරව වංචනික හා ප්‍රෝඩාකාරී අයුරින්

අසත්‍යවාදීව ක්‍රියා කිරීමට ඉස්ලාමීය ඉගැන්වීම්හි කිසිදු අනුමැතියක් නොමැත. මේ පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කරන දෙවන වැකිය 3:28 ය. මේ පිළිබඳ විග්‍රහයක් ඇතැමුන් ඉදිරිපත් කළ චෝදනාවකට අදාළව ඉදිරියේදී දක්වා ඇත්තෙමු.

මෙවන් තත්ත්වයන් පිළිබඳව ඉස්ලාමීය නොවන මූලාශ්‍රයන්හි සඳහන් කරුණක් ඔබගේ අවධානය පිණිස ඉදිරිපත් කරන්නට කැමැත්තෙමු.

"අපරාධ පනත් අනුව අපරාධකරුවෙකු කිසිවෙකුගේ බලපෑමක් මත, බල කිරීමක් මත, කළ නොහැකි තත්ත්වයක් නොමැති අවස්ථාවක කරන ලද අපරාධයක් සම්බන්ධව වැරදිකරුවෙකු ලෙස උසාවිය නොපිළිගනී." (අපරාධ විද්‍යාව - මහාචාර්ය දයා අමරසේකර - 10 වැනි පිටුව)

නූතන අපරාධ විද්‍යාව හා අනුකූලතාවක් ඇති ඉගැන්වීම් දැනට වර්ෂ 1400 කට පෙර පහළ කරන ලද අල් කුර්ආනයෙහි අන්තර්ගත වී තිබීම සැබැවින්ම එහි ඉගැන්වීම්හි ඇති සදාතනික හා යාවත්කාලීන බව සනාථ කිරීමක් ලෙස අපි දකින්නෙමු.

අවාසනාවට ඉස්ලාම් විරෝධී වෙබ් අඩවි මගින් හා අනෙකුත් ඉස්ලාම් විරෝධී ක්‍රියාකාරීන් ඉස්ලාමය පිළිබඳව ඉදිරිපත් කරන්නට වෙර දරන වැරදි අර්ථ කථනයන් පිළිබඳව අපගේ දැඩි පිළිකුල් සහගත විරෝධය දන්වා සිටින්නට කැමැත්තෙමු. ඔවුන් ලොවට හඬ නගා පවසන වැරදි මතය නම් ඉස්ලාමිකයෙකුට ඉස්ලාම් නොවන්නන්ව අසත්‍යයෙන්, ප්‍රෝඩාවෙන් හා වංචාවෙන් රැවටීමට ඉස්ලාමීය ඉගැන්වීම් අනුමැතිය ලබා දී ඇති බවය.

ඉහතින් විග්‍රහ කළ අල් කුර්ආන් වැකියෙන් හා මුහම්මද් තුමාණන්ගේ ප්‍රකාශය අනුව සඳහන් අවස්ථාවන් තුනෙහි හා ආත්මාරක්ෂාව සඳහා අසත්‍යය ප්‍රකාශ කිරීමට හැර අන් කිසිදු අවස්ථාවක් ඉස්ලාමීය මූලාශ්‍රයන්හි සඳහන් නොවේ. ඇතැමුන් සඳහන් කරන පරිදි කිසියම් ආකාරයක වංචනිකත්වයක් අසත්‍යවාදීකමක් කපටිකමක් ප්‍රෝඩාකාරීත්වයක් හෝ රැවටිලිකාරකමක් ප්‍රගුණ කිරීමට හෝ දිරි ගැන්වීමට අනුබල දෙන ආකාරයේ කිසිදු අදහසක් කිසිදු ඉස්ලාමීය මූලාශ්‍රයක අන්තර්ගත වී නොමැති බව වගකීමකින් යුක්තව ප්‍රකාශ කරන්නට කැමැත්තෙමු. ඉස්ලාම් විරෝධීන් විසින් "රිලයන්ස් ඔෆ් ද ට්‍රැවලර්" ග්‍රන්ථයෙන් උපුටා දක්වා තිබූ කොටස පසුව විග්‍රහ කරන්නට අපේක්ෂා කරන්නෙමු. තවත් වරෙක අන් අයගේ දේපල හා වස්තූන් වංචනික අයුරින් ලබා ගැනීමට ඉස්ලාමයේ ශුද්ධ වූ බොරුව හා මුලාව යන අශුද්ධ සංකල්පය මගින් ඉඩකඩ ලබා දී ඇති බව සඳහන් වූ අවස්ථා රාශියක් සමාජ ජාලයන් තුළින් අපි දැක ඇත්තෙමු.

කරුණාකර පහත සඳහන් අල් කුර්ආන් වැකිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන්න. එවිට සත්‍යය පැහැදිලි වේ යැයි විශ්වාස කරන්නෙමු.

"නුඹලා අතර අසාධාරණ අන්දමින් නුඹලා එකිනෙකාගේ වස්තුව අනුභව නොකරවු. තවද නුඹලා දැනුවත්වම ජනයාගේ වස්තුවෙන් කොටසක් පාපකාරී අයුරින් අනුභව කිරීම පිණිස බලධාරීන් වෙත ඒවා (වස්තුවෙන් කොටසක් අල්ලස් වශයෙන්) නොයවවු" (අල් කුර්ආන් 2:188)

## (3) චෝදනාව :

"අල් ටකියා න්‍යායට අනුව මුස්ලිම්වරුන් විසින් අන්‍යාගමික සමාජයන් ඉදිරියේ කරන්නා වූ ප්‍රෝඩාව පටන් ගන්නේ "ඉස්ලාම් යන වචනයේ තේරුම සාමයයි" යන පට්ට පල් බොරුව උරච්චි කරමින් ය. නමුත් ඉස්ලාම් යන අරාබි වචනයේ නියම තේරුම නම් "අල්ලාහ් දෙවියන්ට සම්පූර්ණ වශයෙන් යටත් වීම (Total Submission to Allah) මිස සාමය නොවේ.

## විග්‍රහය :

ඉස්ලාම් සහ සලාම් යන අරාබි පදයන්හි මූල අක්ෂර වන්නේ (ස ල ම - سلم) යන්නය. මෙම මූල අක්ෂරයන්ගෙන් අවනත වීම, කීකරුවීම, සාමය යන අර්ථයන් ඇති අරාබි වචන සෑදේ. ඉස්ලාමයේ සම්මත ආශිංසනය වන්නේ "අස්සලාමු අලෛකුම්"ය. "ඔබට සාමය අත්වේවා" යන්න මෙහි අර්ථය වේ. ඉස්ලාම් විරෝධී ජාත්‍යන්තර වෙබ් අඩවි උත්සාහ දරන්නේ 'ඉස්ලාම්' යන පදයේ අර්ථය 'යටත් වීම' පමණක් බව දක්වා ඒ තුළින් හුඹස් බියක් ඇති කිරීම බව දක්නට ඇත. මේ සඳහා ඔවුන් 'අල් කුර්ආන්' වැකි විකෘති කරමින් ජනයා නොමග යවන්නට අසාර්ථක උත්සාහයක යෙදෙමින් සිටින බවද අපි දනිමු. ඔවුන්ගේ පියසටහන් අනුගමනය කරමින් ඇතැමුන් හඬ නගනු අපට නිතර දකින්නට ඇත. ඉස්ලාමයේ එකම අර්ථය 'අවනත වීම' යන්න පමණක් ලෙස ගත්තත් ඇති වැරැද්ද කුමක්දැ'යි විමසන්නට

කැමැත්තෙමු. දෙවියන්ට අවනත වීම යන්නෙන් අදහස් වන්නේ දෙවිඳුන්ගේ ඉගැන්වීම් අනුව ජීවිතය සකසා ගැනීමය. ඇතැම් සංවිධාන විසින් ජනයා නොමග යැවීම පිණිස අල් කුර්ආන් වැකි විකෘති කරමින් කරන්නා වූ සියලු ප්‍රචාරයන් පිළිබඳ නිවැරදි පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීමට අප කටයුතු කරන හෙයින් ඔවුන් කියන්නට උත්සාහ කරන 'ඉස්ලාම්' යන වචනයේ තේරුම 'සාමයයි' යන අර්ථය පට්ට පල් බොරුවක් උරච්චි කිරීමක් ලෙස හුවා දක්වන්නට කටයුතු කිරීමක්" යන්න ඔවුන්ගේ අවබෝධයේ හා දැක්මේ දෝෂයක් මිස සත්‍යය නොවන බව පැහැදිලි වනු ඇත. අරාබි භාෂා විද්වතුන් අතරේ අවිවාදයෙන්ම උසස්ම අරාබි - ඉංග්‍රීසි ශබ්ද කෝෂය ලෙස පිළිගත් "Edward William Lane-Arabic Lexicon, the world's leading lexicon on classical Arabic http://www.tyndalearchive.com/tabs/lane/" ග්‍රන්ථයෙන් මේ පිළිබඳ ඔබට නිවැරදි තොරතුරු ලබා ගත හැකි වනු ඇත. ඒ පිළිබඳ අරාබි භාෂා විද්වතෙකුගේ මතයක් පහතින් දක්වා ඇත්තෙමු.

එකොලොස්වන සියවසේ ජීවත් වූ ජාත්‍යන්තර කීර්තියට හා පිළිගැනීමට පාත්‍ර වූ අරාබි භාෂාව හා අල් කුර්ආනය පිළිබඳව හසල දැනුමක් ඇති ඉස්ලාමීය විද්වතෙකු වන ඉමාම් අල් රාගිබ් අල් අස්ෆහානී තුමාණන් පහත සඳහන් අයුරින් අදහස් දක්වා ඇත.

"අල් ඉස්ලාම් යන පදයෙහි අරුත සාමය තුළට අවතීර්ණ වීම වේ. එනම් එකිනෙකා අනෙකාට යම් උවදුරක් ඇති වීමට හේතුවක් වීමෙන් නිදොස් වීමයි." (ග්‍රන්ථය : මජල්ලතුල් බුහූසි අල් ඉස්ලාමියා, වෙළුම:16, පිටුව:318)

**(4) චෝදනාව :** ඉස්ලාම් ෂරිආ නීතියෙන් : රිලයන්ස් ඔෆ් ද ට්‍රැවලර් (පිටුව 746-8.2)

"කතා කිරීම හෝ වචන පරිහරණය යනු අරමුණු ඉෂ්ඨ කරගැනීමේ මගකි. යම්කිසි අරමුණක් ඇත්ත කීමෙන් සහ බොරු කීමෙන් යන ක්‍රම දෙකෙන්ම ඉෂ්ඨ කරගත හැකිනම්, එය බොරු කීමෙන් ඉෂ්ඨ කර ගැනීම නීතියට පටහැනිය. එසේ වන්නේ බොරුව හෝ මුලාව එම අවස්ථාවට අවශ්‍යය නොවන බැවිනි. නමුත්, එම අරමුණ ඇත්ත කියා ඉෂ්ඨ කර ගත නොහැකි නම් සහ එය ඉෂ්ඨ කර ගත හැක්කේ බොරුවෙන්ම / මුලාවෙන්ම පමණක් නම් එවැනි අවස්ථාවකදී ඔබේ අරමුණ බොරුවෙන් සහ මුලාවෙන් ඉෂ්ඨ කරගැනීමට අවසර ඇත. ඉෂ්ඨ කර ගත යුතු අරමුණ (ඉලක්කය) අනිවාර්ය නම් ඒ සඳහා (එම ඉලක්කය ඉෂ්ඨ කර ගැනීම සඳහා) බොරු කීමද අනිවාර්ය වන්නේය. ඔහු විසින් තමාට ඉෂ්ඨ කර ගැනීමට ඇති අරමුණ සඳහා ඇත්ත කීමෙන් ලැබෙන ප්‍රතිඵලය සහ බොරුකීමෙන් ලැබෙන ප්‍රතිඵලය සසඳා බැලිය යුතු වේ. ඇත්ත කීමෙන් ඇතිවන ප්‍රතිඵලයට වඩා බොරුකීමෙන් ලැබෙන ප්‍රතිඵලය තම අරමුණු ඉෂ්ඨ කර ගැනීම සසඳා වඩා වාසිසහගත නම් ඔහු අනිවාර්යයෙන්ම එම අරමුණ බොරු කියා ජය ගත යුතුය."

**විග්‍රහය :** මෙම ඡේදය පරිවර්තනය කොට ඉදිරිපත් කොට ඇති ආකාරය ඉංග්‍රීසි මූලාශ්‍රය සමග නිසි සැසඳීමක් නොමැත. කෙසේ වෙතත් ඉහත ඡේදයට ද පාදක වන්නේ අසත්‍යය ප්‍රකාශ කිරීමට දී ඇති අවස්ථා තුනය. එම කරුණු පිළිබඳව ඉමාම් අබූ හාමිද් ගසාලී තුමා විසින් ඉදිරිපත් කොට තිබූ විග්‍රහය විකෘති කොට කරුණු දැක්වීමක් මෙහි දක්නට ඇත. ගසාලි තුමා ඉදිරිපත් කොට තිබූ උදාහරණ සඳහන් නොකොට කරුණු ඉදිරිපත් කිරීමෙන් සත්‍යය වසං වීමක් සිදු කොට ඇත. ගසාලි තුමාගේ විග්‍රහය අනුව " **ජනයා පීඩාවට පත් කරවන අපරාධකරුවෙකු පැමිණ තමා විසින් සඟවා තබා සිටින පුද්ගලයෙකු ගැන විමසූ විට ඔහුව හෙළිදරව් නොකොට අසත්‍යය ප්‍රකාශ කොට ඔහුගේ ජීවිතය බේරා ගැනීම අනිවාර්ය කාර්යයක් යන්නය. තමා වෙත ආරක්ෂාව පිණිස තබා ඇති වටිනා දෙයක් සාහසික අපරාධකරුවෙකු පැමිණ එම දෑ ගැන විමසූ විට එය ආරක්ෂා කරගැනීම සඳහා 'එවැන්නක් තමා අභියස නොමැති බව' අසත්‍යය ප්‍රකාශ කිරීම අනිවාර්ය වෙයි."** සමාජයේ සිදුවන මෙවන් හිංසාකාරී හා තම ආරක්ෂාවට තර්ජනයක් වූ තත්ත්වයන්ගෙන් මිදී යහපැවැත්ම හා ආරක්ෂාව අරමුණු කොටගත් විග්‍රහයක් තිබියදී එය ඉස්ලාමයේ "ශුද්ධ වූ බොරුව හා මුලාව" ලෙසින් හුවා දැක්වීමට කටයුතු කිරීම අශුද්ධ සංකල්පයක් ලෙස දකින්නෙමු.

ඉහතින් විස්තර කරන ලද පරිදි ජීවිත තර්ජන හෝ අනෙකුත් අපරාධකාරී තත්ත්වයක් එල්ල වන ආකාරයේ බරපතළ අයුරින් බලපෑම් සිදුවූ විට සත්‍යය තත්ත්වයට පටහැනි අයුරින් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ඇති අතර ඉන් බැහැරව වංචනික හා ප්‍රෝඩාකාරී අයුරින් ක්‍රියා කිරීමට ඉස්ලාමීය ඉගැන්වීම්හි කිසිදු අනුමැතියක් නොමැත.

එමෙන්ම භයානක තත්ත්වයකදී හැසිරිය යුතු අන්දම ඉස්ලාමීය නොවන මූලාශ්‍රයන්හි සඳහන් කරුණු පාඨක ඔබගේ අවධානය පිණිස ඉදිරිපත් කළෙමු.

"පවුලක ස්වාමියා පමණ ඉක්මවා කේන්තියට පත් වන්නෙක් නම් අසල්වැසියන් සමග රංඩු සරුවල්වල පැටලෙනවා නම් ස්වාමියා සතුව පවතින දරුණු ආයුධයක් හොරකම් කරමින් සඟවාලන බිරිඳ සිදුකරන්නේ ස්වාමියාටත් සමාජයටත් යහපතක්."

"සද්භාවයෙන් සත්ව ඝාතනය සිදු වෙන්නත් ඉඩ තියෙනවා. පිස්සු බල්ලෙක් පාසලකට ඇතුළු වී ළමයින් සපා කමින් යන විට බුද්ධිමත් ගුරුවරයෙක් ළමයින්ගේ ආරක්ෂාව තකා පිස්සු බල්ලා මරා දමනවා නම් එය යහපත් චේතනාවකින් සිදුකරන සත්ව ඝාතනයක් වෙනවා".

Source : ( http://www.lakehouse.lk/budusarana/2011/12/10/tmp.asp?ID=vision11) (කැලණිය විශ්ව විද්‍යාලයේ සංස්කෘතික අධ්‍යයන අංශාධිපති, මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි)

**(5) චෝදනාව** : කුරානය 3:28

"මුස්ලිම්වරුන් විසින් කිසිලෙසකින්වත් මුස්ලිම්වරුනට උඩින් අන්‍යාගමිකයින් මිතුරන් ලෙස නොගත යුතුය. මෙම නියෝගයට එරෙහිව යන මුස්ලිම්වරයෙකු වේ ද, (ඔහුගේ මුස්ලිම්භාවය අහෝසි වන අතර) අල්ලාහ් ඔහු සමග ඇති සියලු සම්බන්ධකම් සදහටම නවතා දමනු ඇත. නමුත් (ඔබ වෙසෙන්නේ අන්‍යාගමික සමාජයක නම් හෝ අන්‍යාගමිකයින්ගේ බලය මුස්ලිම්වරුන්ගේ බලයට වඩා වැඩි නම්), ඔබේ ආරක්ෂාව (එනම්, අන්‍යාගමික භූමිය තුළ මුස්ලිම්වරුන්ගේ සහ ඉස්ලාමයේ පැවැත්ම සහ ප්‍රසාරණය) පිණිස භාවිත කළ හැකි උපක්‍රමයක් ලෙස පමණක් ඔවුන් සමග මතුපිටින් පමණක් පෙන්වන්නා වූ මිත්‍රත්වයක් පවත්වා ගෙන යෑමට අල්ලාහ් විසින් (මුස්ලිම්වරුන්ට) නියෝග කොට ඇත".

ඇතැම් විවේචකයින් ඉහත කොටස සමග ඉබ්න් කතීර් තුමාගේ යැයි පවසන විග්‍රහයක් හා හදීස් වදන් යැයි සඳහන් වැකි කිහිපයක් සඳහන් කොට අවසානයට පහත සඳහන් කොටස ඉදිරිපත් කොට තිබීම සමාජ මාධ්‍යය මගින් අපි සවන් දුන්නෙමු.

"අප සමාජය පැටලී ඇති පඹගාලේ ස්වභාවය කුමක්දැ'යි දැන්වත් ඔබට වැටහිය යුතුය. අප රට ජාතිය ඉදිරියේ ඇත්තේ මෙතෙක් ඔබ සිහිනෙන්වත් නොසිතූ ආකාරයේ ප්‍රෝඩාකාරී එමෙන්ම මහත් වූ විනාශකාරී සිතා ගැනීමට පවා අපහසු ව්‍යාකුල තත්ත්වයකි. එහෙත් අප මෙම අභියෝගයට මුහුණ දිය යුතුය, අප ඉස්ලාමීය ම්ලේච්ඡත්වය පරදා ජය ගත යුතුය. අපගේ දේශයත්, ආගමත් බේරා ගත යුතුය."

**විග්‍රහය :** ඉහත කොටස විචාරයෙන් තොරව කියවන අයෙකුගේ සිත්හි ඉස්ලාම් දහම හා මුස්ලිම්වරුන් පිළිබඳ ඉතා භයානක චිත්ත රූපයක් ඇති වීම සර්ව සාධාරණය. එහෙයින් මේ පිළිබඳ සත්‍යය පදනම් කර ගත් විචාරශීලී විග්‍රහයක් ඉදිරිපත් කරන්නට අදහස් කරන්නෙමු. පළමුව ඉහතින් උපුටා දැක් වූ අල් කුර්ආන් වැකියේ නිවැරදි සිංහල අර්ථ දැක්වීම වෙත යොමු වෙමු.

"විශ්වාසිකයින්, විශ්වාසිකයින් හැර ප්‍රතික්ෂේපකයින්ව ආරක්ෂකයින්/ භාරකාරයින්/ සමීප මිතුරන් ලෙස නොගත යුතුය. තවද ආරක්ෂක උපායක් ලෙස ඔවුන්ගෙන් නුඹලා පූර්වාරක්ෂාව ලබා ගැනීමට මිස කවරෙකු මෙලෙස කරන්නේ ද ඔහු අල්ලාහ්ගෙන් වූ (දහමෙහි) කිසිවක (හිමිකරුවෙකු) නොවන්නේය. අල්ලාහ් තමන් පිළිබඳව නුඹලාට අවවාද කරන්නේය. අවසානයෙහි යොමුවන ස්ථානය අල්ලාහ් වෙතය." (අල් කුර්ආන් 3:28)

මෙම පරිවර්තන දෙක බුද්ධිමත්ව කියවන අයෙකුට අල් කුර්ආන් වැකි විකෘති කොට ඇති ආකාරය පැහැදිලිව දැක ගත හැකිය. මෙම අල් කුර්ආන් වැකිය නිවැරදිව අවබෝධ කරගැනීම සඳහා ඉස්ලාමය තුළ ඇසුරු කිරීම් පිළිබඳ සංකල්පය වෙත අවධානය යොමුකළ යුතු වෙයි. එය පහතින් විග්‍රහ කොට ඇත්තෙමු.

මෙම අල් කුර්ආන් වැකියේ පසුබිම වන්නේ අන් ආගමිකයින් විසින් කුරිරු ලෙස මුස්ලිම්වරුන්ව මැරීමට හා දේපල හානි සිදු කිරීමට එන්නා වූ අවස්ථාවේ දී හැර අන් අවස්ථාවන්හි නොවේ. යුද තත්ත්වයකදී සතුරු කඳවුරේ අයෙකුව තම සමීප මිතුරෙකු, ආරක්ෂකයෙකු හෝ භාරකරුවෙකු ලෙස පත් කර ගන්නා සිදු කර ගැනීමට පෙළඹෙනුයේ සියදිවි හානි කර ගැනීමකි. කෙනෙකු මුස්ලිම් නොවන්නන්ව සමීප මිතුරන් ලෙස නොගන්නා ලෙස අල්ලාහ් පවසා තිබීමෙන් සෑම වර්ගයේම ඇසුරුකම අදහස් නොකෙරේ. ඉහත අපගේ විග්‍රහයේ උපුටා දක්වා කුර්ආන් වැකි මේ පිළිබඳ නිවැරදි මග පෙන්වීම් ලබාදෙයි. මන්දයත් ඉස්ලාමීය කෝණයෙන් ඇසුරු කිරීම වර්ග හතරකට බෙදා වෙන් කොට දැක්විය හැක.

1. ආචාර සම්පන්න ඇසුර (මුදාරාත්) = මෙය පොදුවේ යහ ලෙසින් මෘදු ලෙසින් සාමකාමීව සත්‍යවාදීව හැසිරීම වේ. (නබි මුහම්මද් තුමාණන් පැවසූහ. "මැවුම් සියල්ල අල්ලාහ්ගේ පවුලයි. අල්ලාහ්ගේ ගැත්තන් අතුරින් අල්ලාහ්ට ඉතා ප්‍රියමනාප අය වන්නේ එම පවුලට(මැවුම් වලට) ප්‍රයෝජනවත් අයුරින් හැසිරෙන්නන්ය." (මූලාශ්‍රය : ෂුඅබුල් ඊමාන්)

2. සමානාත්මක ඇසුර (මුවාසාත්) = මෙය මිතුරුකමින් හා අන් අයට ප්‍රයෝජනයක් වන අයුරින් හැසිරීම සහ ඇතැම් අවස්ථාවන්හි මුදල්මය උපකාර කිරීමද වේ. (නබි මුහම්මද් තුමාණන්ගේ අසල්වැසියා වූයේ යුදෙව්වෙකුය. "කවරෙකුගේ අසල්වැසියා තම හිංසා අපරාධවලින් ආරක්ෂාව නොලබන්නේද ඔහු සත්‍ය විශ්වාසිකයෙකු නොවේ." යැයි මුහම්මද් තුමාණන් අල්ලාහ් මත දිවුරා පවසා ඇත.) (මූලාශ්‍රය : සහීහුල් බුහාරි)

3. ව්‍යාපාරික ඇසුර (මුආමලාත්) = මෙය ගනුදෙනු හා ව්‍යාපාර වැනි මුදල්මය වැඩ කටයුතු වල යෙදීම වේ. මුහම්මද් තුමාණන් මුස්ලිම් නොවන කිතුනු, යුදෙව් හා පාරම්පරික දහම් ඇදහූ පිරිස සමග විවිධ ආකාරයේ මූල්‍යමය සම්බන්ධතාවන් පවත්වාගෙන සිටි බවට විවිධ ඓතිහාසික සාක්ෂි ඉදිරිපත් කළ හැක. මෙය සනාථ කරන වැදගත් සාක්ෂිය වන්නේ මුහම්මද් තුමාණන් මරණයට පත්වන විට එතුමාගේ ලෝහමය යුද ආරක්ෂක ඇඳුම තම පවුලේ සාමාජිකයින්ගේ ආහාර අවශ්‍යතාවන් සඳහා යුදෙව් ජාතිකයෙකුගේ වගකීමේ ඇපයට තබා ණය මුදලක් ලබා තිබීමයි. (මූලාශ්‍රය : සහීහ් අල් බුහාරි)

4. ස්වීකරණීය ඇසුර (මුවාලාත්) = මුස්ලිම්වරුන්ට විරුද්ධකම් කරන පිරිස සමග හෝ තමන්ගේ මුළු සංස්කෘතියම වෙනස් වන හා හානියක් වන ප්‍රමාණයට ඇසුරුකම් තැබීම.

ඉහතින් 3:28 වැකියෙන් ඇසුරුකම් තහනම් කොට ඇත්තේ හතර වන ප්‍රභේදයට අයත් පිරිස සමගය. ඒ සඳහා වූ නිවැරදි විග්‍රහය පහතින් ඇති අල් කුර්ආන් වැකියෙන් තවදුරටත් පැහැදිලි වේ. මෙම පිරිස සමග කටයුතු කිරීමේ දී තම ජීවිතය හා දේපල ආරක්ෂා කර ගැනීම පිණිස ආරක්ෂක උපායක් හැටියට සත්‍යය සඟවා කටයුතු කිරීමට ඉස්ලාමය අනුමැතිය ලබා දී ඇත. 3:28 වැකිය යටතේ ඔබ විසින් ඉබ්නු කසීර් විද්වතාගෙන් උපුටා දැක්වූ විග්‍රහයෙන් සඳහන් වන්නේ ද මෙම පිරිස සම්බන්ධව ඇසුරුකම් පවත්වා ගතයුතු ආකාරයයි.

"සැබැවින්ම අල්ලාහ් නුඹලාව වළක්වනුයේම දහම හේතුවෙන් නුඹලා හා සටන් කළවුන් සමග ද නුඹලාව නුඹලාගේ නිවෙස් වලින් පලවා හැරියවුන් සමග ද නුඹලාව පලවා හැරීමට උපකාර කළවුන් සමග ද මිතුදම් පෑමයි. කවුරුන් ඔවුන් සමග මිතුදම් පාන්නේ ද ඔවුන්මය අපරාධ කළවුන් වන්නේ". (අල් කුර්ආන් 60:9)

මේ පිළිබඳ තවත් දීර්ඝ විග්‍රහයන් ඇතත් ඉහත අල් කුර්ආන් වැකි හා විග්‍රහයන් ප්‍රමාණවත් වේ යැයි සිතන්නෙමු.

## (6) චෝදනාව :

අල් බුහාරි වාර්ථා කොට තිබෙනවා. අබූ දර්දා මෙසේ ප්‍රකාශ කළ බව, " අපි සමහර මිනිසුන් (එනම් මුස්ලිම් නොවන මිනිසුන්) ඉදිරිපිටදී ඔවුන් සමග සිනහා වන්නෙමු. එහෙත් අපගේ හදවත් ඔවුනට විරුද්ධව වෛරයෙන් පිරී පවතී. එසේම අල් බුහාරි වාර්ථා කොට තිබෙනවා. අල් හසන් මෙසේ ප්‍රකාශ කළ බව, මලවුන්ගෙන් නැගිටුවන දිනය වන තුරු ටකියා (ඉස්ලාමයේ වාසිය සඳහා අන්‍යාගමික සමාජයට එරෙහිව බොරුව සහ මුලාව) වලංගු වන්නේය."

**විග්‍රහය** : මෙම ප්‍රකාශයෙහි නිවැරදි පරිවර්තනය කෙරෙහි අවධානය යොමු කරමු.

අබූ දර්දා ප්‍රකාශ කොට ඇත. "අපි ඇතැම් මිනිසුන් ඉදිරිපිටදී සිනහා වන්නෙමු. නමුත් අපගේ හදවත් කෝපයෙන් පවතී."

ඉහත ඔබ ලිපියෙහි විකෘති කොට සඳහන් කර ඇති චෝදනාව හා නිවැරදි පරිවර්තනය අතර අවධානය යොමු කළ විට මෙය කියවන ඕනෑම අයෙකුට එහි නිර්වද්‍යතාව පහසුවෙන් වැටහෙනු ඇත. නමුත් ඔවුන් විසින් ඉදිරිපත් කොට ඇති ඊළඟ කොටස ඉස්ලාම් විරෝධී වෙබ් අඩවියකින් අහුලා ගත් දෙයක් හෙයින් එහි මූලාශ්‍රය සඳහන් නොකොට ඔවුන් නොමග යැවීමකට ලක් වී ඇතැ'යි දන්වන්නට කැමැත්තෙමු.

ලොවේ නොයෙකුත් පුද්ගලයින් විසින් නොයෙකුත් අන්දමින් නොයෙක් වාර්තාවන් විවිධ ග්‍රන්ථයන්හි පල වීම සාමාන්‍ය විෂයකි. නමුත් ඉස්ලාමයේ ඕනෑම විෂයක් එය පැවසූ පුද්ගලයාගේ පටන් ග්‍රන්ථයකට ගොණුවන තෙක් සත්‍යවන්තයින් හරහා නොබිඳි පැමිණි වාර්තාවේ සත්‍යභාවය තුළ එම විෂයේ සත්‍යය භාවය සැලකිල්ලට ගනු ලැබේ. එසේ අවධානය යොමු කළ කල්හි මෙම වාර්තාවේ එවැනි සත්‍යවන්තයින් හරහා නොබිඳි පැමිණි වාර්තාවක් නොවන බව ඉස්ලාමය පිළිබඳ දැනුමැති සියල්ලන් දන්නා බව අප වටහා ගත යුතුව ඇත. එහෙයින් මෙම වාර්තාව ඔහුගේ ප්‍රකාශයක් යන්න නිසි කිසිදු සාක්ෂියක් නොමැත. එහෙයින් ඉස්ලාමීය ෂරීආවට අනුව මෙම වාර්තාව මගින් ක්‍රියාවට නැංවීමට කිසිදු සාක්ෂියක් නොමැති බව හොඳින් බවහා ගත යුතු යැයි අපේක්ෂා කරන්නෙමු. කෙසේ නමුත් මෙම හදීසය ක්‍රියාවට නැංවුවද එම විෂය අදාළ වන්නේ ඉහත සඳහන් කළ අයුරින් අපරාධිතයෙකුගේ ව්‍යසනයට ලක් වූ විට ඔහුගෙන් තම දේපල හා ආත්ම ආරක්ෂාව සඳහා වන බව පාඨක ඔබට වැටහෙනු ඇත.

**(7) චෝදනාව** : "ඉස්ලාමය කිසිසේත්ම සාමුහික සහජීවනය අවධාරණය කරන ආගමක් නොවේ."

"ඉස්ලාමය වූ කලී අන්‍යාගම් කිසිසේත්ම නොඉවසන අන්‍යාගමිකයින් සහ අන්‍යාගම් සියල්ල විනාශ කිරීම සඳහා ක්‍රියාත්මක වන ම්ලේච්ඡ න්‍යාය ධර්මයක් මිස ආගම් අතර සාමුහිකත්වයට සහ සහජීවනයට ගෞරව කරන්නා වූ ආගමක් නොවේ. එසේම එය අන්‍යාගමික සමාජයන් තුළ පවතින පරිත්‍යාගශීලීත්වය, සාමුහිකත්වය සහ සහජීවනය යන සංකල්ප තම ප්‍රසාරණය සඳහා පමණක් කඳ පණුවන් සේ අතිශය කපටි ලෙසින් භාවිත කරන්නා වූ ආගමකි."

"මෙරට ආගමික හා වාර්ගික සාමුහිකත්වය වනසමින් මුස්ලිම්වරුන් විසින් ගෙනයන්නා වූ අමානුෂික හා ම්ලේච්ඡ ප්‍රතිපත්තිය වන අල් කුර්ආනයේ සහජීවනය පිළිබඳව හා අනෙකුත් ආගම් අගය කරන මෙන් පවසා තිබෙන්නේ කොහේ ද?"

**විග්‍රහය** : පහත අල් කුර්ආන් වැකිහි හා මුහම්මද් තුමාණන්ගේ ප්‍රකාශනයන්හි පරිවර්තනයන් හා ඓතිහාසික සිදුවීම් කියවා ඔබට සත්‍යය අවබෝධ කරගැනීමට හැකිවනු ඇතැ'යි විශ්වාස කරන්නෙමු.

**ඉස්ලාමයේ විරුද්ධ මතයට ගරු කිරීම පිළිබඳ ඉගැන්වීම්**

ඉස්ලාමය තුළින් විරුද්ධ මතයට හා අන් දහමට ගරුකරමින් අවබෝධයෙන් කටයුතු කළ යුතු යැයි දිරි ගන්වන බව ඉස්ලාමය පිළිබඳ අවබෝධයක් ඇත්තෙකුට මනාව පෙනෙන කරුණකි.

"(ඉස්ලාම්) දහමෙහි බල කිරීමක් නැත." (අල් කුර්ආන් 2:256)

මේ අනුව බැලූ කල දහම් කෙරෙහි සියලු ආකාරයේ බලපෑම් කිරීම් තහනම් කරමින් පහළ කරන ලද අල් කුර්ආන් වැකියට පටහැණි අයුරින් ක්‍රියා කිරීමට කිසිදු ඉස්ලාමිකයෙකුට අයිතියක් හෝ බලයක් නොමැත. එමෙන්ම යමෙකු ලෞකික ආශාවන් පදනම් කර ගනිමින් බාහිරයෙන් ඉස්ලාමය වැළඳ ගත්ත ද ඉස්ලාමය විශ්වාස පදනම් වූ දහමක් හා ජීවන රටාවක් වන හෙයින් ඔහුගේ ඉස්ලාමය පිළිගනු ලැබූවක් නොවන බවද අප තරයේ වටහා ගත යුත්තකි.

එපමණක් නොව, ආගමික බහුත්වය ලෝක යථාර්ථයක් බව ඉස්ලාමීය ඉගැන්වීම් පිළිගනියි. මෙමගින් මිනිසාගේ චින්තන නිදහස සහතික කොට ඇත.

"තවද (නබිවරය,) නුඹ පවසවු. "සත්‍යය නුඹලාගේ පරමාධිපතිගෙන්ය. එබැවින් කවරෙකු අභිමත කළේද ඔහු විශ්වාස කරත්වා! තවද කවරෙකු අභිමත කළේද ඔහු ප්‍රතික්ෂේප කරත්වා!" (අල් කුර්ආන් 18:29)

"(නබිවරය,) ප්‍රඥාවෙන් යුතුව ද යහපත් උපදෙස මගින් ද නුඹගේ පරමාධිපතිගේ මාර්ගය වෙත (ජනයින්ව) ඇරයුම් කරවු." (අල් කුර්ආන් 16:125)

"එබැවින් (නබිවරය,) නුඹ උපදෙස් දෙවු. සැබැවින්ම නුඹ හුදෙක් උපදෙස් දෙන්නෙකු පමණය. (22) ඔවුන් කෙරෙහි නුඹ බල කරන්නෙකු නොවේ." (අල් කුර්ආන් 88:21-22)

"(දේව පණිවිඩය නුඹලාට) දැන්වීම මිස රසූල්වරයා කෙරෙහි (වෙනත් වගකීමක්) නොවීය. තවද අල්ලාහ් නුඹලා හෙළි කරන දෑ ද නුඹලා සඟවන දෑ ද දන්නේය. (අල් කුර්ආන් 5:99)

"අල්ලාහ් හැර ඔවුන් අයැදින අයට (හෝ දෑට) නුඹලා බැණ නොවදිවු." (අල් කුර්ආන් 6:108)

මෙම ඉගැන්වීම් අවධානයට යොමු කිරීමෙන් ඉස්ලාමීය ෂරිආව තුළින් මිනිසාට යහමග පෙන්වන්නක් බව පැහැදිළිව වැටහෙනු ඇත.

එමෙන්ම නීතිය හා යුක්තිය බිඳ දමමින් ක්‍රියා කිරීමට කිසිදු ඉස්ලාමිකයෙකුට අනුමැතිය නොමැත. පුද්ගල වෛරය හා ක්‍රෝධය පදනම් කර ගනිමින් අන් අය පිළිබඳව අයුක්ති සහගතව ක්‍රියා කිරීමට ද ඉස්ලාමිකයෙකුට අනුමැතිය නොමැත.

"විශ්වාස කළවුනි, අල්ලාහ් වෙනුවෙන් (ඔහුගේ නියෝගයන් පිළිපැදීමට) ස්ථිර වූවන් ලෙස හා යුක්තිය සඳහා සාක්ෂිකරුවන් ලෙස වවු. තවද සැබැවින්ම (ප්‍රතික්ෂේපිත) පිරිසකගේ ක්‍රෝධය නුඹලා යුක්තිය ඉටු නොකිරීම කෙරෙහි නුඹලාව පොලඹවිය නොයුතුය. (සෑම අවස්ථාවකම) නුඹලා යුක්තිය ඉටු කරවු. එය බිය භක්තියට ඉතා සමීපය. තවද අල්ලාහ්ට බිය භක්තිමත් වවු. සැබැවින්ම නුඹලා කරන දෑ පිළිබඳව අල්ලාහ් අභිඥානවන්තය." (අල් කුර්ආන් 5:8)

ඉහතින් සඳහන් කරුණු කෙතරම් නිරවද්‍ය ද යන්න ඔබට ඉදිරි විග්‍රහයන් අනුව තව දුරටත් සනාථ වේ. යැයි විශ්වාස කරන්නෙමු.

## ඉස්ලාමීය දෘෂ්ඨිකෝණය තුළ ජාති, කුල වෙනස්කම් නැත

"ජනයිනි, එකම ආත්මයකින්(**ආදම්**ගෙන්) නුඹලාව මවා එයින් එහි කලත්‍රයා(සහකාරිය වන **හව්වා**) ද මවා එම දෙදෙනා තුළින් බොහෝ පුරුෂයින් හා ස්ත්‍රීන් (මවා) ව්‍යාප්ත කළ නුඹලාගේ පරමාධිපතිට නුඹලා බිය භක්තිමත් වවු. තවද කවරෙකුගේ නාමයෙන් නුඹලා එකිනෙකා (උරුම වස්තුන්) ඉල්ලා සිටිනුයේ ද එම **අල්ලාහ්**ට ද උපතින් වූ ඥාති සබඳතාව[2] (බිඳී යාම පිළිබඳව) ද නුඹලා බිය භක්තිමත් වවු. සැබැවින්ම **අල්ලාහ්** නුඹලා කෙරෙහි සර්ව නිරීක්ෂකය." (අල් කුර්ආන් 4:1)

"ජනයිනි, සැබැවින්ම අපි නුඹලාව පිරිමියෙකු හා ස්ත්‍රියකගෙන් මැවුවෙමු. තවද නුඹලා එකිනෙකා හඳුනා ගනු පිණිස ජාතීන් හා ගෝත්‍ර බවට පත් කළෙමු. සැබැවින්ම **අල්ලාහ්** අබියස නුඹලාගෙන් ඉතා ශ්‍රේෂ්ඨයා නුඹලාගෙන් ඉතා බිය භක්තිකයාය." (අල් කුර්ආන් 49:13)

## ඉස්ලාමය තුළින් අනෙකා සමග යුක්තිගරුකව යහ අයුරින් හැසිරෙන ලෙස විධානය කිරීම

"විශ්වාස කළවුනි, නුඹලා **අල්ලාහ්**ට බිය භක්තිමත් වවු. තවද නුඹලා (යුක්තිගරුක) ඍජු වචන පවසවු." (අල් කුර්ආන් 33:70)

"විශ්වාස කළවුනි, නුඹලා **අල්ලාහ්**ට බිය භක්තිමත් වවු. නුඹලා සත්‍යවාදීන් සමග වවු." (අල් කුර්ආන් 9:119)

"විශ්වාස කළවුනි, නුඹලා යුක්තිය ඉටු කරන්නන් වවු. නුඹලාට එරෙහි වුව ද නැතහොත් දෙමාපියන්ට හා ඥාතීන්ට එරෙහි වුව ද (සත්‍යය නිර්දේශයන් සඳහා) **අල්ලාහ්** වෙනුවෙන් සාක්ෂි දරන්නන් වවු. ඔහු(විත්තිකරු) ධනවතෙකු වුව ද දිළිඳෙකු වුව ද (ඔහුට එරෙහිව සත්‍ය සාක්ෂි පැවසීමෙන් නොවැළකෙවු. මන්දයත්) **අල්ලාහ්** ඔවුන් දෙදෙනාට (රැකවරණය ලබා දීමට) සුදුසු වන්නේය.[3] නුඹලා අයුක්ති සහගත වීමට මනෝ ඉච්ඡාව අනුගමනය නොකරවු. (ඔබ සාක්ෂි දීමේ දී සාක්ෂිය) වෙනස් කළේ නම් හෝ (සත්‍යය ස්ථාපිත කිරීමට) පිටුපාන්නේ නම් එවිට (**අල්ලාහ්** නුඹලාට දඬුවම් කරනු ඇත. මන්දයත්) **අල්ලාහ්** නුඹලා කරන දෑ පිළිබඳව අභිඥානවන්ත වන්නේය." (අල් කුර්ආන් 4:135)

"දෙමාපියන් සමග යහපත් අයුරින් කටයුතු කරවු. තවද ඥාතීන් සමග ද අනාථයින් සමග ද දිළිඳුන් සමග ද ඥාතී අසල්වැසියා සමග ද සමීප අසල්වැසියා සමග ද අසලින් සිටින මිතුරා සමග ද[4] මගියා සමග ද නුඹලාගේ දකුණත සතු කර ගත් (වහල්) අය සමග ද (යහපත් අයුරින් කටයුතු කරවු). සැබැවින්ම **අල්ලාහ්** උඩඟුකමින් හා පුහුමානයෙන් සිටින්නන්ව ප්‍රිය නොකරන්නේය." (අල් කුර්ආන් 4:36)

---

2) සාමාන්‍යයෙන් කෙනෙක් තවත් කෙනෙකුගෙන් තමන්ගේ උරුමය ඉල්ලන විට "අල්ලාහ් වෙනුවෙන් මාගේ උරුමය මට දෙවු." යැයි පවසයි. මෙම වැකිය මගින් සඳහන් කරනුයේ ද එවන් වූ ඉල්ලීමකි. එමෙන්ම උරුමය ලබා දෙන කෙනාද මා මෙම උරුමය උරුමක්කාර පුද්ගලයාට ලබා දිය යුතු යැයි අදිටන් කර ගත යුතුය. මෙම උපදෙස සෑම ආකාරයකම වගකීම් සඳහා පවසනු ලැබුව ද මෙම ආයතයෙහි විශේෂයෙන් උපතින් වූ ඥාති සබඳතාව සඳහා පවසනු ලැබ ඇත. මන්දයත් ඔවුන් ඉතා වැදගත් වූ පිරිසකි. තවද මින් පසුව සඳහන් වී ඇති වැකියන්හි ඔවුන්ගේ උරුමයන් සම්බන්ධව පැහැදිලි කර ඇත.

3) මෙහි අදහස් වන්නේ කෙනෙකුගේ දුගී බව හෝ ධනය හේතුවෙන් ඔහුට පිහිට පතා නුඹ ඔහුට සාධකව බොරු සාක්ෂි නොකියන ලෙසය. මන්දයත් අල්ලාහ් ඔහු කෙරෙහි යුක්තියෙන් පිහිට වීමට ප්‍රමාණවත් වන්නේය.

4) 'අසලින් සිටින මිතුරා' යනුවෙන් අදහස් කරන්නේ සහකාර මගියා, සභාවක ඔහු සමීපයෙන් සිටින තැනැත්තා හෝ එක් පේළියක ඔහු අසලින් සිටගන්නා තැනැත්තා වැනි අයවයි. මෙම වැකියෙහි ඉගැන්වීම වනුයේ කෙනෙක් තාවකාලික මිතුරෙකු හෝ අසල්වැසියෙකු සමග වුවද යහපත් අචාරශීලී ගුණාංගයන්ගෙන් හැසිරිය යුතුය යන්නයි.

නමුත් මෙවන් ලෙස චෝදනා නගන්නන්ගේ චෝදනාවන්ට හේතුව වී ඇත්තේ තමන්ගේම නොදැනුවත්කම හැර අල් කුර්ආනයේ දෝෂයක් නොවනු ඇත යැයි අපි විශ්වාස කරන්නෙමු.

## මුහම්මද් තුමාණන් මෙලොවට පැමිණි අරමුණ

"තවද (**නබි**වරය,) සමස්ත විශ්වයන්ට දයාලුවක් වශයෙන් මිස අපි නුඹව (**නබි**වරයෙකු වශයෙන්) නොඑව්වෙමු." (21:107)

## ඉස්ලාමීය ඉගැන්වීම් අනුව අසාධාරණයට ලක් වූ පුද්ගලයා

"අයුක්තියට ලක් වූවන්ගේ ප්‍රාර්ථනාවට බියවන්න. ඔහු දේව ප්‍රතික්ෂේප කරන්නෙකු වුව ද කම් නැත. එයටත් අල්ලාහ්ටත් අතර කිසිදු තිරයක් නොමැත්තේය." (මූලාශ්‍රයඃ මුස්නද් අහමද්) යන නබි වදන සහෝදර මුස්ලිම් නොවන ප්‍රජාව සමග මුස්ලිම්වරුන් නීතිගරුකව හැසිරිය යුතුය යන්නට රුකුල් දෙන්නකි.

ඉහත නබි වදනෙහි අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ තහනම පිළිබඳව දැන්වීම දැඩි අවවාදාත්මක රටාවකින් සැකසී ඇත. අන්‍ය ආගමිකයෙකුට අයුක්ති සහගත වීම හෝ ඔහුගේ හැකියාව අභිබවා ගිය යමක් ඔහුට පැවරීම හෝ ඔහුගේ සාධාරණ හිමිකම් උදුරා ගැනීම වැනි නීතිය ඉක්මවා යෑමක දී මෙම නබිතුමාගේ ප්‍රකාශය කොතරම් දැඩි ලෙස අවවාද කරන්නේ ද යන්න වටහා ගත හැක. තවත් නබිවදන් පෙළක, කවරෙකු ගිවිසුමක් ඇතිකර ගත් මුස්ලිම් නොවන කෙනෙකු මරා දමන්නේ ද ඔහුට ස්වර්ගයේ සුවද ආඝ්‍රාණය කිරීමට පවා නොලැබේ. නියත වශයෙන්ම ස්වර්ගයේ සුවද වසර 40 ක (කාලයක් කෙනෙක් ඇවිද යන) දුරක් දක්වා පවතී. (මූලාශ්‍රයඃ සහීහුල් බුහාරි)

"මුස්ලිම් නොවන්නෙකු සමග ගිවිසුමක් ඇති කරගත් කෙනෙකු ඔහුට අයුක්තියක් කරයි ද, නැතිනම් ඔහුගේ අයිතිවාසිකම් හීන කරයි ද, නැතිනම් ඔහුගේ ශක්තියට බාහිරව ඔහුට වගකීම් භාර කරයි ද, නැතිනම් ඔහුගේ අකමැත්තෙන් ඔහුගෙන් යමක් ලබා ගනී ද, (එකී පුද්ගලයා විෂයෙහි) ඔහුට විරුද්ධව පරලොව මම තර්ක කරන්නෙකු වන්නෙමි" යනුවෙන් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණෝ පැවසූහ. (ග්‍රන්ථය : අබූ දාවූද්)

එමෙන්ම මුහම්මද් තුමාණන් හා ඔහුගේ සගයින් මුස්ලිම් නොවන්නන් සමග සහජීවනයෙන් ඇසුරු කළ අන්දම ආදර්ශයක් කර ගනිමින් ජීවත් වීම තුළින් සාමකාමී පරිසරයක් උදාවනු ඇතැ'යි විශ්වාස කරන්නෙමු.

- **ඉස්ලාමීය රාජ්‍යයක මුස්ලිම් නොවන්නන්ගේ අයිතිවාසිකම්, දේවස්ථාන හා ආගමික සහ සංස්කෘතික කටයුතු ආරක්ෂා කිරීමට ප්‍රමුඛත්වය දීම.**

  1. නබි මුහම්මද් තුමාණන් වෙත නජ්රාන් දේශයේ සිට පැමිණි කිතුනු පූජකයින් සමග එතුමාණන් ගිවිස ගත් ගිවිසුමෙහි මෙසේ සඳහන් වී ඇත. "නජ්රාන් වැසියන් හා පූජකයින් සමග සිටින්නන් මුස්ලිම්වරුන්ගේ වගකීමෙහි සිටිති. ඔවුන්ගේ ජීවිත, දහම, ඉඩකඩම් ඇතුළු සියලු දේපල, මෙහි සිටින්නන් හා නොසිටින්නන්, ආගමික නැමදුම් ස්ථාන යනාදීන්, තවද ඔවුන්ගේ පවුලේ උදවිය හා ඔවුන්ව පිළිපදින්නන් යන සියල්ලන් කෙරෙහිම මෙහි ආරක්ෂාව හා වගකීම හිමි වේ. ඔවුන්ගේ අයිතිවාසිකමින් හෝ ඔවුන්ගේ දහමින් හෝ කිසිවක් වෙනස් කරනු නොලැබේ. තවද කිසිදු පූජකවරයෙකු හෝ පැවිද්දෙකු තමන්ගේ පදවියෙන් ඉවත් නොකෙරේ. නිත්‍යානුකූලව ඔවුන් සතුව ඇති සෑම දෙයක්ම ඔවුන් සතු දැය.' යනුවෙන් සඳහන් වී තිබිණ. (උපුටා ගැනීම : දලාඉලුන් නුබුව්වා)

  2. මුහම්මද් තුමාණන් විසින් නජ්රාන් ප්‍රදේශයෙන් පැමිණි කිතුනු නියෝජිතයින් සමග ඔවුන්ගේ සියලු අයිතිවාසිකම් ලබාදෙන බවට ගිවිසුම් කළාක් මෙන් ඉස්ලාමීය දෙවන පාලකයා වන උමර් ඉබ්න් අල් කත්තාබ් තුමා විසින් ඉලියා (ජෙරුසලම) ප්‍රදේශවාසීන් සමග එළැඹි ගිවිසුමේ ද කටයුතු කොට ඇත. (උපුටා ගැනීම : අත් තාරීකුත් තබරී)

- **මුස්ලිම් නොවන ජනයාට සමානාත්මතාව, යුක්තිය හා සාධාරණය භුක්ති විඳීමට නිදහස ලබා දීම.**

  1. 'ඉස්ලාමීය ෂරීආව මුස්ලිම් නොවන ජනයාට වෘත්තීන්හි නියැළීමේ අවස්ථාවන් වසා දැමුවේ නැත. ඔවුන් ඉතා ඵලදායී උසස් වෘත්තීන්හි නියැළී සිටියහ. ඔවුන් ඉස්ලාමීය රාජ්‍යයන්හි මුදල් හුවමාරු කරන්නන්, ව්‍යාපාරිකයින්, රන් ආභරණ වෙළඳුන්, වෛද්‍යවරුන් හා ඉඩම් හිමියන් ලෙස

කටයුතු කළහ. ඉතාමත් එලදායී අයුරින් ඔවුන් සංවිධානය වී සිටියහ. එකල සිරියාවෙහි බොහෝ මුදල් හුවමාරු කරන්නන් හා රන් ආභරණ වෙළඳුන් ලෙස කටයුතු කළේ යුදෙව්වන් වූ අතර බොහෝ වෛද්‍යවරුන්, ලිපිකරුවන් හා ලේඛකයින් ලෙස කටයුතු කළේ කිතුනුවන්ය. බැග්ඩෑඩ්හි පාලකයාගේ වෛද්‍යවරයා ලෙස කටයුතු කළේ කිතුනුවන්ගේ නායකයා වූ අතර යුදෙව්වන්ගේ නායකයින් හා යුදෙව් ව්‍යාපාරිකයින් පාලකයාගේ සේවකයින් ලෙස සිටියහ.' (Mitz Adam - 'The Islamic Civilization in the Fourth Century A.H.-Ref Section - 'Jews & Cristians' Volume 1Page 86)
2. දිම්මිවරුන්ව(එනම් ඉස්ලාමීය රාජ්‍යක ජීවත් වන මුස්ලිම් නොවන ජනයාව) ශාරීරික හානියෙන් ආරක්ෂා කිරීම පමණක් නොව ඔවුන්ව සියලුම ආකාරයේ වාචික අපහාසාත්මක ක්‍රියාවන්ගෙන් ද ආරක්ෂා කිරීම ඉස්ලාමීය රාජ්‍යයක වගකීම වේ. මුස්ලිම්වරුන්ට සමාන අයුරින් දිම්මිවරුන් සම්බන්ධයෙන් ද සාධාරණ හේතුවකින් තොරව අපහාසාත්මක කිසිවක් ඔවුනට පැවසීම සහමුලින්ම තහනම්ය. (උපුටා ගැනීම : Al Furooq – Volume 3 – Page 14)

- **නබි මුහම්මද් තුමාණන් හා මුස්ලිම්වරුන් තම අන්‍යාගමික අසල්වැසියන් සමග යහ අයුරින් හැසිරීම හා ඔවුන්ගේ ත්‍යාග පිළිගැනීම.**
  1. නබි මුහම්මද් තුමාණන්ගේ අසල්වැසියා වූයේ යුදෙව්වෙකුය. "කවරෙකුගේ අසල්වැසියා තම හිංසා අපරාධවලින් ආරක්ෂාව නොලබන්නේද ඔහු සත්‍ය විශ්වාසිකයෙකු නොවේ." යැයි මුහම්මද් තුමාණන් අල්ලාහ් මත දිවුරා පවසා ඇත. (මූලාශ්‍රය : සහීහුල් බුහාරි)
  2. මුකව්කස් හා කිස්රා නැමැති කිතුනු රජවරුන් වෙතින් පැමිණි ත්‍යාගයන් මුහම්මද් තුමාණන් සතුටින් පිළිගෙන ඇත. රජවරුන් පමණක් නොව මුස්ලිම් නොවන සාමාන්‍යය ජනයා වෙතින් පැමිණි ත්‍යාගයන් ද සතුටින් පිළිගෙන ඇත.

- **අන්‍යාගමිකයින් අසනීප වී සිටින විට ඔවුන්ව සුවදුක් විමසීමට යෑම හා මරණයට පත් වූ අයගේ දේහයට ගෞරව කිරීම.**
  1. නබි මුහම්මද් තුමාණන් හට සේවය කරමින් සිටි යුදෙව් ළමයෙකු අසනීප තත්ත්වයකට පත් වූ අවස්ථාවක එතුමාණන් ඔහුගේ සුව දුක් විමසීම සඳහා ගොස් ඇත. (මූලාශ්‍රය : සහීහුල් බුහාරි)
  2. විටෙක අයෙකුගේ දේහයක් ගෙන යනු දුටු නබි මුහම්මද් තුමාණන් නැගිට ඊට ආචාර කළහ. " එය යුදෙව් ජාතිකයකුගේ දේහයක්" යැයි මිනිසුන් පැවසූ කල, එතුමාණන් "එය මනුෂ්‍ය ආත්මයක් නොවේ දැ"යි විමසූහ. (මූලාශ්‍රයඃ සහීහුල් බුහාරි)

- **අන්‍යාගමිකයින් සමග මුස්ලිම්වරුන් ගනුදෙනුවල යෙදීම හා ඔවුන්ගේ හැකියාවන් තුළින් ප්‍රයෝජන ගැනීම.**
  1. නබි මුහම්මද් තුමාණන් යුදෙව් ජාතිකයෙකුගෙන් ආහාර වර්ගයක් ණයට ගෙන ඒ වෙනුවට තම යුද කවසම ඔහු අබියස උකසට තබා ඇත. (මූලාශ්‍රය : සහීහුල් බුහාරි) මෙය පමණක් නොව තවත් විටෙක නබි මුහම්මද් තුමාණන් තවත් යුදෙව්වෙකුගෙන් ණයක් ගෙන සිටි අවස්ථාවක ණය හරවා දීමේ දිනයට පෙරම එම යුදෙව්වා පැමිණ අයුතු ආකාරයකින් තම ණය ඉල්ලා සිටිය ද එතුමාණන් යහ අයුරින් හැසිරී ඔහුගේ ණය හරවා දුන්නේය.
  2. අබ්දුල්ලාහ් බින් උරෙයිකිත් නැමැත්තා අන්‍ය ආගමිකයෙකුව සිටියද මුහම්මද් තුමාණන් මදීනාව කරා දේශාන්තරණය කළ අවස්ථාවේදී ඔහුව තම මාර්ගෝපදේශකයෙකු ලෙස කුලියට ගත්හ. ඔහු ගමන් මාර්ග පිළිබඳව හොඳ දැනුමැත්තෙකුව සිටියේය. (මූලාශ්‍රය : සහීහුල් බුහාරි)

## ආගමික හා වාර්ගික සහජීවනය සඳහා ශ්‍රී ලාංකේය මුස්ලිම් ජනයාගේ දායකත්වය

මෙලෙස ඉස්ලාමීය මූලාශ්‍රයන් අතුරින් ඉස්ලාමීය සාමයික සහජීවනයේ අලංකාර ඉගැන්වීම් රාශියක් උපුටා දැක්විය හැක. ආගමික හා වාර්ගික සහජීවනය සඳහා ශ්‍රී ලාංකේය මුස්ලිම් ජනයාගේ දායකත්වය කෙරෙහි ද අවධානය යොමු කරමු.

## රජවරුන්ට මුස්ලිම්වරුන් සහය දැක්වූ අයුරු

පෘතුගීසි ලන්දේසි හා ඉංග්‍රීසි ආක්‍රමණයන්ට අප අවසාන වශයෙන් මුහුණ දුන්නෙමු. 1796 දී ඉංග්‍රීසි ආක්‍රමණය සමග ලන්දේසි පාලනය අවසන් වී 1815 මාර්තු 2 වැනි දින කන්ද උඩරට මඟුල් මඩුවට රැස් වූ රදළවරු හා ප්‍රභුවරු ඉංග්‍රීසීන් සමග ගිවිසුමක් අත්සන් කරමින් මාතෘභූමියේ නිදහස හා අයිතිය

ඉංග්‍රීසින්ට පාවා දෙන ලදී. 1505 සිට වර්ෂ 443 ක විදේශ ආක්‍රමණ හා 1815 සිට වර්ෂ 133 ක විදේශ ආධිපත්‍යය අවසන් කරමින් 1948 පෙබරවාරි මස 4 වැනි දින නැවත වාරයක් ලක් මාතාව එකම ධජයක් යටතේ ඒකීය රටක් ලෙස නිදහසේ සුවය භුක්ති විඳීමේ අයිතිය උරුම කර ගත්තාය.

විදේශ ආක්‍රමණ පිළිබඳ මෙසේ සටහන් තබන මෙම මොහොතේ විදේශයෙන් පැමිණි තවත් ජන කොට්ඨාශයක් පිළිබඳ සඳහනක් කිරීමට අපි බැඳී සිටින්නෙමු. ශ්‍රී ලාංකේය මුස්ලිම් ප්‍රජාවගේ මූලාරම්භයට හේතු වූ අරාබිවරුන්ගේ ශ්‍රී ලංකාගමනය පිළිබඳ ඉතිහාසය පිළිගත් මූලාශ්‍ර සටහන් වෙත ඔබ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින්නෙමු.

## "මුස්ලිම්වරු මෙරටට ආක්‍රමණික අපේක්ෂාවෙන් නොපැමිණියෝය"

"පණ්ඩුකාභය රජ (ක්‍රි. පූ. 377 - 307) තම අගනුවර වූ අනුරාධපුරයෙහි යම් යම් ඉඩම් අගනුවරට පැමිණි පූර්ව ඉස්ලාමීය අරාබි වෙළෙන්දන් වූ යෝනකයන් සඳහා වෙන් කළේය". (මහාවංශය X - 90 වැනි පිටුව) (මහාචාර්ය ලෝනා දේවරාජ - ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු - සහශ්‍රයක ජනවාර්ගික සහජීවනය - පිටු අංක 72)

මෙම ඓතිහාසික තොරතුරු මගින් පැහැදිලිව පෙනීයන්නේ අරාබි ජාතිකයින් ආක්‍රමණික අපේක්ෂාවන් ඇතිව මෙරටට නොපැමිණි අතර ඔවුන්ගෙන් මෙරට පාලකයින්ට හා ජනයාට විදේශ වෙළඳාම් කටයුතු හා විදේශ සබඳතා කටයුතු සාර්ථක අයුරින් සිදු කරමින් ඉමහත් සේවාවක් ලබා දී ඇති බවය. එසේ නොවුවානම් පාලකයින් මෙලෙස ඔවුන්ව මෙරට රඳවා ගැනීමේ අරමුණින් ඉඩම් හා අනෙකුත් පහසුකම් ලබා දී කටයුතු කරන්නේදැ'යි කරුණාකර මොහොතකට සිතා බලන්න.

## "මුස්ලිම්වරු රජුන්ට උපදෙස් දෙමින්"

"ශ්‍රී ලංකාවේ බලකොටුවක් ඉදි කරන ලෙසට පෘතුගාල රජු දුන් ආඥාවක් අතැතිව 1518 දී ලෝපෝ සෝරස් ද ඇල්බගේරියා ලංකාවට පැමිණියේය. සිංහල සමාජයේ සියලු තරාතිරම්වල ජනයාට කරුණු පහදා දෙමින් බලපෑම් ඇති කරමින් බලකොටුවක් ඉදි කිරීම වැළැක්වීමට මුස්ලිම්වරු ඔවුන්ට හැකි හැම දෙයක්ම කළහ. පෘතුගීසීන්ගේ එකම අභිප්‍රාය රට අල්ලා ගැනීම බැවින් නොබෝ කලකින්ම රජුගේ ස්වෛරී ආධිපත්‍යය දිය වී යනු ඇති බවට ඔවුහු කෝට්ටේ රජුට අනතුරු ඇඟවූහ." (මහාචාර්ය ලෝනා දේවරාජ - ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු - සහශ්‍රයක ජනවාර්ගික සහජීවනය - පිටු අංක 89 - 90)

ඉහත සඳහන් අයුරින් උපදෙස් දීම් වලට පමණක් සීමා නොවී පෘතුගීසි බලය මෙරට තුළ ස්ථාපිත වී අනිසි විපාක මතු වන්නට වූ විට සිංහල හමුදාව සමග උරෙනුර ගැටී පෘතුගීසීන්ට එරෙහිව විවිධ හමුදා මෙහෙයුම් වැලට ද මුස්ලිම්වරුන් සහභාගී වී ඇති බව ඉතිහාසය අපට සාක්ෂි දරයි.

## "යෝනක ඔටු බලකාය"

"රණ ශූරයන් වූ ලංකා යෝනකවරු සිංහල යුද්ධ හමුදාවේ කොටසක් වූහ. ඔවුන්ගේ ඔටු බලකාය (ඔටු පැන්නිය) 17 වන ශත වර්ෂයේදී වැල්ලවාය සටනේදී ප්‍රමුඛ ස්ථානයක් ගත්තේය. වැල්ලවායේ දී ලැබූ විශිෂ්ට ජයග්‍රහණය සිහි කිරීමක් වශයෙන් මේ ඔටු බලකායට ගෞරව කරමින් දෙවන රාජසිංහ රජු (ක්‍රි. වර්ෂ 1634 - 1684) විසින් හඟුරන්කෙත මහා දේවාලයට පූජා කරන ලද රාජකීය ප්‍රතිඥාත දේව අංගම් රෙද්දෙහි මේ බලකාය සිතුවම් කරන ලදී."

"ලන්දේසි අද්මිරාල් ජෝරිස් වැන් ස්පිල්බර්ජන් මඩකලපුවට ගොඩබැස බව සැල වූ විට දෙවන විමලධර්මසූරිය රජු මහත් සේ සතුටට පත්ව මේ විශේෂ අමුත්තන් පිළිගැනීම සඳහා තුර්කි, යෝනක හා සිංහල වැනි නානා ජාතීන්ගෙන් සමන්විත බලඇණි අටකින් සමන්විත වූ දහසක් පමණ යුද්ධ සේනාවක් මඩකලපුවට යැවූ බව වුටර් ස්කෝටන් විසින් ලියා තිබේ." (හෙන්රි කොරයා. "ද සන්ඩේ ඔබ්සර්වර්" ඉරුදින සංග්‍රහය - 1965 අගෝස්තු 8)

මෙලෙස ශ්‍රී ලාංකේය මුස්ලිම් ජනයා තම මාතෘභූමිය වෙනුවෙන් විවිධ පරිත්‍යාගයන් කරමින් මෙරටේ ආරක්ෂාව හා අභිමානය සුරක්ෂිත කිරීමට කටයුතු කොට ඇත. මොවුන්ගේ මෙම යහ හැසිරීමට හේතු වූයේ අල් කුර්ආනය හා හදීස් නම් නබිවදන් පදනම් කරගත් නිසා මිස වෙනත් කුමක්ද? අප ඔබ සැමගෙන් අසන්නට කැමැති වන්නේ ඔවුන් මෙම රටදැය වෙනුවෙන් වෙහෙස මහන්සි වී දායකත්වය දැක්වූයේ "බොරුව හා මුලාව" පදනම් කර ගත් නිසාද? නැතිනම් අල් කුර්ආනය හා හදීසය පදනම් කරගත් නිසාදැ?යි අසන්නට කැමැත්තෙමු.

එමෙන්ම මෙරට යෝනක සමාජයේ සිටි ස්ත්‍රීන් පිළිබඳව ඇතැම් සංදේශ කාව්‍යයන් කළ කවීන්ගේ වර්ණනාවට පවා පාත්‍ර විය. පහළොස් වන ශත වර්ෂයේ සාහිත්‍ය කෘති වූ සංදේශ කාව්‍ය වල (කෝකිල

සංදේශ වර්ණනාව, ඩබ්.එෆ්. ගුණවර්ධන, 74 වන කවිය සහ ගිරා සංදේශ විවරණය, මුණිදාස කුමාරතුංග, 104 වන කවිය) යොන් ලියන් හෙවත් මෙම අරාබි මිශ්‍ර යෝනක කාන්තාවන් ගැන සඳහන් වේ. මේ නිසා අරාබිවරුන් මෙරට සමග ගනු දෙනු කළේ මෑතක සිට නොවන බව සහ ඔවුන් විසින් මෙරට ජනාවාස කර ගත්තේද අද ඊයෙක නොවන බව ද පැහැදිලිය.

## නිදහස ලබා ගැනීම පිණිස මුස්ලිම්වරුන්ගේ දායකත්වය

ඉංග්‍රීසි ආණ්ඩු කාලයේ මුලින්ම ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේදී ද දෙවනුව රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී ද නිදහස ලැබුණු පසු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කළ ආචාර්ය තුවාන් බුර්හානුදීන් (ටී. බී.) ජායා මහතා මෙරට නිදහස් සටනට උර දුන් සැබෑ දේශප්‍රේමියෙකි. සමස්ත ජාතියේ හා දේශයේ යහපත කෙරෙහි එදා ජායා මහතා වැඩි අවධානයක් යොමු කළ අතර තම මාතෘ භූමිය ඉහළින් තබා සැලකීම පිළිබඳ උතුම් ආදර්ශය ප්‍රදර්ශනය කළ අවස්ථාවක් විය.

සෝල්බරි යෝජනා රාජ්‍ය මන්ත්‍රණ සභාව ඉදිරියේ විවාද වූ අවස්ථාවේදීත් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ශ්‍රී ලංකා ස්වාධිනතා පනත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ඉදිරිපත් කළ අවස්ථාවේදීත් මෙරට මුස්ලිම් ජනතාවගේ ස්ථාවරය පැහැදිලි කරමින් ඔහු කළ තීරණාත්මක වූත් ඓතිහාසික වූත් කතාව ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාවට අනාගතයේදීත් තමන් ගමන් කළ යුතු මග පිළිබඳ මග පෙන්වන ප්‍රකාශයක් ලෙස සැලකීම වටී.

මෙවන් මිනිසත් කම් අගය කරමින් ඒවා ආදර්ශයට ගනිමින් ජීවත් වීමට පුරුදු වෙමු. අසල්වැසියා තම ආගමිකයෙක්ද? නැද්ද? යන්න පිළිබඳ තැකීමකින් තොරව මනුෂ්‍යත්වයේ සහෝදර පිරිසක් ලෙස සලකා ඔවුන්ගේ ප්‍රශ්න හා අවශ්‍යතාවන් තමන්ගේ ද වගකීමක් ලෙස සලකා කටයුතු කරන ලෙස ශ්‍රේෂ්ඨ නබි වදන් අපට උගන්වයි. මිනිසාට ඇති එකම ජාතිය මනුෂ්‍ය ජාතිය බවත් අනෙකුත් වාර්ගිකත්වයන් එකිනෙකා හඳුනා ගැනීමේ සාධකයන් පමණක් බවත් ඉස්ලාමය උගන්වයි. (අල් කුර්ආන් 49:13) මනුෂ්‍යත්වයේ ශ්‍රේෂ්ඨත්වය රැකෙන පරිදි සියලු මිනිසුන් සමග සහෝදර බැඳීමකින් යුතුව කටයුතු කරමු.

## පශ්චාත් යුධ සමයේ මුස්ලිම්වරුන්ගේ දායකත්වය

තිස් වසරක කුරිරු බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදය ක්‍රියාත්මක වූ කාල වකවානුවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි ජීවත් වූ මුස්ලිම්වරුන්ට බෙදුම්වාදයේ කොටස්කරුවන් වීමට විවිධ ආකාරයේ බලපෑම් එල්ල විය. තම මාතෘභූමියේ ඒකීයත්වයට ගරු කරමින් කටයුතු කළ උතුරු නැගෙනහිර මුස්ලිම් ප්‍රජාවට විවිධ ආකාරයේ තාඩන පීඩන එල්ල විය. උතුරේ විසූ මුස්ලිම්වරුන් සැවොම ඉතාම කෙටි දැනුම් දීමකින් එම ප්‍රදේශයෙන් පලවාහරින ලදී. එම ජනයාගෙන් කොටසක් අදත් අනාථ කඳවුරුවල තම උරුමයන් ලබාගත නොහැකිව දුක්විඳිමින් සිටිති.

ශ්‍රී ලාංකේය මුස්ලිම් ජනයා බෙදුම්වාදී ත්‍රස්තවාදය ක්‍රියාත්මක වූ කාලයේ මුහුණ දුන්නු අති භයානක අත්දැකීම් රාශියෙන් කිහිපයකට විමසුම් හා විචාරශීලීව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින්නෙමු.

"1990 ජුලි මස 2 වැනි දින : කොළොඹ සිට තම ගම් ප්‍රදේශය කරා ගමන් කරමින් සිටි මුස්ලිම්වරුන් 194 දෙනෙකුව කුරුක්කල් මඩම් ප්‍රදේශයේදී වාහනයෙන් බස්සවා වෙඩි තබා ඝාතනය කිරීම. මෙම 194 දෙනාගෙන් 50 දෙනෙකුම මක්කාවට ගොස් හජ් වන්දනාව ඉටුකොට ආපසු පැමිණෙමින් සිටි පිරිසකි.

1990 අගෝස්තු 3 වැනි දින : කාත්තන්කුඩියේ මීරා ජුම්මා පල්ලියේ හා හුසෙයිනියා පල්ලියේ නැමදුමෙහි යෙදී සිටි මුස්ලිම්වරුන් 103 දෙනෙකුව ඝාතනය කරන ලදී.

1990 අගෝස්තු 21 වැනි දින : එරාවූර් සද්දාම් හුසෙයින් ගම්මානයේ මුස්ලිම්වරුන් 153 දෙනෙකුව ඝාතනය කරන ලදී.

ඉහතින් උපුටා දක්වන ලද්දේ වාර්ගික කොටසක් ලෙස මුස්ලිම්වරුන්ට සිදුවූ අපරාධ හා අසාධාරණකම් වලින් බිඳක් පමණි. කරුණාකර තම හෘදසාක්ෂියට එකඟව මෙවන් අධි පීඩාකාරී තත්ත්වය තුළත් මෙරට මුස්ලිම් ප්‍රජාව ක්‍රියා කළේ "බොරුව හා මුලාව" නිසාද? නැතිනම් අල් කුර්ආනයේ යහපත් ඉගැන්වීම් පදනම් කරගනිමින් රටට දැයට ආදරය කළ නිසාද? තවද ඔවුන් ක්‍රියා කළේ රටේ නීතියට අනුකූලවද? නැතිනම් අන්තවාදී ලෙසද? කියා පවසා සිටින ලෙස ඉල්ලා සිටින්නෙමු.

යුද්ධයක අවසානයක් දුටු සමාජයක් එකී යුද්ධය අවසානයේ ගොඩ නගන සමාජය ගැන බරපතළ ලෙස කල්පනා කළ යුතුව ඇත. අතීතයේ අප කළ වැරදි නිවැරදි කර ගනු වස් එය ඉතා අගනා අවස්ථාවකි. ජීවිතය නැවත අලුතින් නිර්මාණය කළ යුතු ව ඇත. වෛරය ක්‍රෝධය ඉවත ලා සැමට

සතුටින් සාමයෙන් ජීවත් විය හැකි සමාජයක් ස්ථාපිත කරන්නට වහාම අවශ්‍ය පියවර ගන්නට ඉදිරිපත් වෙමු. විසංවාදී නොවී සංවාදී සමාජයක් තුළ සියලු කරුණු සාමකාමීව විසඳා ගැනීමට අධිෂ්ඨානශීලීව ක්‍රියා කරන්නට ලක් මවගේ සියලු දරුවන් එකට අත්වැල් බැඳ ගනිමු. සෞභාග්‍යයෙන් සපිරි සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩ නගන්නට අපගේ පූර්ණ දායකත්වය ලබා දෙමු.

ආගම් වශයෙන් ද වාර්ගිකයින් වශයෙන් ද කුල වශයෙන් ද බෙදී කටයුතු කිරීම බැහැර කොට සමගිව එක්ව ගෙනගිය නිදහස් සටන අපට ජයගත හැකි වූයේ සමගිය නිසාවෙනි. එහෙයින් අප සැමගේ දේශාභිමානී අරමුණ විය යුත්තේ අර්ථ ශුන්‍ය වාදභේද තුරන් කොට සමගි සම්පන්න වී ශ්‍රී ලාංකිකයින් ලෙස ඒකරාශී වී සෞභාග්‍යමත් දේශයක් ගොඩ නැගීමයි.

## (8) චෝදනාව :

"දහස් ගණනක් වූ ඉස්ලාමික ඉගැන්වීම් අන්‍යාගමික සමාජයක් තුළ බලගැන්වෙන්නේ ඉතා සූක්ෂම ලෙසින් පියවරින් පියවර වන අතර එම ක්‍රියාදාමය ඉස්ලාමය විසින් බිලි ගන්නා අන්‍යාගමික සමාජය තුළ මුස්ලිම්වරුන්ගේ ප්‍රසාරණයට සමගාමීව බල ගන්වමින් ක්‍රියාත්මක වේ. අන්‍යාගමික සමාජයක බලය අත්පත් කර ගත් සැනින් එතෙක් සඟවා ගෙන සිටි තම ම්ලේච්ඡ ඉස්ලාමික ඉගැන්වීම් සියල්ලම බලගන්වා ෂරියා නීතියද බලාත්මක කොට අන්‍යාගමික සමූල ඝාතනය ඇරඹේ"

**විග්‍රහය** : මිනිසා අතර සදාකල් පැවතිය යුතු සහජීවනය උදෙසා ඉස්ලාමය නොයෙකුත් අන්දමින් ප්‍රයත්නය දරා ඇති බවට ඉතිහාසය සාක්ෂි දරන බව ඉතිහාසය අධ්‍යයනය කරන කිසිවෙකුටත් ප්‍රතික්ෂේප කළ නොහැක. සහජීවනය උදෙසා ඉස්ලාමය වෙර දරා ඇති අන්දම පහත නිදසුන් ඇසුරින් අවධානය යොමු කරන ලෙස ඔබ සැමගෙන් ඉල්ලා සිටින්නෙමු. එමෙන්ම අග්‍රගණ්‍ය ඉතිහාසඥයින්ගේ ඉස්ලාමීය පාලනය පිළිබඳ පවසන ලද සාක්ෂීන් කිහිපයක් ද පහතින් උපුටා ඇත්තෙමු.

ඉන්දුනීසියාව මුස්ලිම්වරුන් බහුතරයක් වාසය කරන විශාල රටකි. එමෙන්ම මැලේසියාවේ ද බහුතරයක් වනුයේ මුස්ලිම්වරුන්ය. මෙම රටවල් සියල්ල ඉස්ලාමය පිළිබඳ පැහැදීමකින් පැමිණියා මිස යුද ආක්‍රමණයක අත් දැකීම් තුළින් බලහත්කාරයෙන් යටපත් කර ගැනීමකින් ඉස්ලාමීකරණය වූවක් යන්න කිසිදු වාර්තාවක් සඳහන් වී නැත.

මේ අනුව පැහැදිලි වන තවත් කරුණක් නම් මෙවන් රටවල් සියල්ල බටහිර යටත් විජිත රාජ්‍යයන් බවට පත් වී එම දහම වැළඳ ගත්තා මෙන් නොව. ඊට පටහැණිව ඉස්ලාමය පිළිබඳ නිවැරදි අවබෝධයකින් ඉස්ලාමය ව්‍යාප්ත වූයේය යන්න කිසිදු සැකයකින් තොරව පැහැදිලි කරුණකි. ආක්‍රමණික යටත් විජිත රාජ්‍යයන් බවට පත් වූ රටවල්හි අත්දැකීම වනුයේ මිනිස් ඝාතන, දේපල විනාශයන්, අසාධාරණ හා දුක් කම්කටොලු අත්විඳීම් යනාදියයි. නමුත් විවෘත දැසින් බැලූ කල ඉතිහාසයෙහි ඉස්ලාමිකයින් බවට පත් වූ රාජ්‍යයන්හි මුස්ලිම් නොවන්නන්ට මෙවන් සැහැසි ඉරණමක් අත් විඳින්නට නොසැලැස් වූ බව නිසැකවම වැටහෙනු ඇත. මේ සම්බන්ධව අපූරු නිදසුන් කිහිපයක් ඉදිරිපත් කරන්නට කැමැත්තෙමු.

මුස්ලිම්වරුන් ස්පාඤ්ඤය අවුරුදු 800 ක කාල පරාසයක් පාලනය කළෝය. එම පාලන සමයෙහි වාසය කළ යුදෙව්වන් හා කිතුනුවන් තම ආගමික නිදහස නිසි අයුරින් ලැබූ බව ඉතිහාසයෙන් මකා දැමිය නොහැකි බව අප මතක තබා ගත යුතුය. (උපුටා ගැනීම: http://www.acju.lk/published/item/599-samaaja-sanwaada)

එලෙසම මුස්ලිම්වරුන් ඉන්දියාව අවුරුදු 800 ක කාල පරාසයක් පාලනය කළෝය. පාලනය කළ මුස්ලිම්වරුන්ට තම පාලනය යටතේ සිටින පුරවැසියන් බලෙන් ඉස්ලාමයට හරවා ගැනීමට හැකියාව තිබුණ ද එසේ නොකළ බව අදටත් ඉන්දියාවේ සියයට 80 ක් වන හින්දු ජන ගහණය අපට කදිම නිදසුනක් වනු ඇත. එමෙන්ම එම මුස්ලිම් රාජ්‍යයා විසින් එහි සිදු කරන ලද සමූල ඝාතනයන් සිදු වී ඇත්නම් අද එරටෙහි හින්දු ජනයා වැඩි ප්‍රතිශතයක් ජීවත් වීම මහා පුදුමයකි. කෙසේ හෝ එවන් තොරතුරක් ඔබ හමුවේ තිබේ නම් ඒ පිළිබඳව දන්වන මෙන් අප අසා සිටින්නට කැමැත්තෙමු.

එමෙන්ම ඊජිප්තුව, ඉරාකය, ජෝර්දානය, කුවේටය, ලෙබනානය, ඕමානය, කටාරය, තුර්කිය, එක්සත් එමීර් රාජ්‍යය, යෙමනය වැනි මුස්ලිම්වරුන්ගේ පාලනය තුළ පවතින මැද පෙරදිග රාජ්‍යයන්හි සුළුතරයක් වූ කිතුනුවන් හා යුදෙව්වන් තම ආගමික නිදහස් භුක්ති විඳිමින් අදටත් ජීවත් වන බව අපට හඬ නගා පවසන්නේ කුමක්ද? ඇත්තෙන්ම ඉස්ලාමයට විවේචනය කරන්නන් පවසන අයුරින් ඉස්ලාමීය

රාජ්‍යයන් විසින් අන් ආගමිකයින්ව **සමූල ඝාතනය** කරන්නේ යන මතය ඕනෑකමින් කරන ලද මුසාවාදයක් යැයි පාඨක ඔබට පහසුවෙන් වැටහෙනු ඇත.

ඇල්ජීරියාව, උස්බකිස්ථානය, කසකස්ථානය, මොරොක්කෝව, ලිබියාව, සෝමාලියාව, සූඩානය, ටියුනීසියාව, මර්තානියාව, මලාවිය, ඉතියෝපියාව, ස්පාඤ්ඤය හා මාලදිවයින ඇතුළු බොහෝ රටවල්හි වැසියන් ඉස්ලාමය වෙත තුඩු දුන් හේතුව වන්නේ ඉස්ලාමීය පාලනය තුළ තිබූ ආශ්චර්ය්‍යය නොවේද?

## අග්‍රගණ්‍ය ඉතිහාසඥයින්ගේ ඉස්ලාමීය පාලනය පිළිබඳ සාක්ෂි

"ගුස්ටාවේ ලෙබොන්" (Gustave Lebon) පවසන අන්දමට 'තමන්ගේ පළමු යටත් කරගැනීම් පිළිබඳව ඉතා පහසුවෙන් උද්දාමයට පත් වී බොහෝ ජයග්‍රාහිකයින් විසින් සාමාන්‍යයෙන් කරනු ලබන අසාධාරණකම් කරන්නට අරාබිවරුන්ට බොහෝ විට ඉඩ තිබුණි. පරාජයට පත් කරනු ලැබූ තමන්ගේ විරුද්ධවාදීන්ට අකටයුතුකම් කරන්නට ද තමන් ලෝවැසියන්ට ප්‍රචාරය කරන ඉස්ලාමය වැලඳ ගන්නා ලෙස බල කරන්නට ද ඔවුන්ට ඉඩකඩ තිබුණි. නමුත් අරාබිවරුන් කිසි විටෙක එලෙස නොකළහ. ශ්‍රේෂ්ඨ බුද්ධි ප්‍රභාවක් තිබූ ආරම්භක ඉස්ලාමීය පාලකයින් විසින් දහම හා පිළිවෙත් බලෙන් ආරෝපිත කළ නොහැකි බව අවබෝධ කර ගෙන සිටියහ. මෙය නව දහමක අනුගාමිකයින් අතර බොහෝ විට දකින්නට නොමැති ලක්ෂණයකි. එහෙයින් ඔවුන් යටත් කර ගත් සිරියාව, ඊජිප්තුව, ස්පාඤ්ඤය හා අනෙකුත් සෑම රටකම වැසියන් සම්බන්ධයෙන් අප දැක ඇති පරිදි ඉතා කාරුණිකව කටයුතු කොට ඇත. ඔවුන්ගේ නීති පද්ධතීන්, විධි විධානයන්, ආගමික විශ්වාසයන් එලෙසම පවත්වා ගෙන යෑමට ඉඩ හැරිය අතර "ජිස්යා" බදු පමණක් ගෙවන්නට නියම කරන ලදී. මෙම බද්ද ඔවුන් විසින් පෙර ගෙවූ බදු සමග සසඳන විට ඉතාමත් අල්ප ප්‍රමාණයකි. මෙය ගෙවීමෙන් යුද සේවයෙන් ඔවුන්ව නිදහස් කොට ඔවුන්ට පූර්ණ ආරක්ෂාව සහතික කොට දී තිබුණි. සත්‍යය නම් රටවල් යටත් කර ගත්තන් අතුරින් මුස්ලිම්වරුන් තරම් කාරුණික වූවන් හා ඉස්ලාමය තරම් කාරුණික වූ දහමක් පිළිබඳව ලෝවැසියන් මෙයට පෙර දැන නොසිටීමය." (Lebon G 'Civilization of Arabs' Page 605)

'මුස්ලිම්වරුන්ගේ පාලනයට අයත් වූ භූමි ප්‍රදේශයන්හි තිබූ කිතුනු දෙව්මැදුරු වලට කිසිදු හානියක් සිදු නොවන පරිදි ඒවා ආරක්ෂා කරන ලදී. නෙස්ටෝරියානු නිකායේ ප්‍රධානී රිෆාඩශීර් (Rifardashir)හි අග්‍ර රාජගුරු ප්‍රසාදී හා පර්ශියාවේ සියලු බිෂොප්වරුන්ගේ නායක ජෙෆ් III විසින් සිමිඔන් වෙත ලිපියක් ඉදිරිපත් කරමින් මෙසේ සඳහන් කොට තිබුණි. "දෙවිඳුන් විසින් මුළු ලොවෙහි බලය අරාබිවරුන්ට ලබා දී ඇති අතර ඔවුන් ඔබ අතර ජීවත් වන හෙයින් ඔබ කෙතරම් ධනවත් දැ'යි ඔවුන් දනිති. එය එසේ වූවද ඔවුන් කිතුනු දහමට විරුද්ධවාදීකම් පාන්නේ නැත. ඔවුන් අපගේ දහම කෙරෙහි සානුකම්පිත ලෙස කටයුතු කරති. අපගේ පූජකයින්ට හා සාන්තුවරයින්ට ගෞරව කරති. අපගේ දෙව්මැදුරු වලට හා ආශ්‍රමයන්ට නොමසුරුව පරිත්‍යාගයන් කරති" (Sir Thomas Arnold 'Invitation to Islam) 102වැනි පිටුව*

'මුස්ලිම් නොවන' සුළුතරය වෙත බලපෑම් කොට ඉස්ලාමය වැළඳගන්නා ලෙස සඳහන් කිසි වාර්තාවක් පිළිබඳව අප කිසි දිනක අසා නොමැත. එලෙසම කිතුනු දහම මුලිනුපුටා දැමීමේ අරමුණින් ක්‍රියාත්මක සංවිධානාත්මක හිංසනයක් පිළිබඳව ද අසා නොමැත. ෆර්ඩිනන්ඩ් හා ඉසබෙලා ස්පාඤ්ඤයෙන් ඉස්ලාමය පිටුදැකීමට කටයුතු කිරීම, ලූයි XIV විසින් රෙපරමාදු පිළිවෙත අනුගමනය කිරීම ප්‍රංශයේ දඬුවම් ලැබිය හැකි අපරාධයක් බවට පත් කිරීම හා එංගලන්තය විසින් වර්ෂ 350 ක කාලයක් සඳහා යුදෙව්වන්ව පිටුවහල් කළ අකටයුතුකම් වලට එරෙහිව යම් කිසි කලීෆාවරයෙකු (පාලකයෙකු) කටයුතු කරන්නට තෝරා ගත්තේ නම් කිතුනු දහම සහමුලින්ම යටපත් කර දමන්නට තිබුණි. එම යුගයේ නැගෙනහිර කිතුනු දෙව්මැදුරු සහමුලින්ම ලොව අනෙකුත් කිතුනුවන්ගෙන් බිඳී තනිව කටයුතු කළහ. ඔවුන්ව කිතුනු දහමේ මිත්‍යාමතිකයින් ලෙස සලකනු ලැබූ හෙයින් ලොව ඔවුන්ට උපකාර කිරීමට කිසිවෙකු නොසිටියහ. වර්තමානය තෙක් ඔවුන්ගේ පැවැත්ම සහතික වී තිබීම ඉස්ලාමීය රාජ්‍යය විසින් ඔවුන් වෙත දැක් වූ සහනශීලිත්වය හා රිස්සීම පිළිබඳ ප්‍රබලතම සාක්ෂිය වන්නේය". (Sir Thomas Arnold 'Invitation to Islam' Page 98,99)

ඉස්ලාමීය රාජ්‍යයන්හි වාසය කළ මුස්ලිම් නොවන්නන් එම රාජ්‍යයන් පිළිබඳව ප්‍රකාශ කොට ඇති ප්‍රකාශයන් ව්‍යාජ ද? නැතහොත් ඔවුන් නොදැනුවත් කමින් පැවසුවා දැ?යි විමසන්නට කැමැත්තෙමු.

එමෙන්ම ඉස්ලාමය විවේචනය කරන්නන් පවසන අයුරින් රට මුස්ලිම්වරුන්ගේ පාලනයට නතු වූ සැණින් අන්‍යාගමිකයින් සියල්ල සමූල ඝාතනය කරන්නේ නම් ලොවේ රටවල් 50 කට ආසන්න රටවල්හි

මුස්ලිම්වරුන්ගේ පාලනයන් සිදුවෙමින් තිබියදී එහි සුළු ජනයා වන මුස්ලිම් නොවන්නන් තවමත් ජීවතුන් අතර සිටීමේ යථාර්ථය කුමක්දැ'යි අසන්නට කැමැත්තෙමු.

## ඉස්ලාමය හා ලොවේ සිදු වූ අනෙකුත් යුද ගැටුම්හි මරණයට පත් වූවන්ගේ යථාර්ථය අපගේ අවධානයට ලක් කළ යුතුයි.

මුහම්මද් තුමාණන්ගේ කාල වකවානුවේ යුද්ධ කිහිපයක් සිදු වී ඇත. එම වසර 23 පුරාවටම දෙපාර්ශවයෙන්ම මරණයට පත් වී ඇත්තේ 1300 කට වඩා අඩු ප්‍රමාණයකි. නමුත් මේවායින් බහුතරය විදෙස් ආක්‍රමණ වලින් තම රට දැය, රාජ්‍යය හා ආගම ආරක්ෂා කර ගැනීමට මුහුණ දුන් යුධ ගැටුම් මිසක් මුස්ලිම්වරුන් විසින් කළ ආක්‍රමණයකින් අත් වූ ඝාතනයන් නොවූ බව අප හොඳින් වටහා ගත යුතු කරුණකි.

කරුණාකොට පහත සඳහන් සංඛ්‍යා ලේඛන වෙත ඔබගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින්නෙමු. 1860-1865 දක්වා පැවති ඇමරිකානු සිවිල් යුද්ධයෙන් 6,28,000 ක්ද පළමු වන ලෝක යුද්ධයෙන් මිලියන 37 ක්ද දෙවන ලෝක යුද්ධයෙන් මිලියන 72.5 ක්ද විය. මෙවන් අපරාධකාරී විනාශයන් මෙහෙය වූවන් මුස්ලිම්වරුන්දැ'යි අසන්නට කැමැත්තෙමු.

එමෙන්ම සෝවියට් විප්ලවයෙන් මිලියන පහක් ද මුස්ලිම්වරුනට එරෙහිව පැවති කුරුස යුද්ධයෙන් මිලියන නවයක් ද කොරියානු යුද්ධයෙන් මිලියන තුනක් ද අශෝක රජු විසින් මෙහෙය වන ලද කාලිංග යුද්ධයේ දී ඝාතන ලක්ෂයක් ද විය. තවද මෑතකදී සිදුකළ අපරාධ අතුරින් ඉරාකයේ කළ විනාශයෙන් කුඩා දරුවන් 50,000 ක්ද බොස්නියා යුද්ධය, ඇෆ්ගන් පලස්තීන විනාශයන් ද විය.

ඉහත සංඛ්‍යා ලේඛන වලට අනුව එවන් සමූල ඝාතන සියල්ල මෙහෙය වූවන් මුස්ලිම් නොවන්නන් වූ අතර ඔබලා විසින් ත්‍රස්තවාදය කියන නාමය උරච්චි කිරීමට උත්සාහ දරන්නේ ඉස්ලාමයට නොවේද? යන්නෙන් අසන්නට කැමැත්තෙමු.

නමුත් පාඨක ඔබ ඉහත කරුණු තුළින් යම් නිගමනයකට පැමිණියද ලොවෙහි වර්තමානයේ සිදු වන ඉස්ලාමීය ප්‍රතිපත්තීන්ට හාත්පසින් වෙනස් මාධ්‍යය විසින් ඉස්ලාමයට ඈන්දවීමට වෙර දරන අයි. එස්. සංවිධානය පිළිබඳව අපව විවේචනයට ලක් කළ හැකි බව අප නිසැකයෙන්ම දන්නෙමු. ලොවේ මුස්ලිම්වරුන් පාලනය කරන රාජ්‍යයන් පනහක් පමණ ඇත. නමුත් අද අපි විසින් අසන ප්‍රශ්නය වන්නේ මෙම මුස්ලිම් රාජ්‍යයන් පනහ අතුරින් අයි. එස්. සංකල්පයට පක්ෂපාතීව කුමන රාජයය ඉදිරිපත් වී ඇත් දැ'යි අවංකව අසන්නෙමු. එසේ කිසිදු රාජ්‍යයක් ඉදිරිපත් වී නැතිනම් අයි. එස්. සංවිධානයේ නාමයෙන් ත්‍රස්තවාදය හා මිනිස් ඝාතනයට අල් කුර්ආනය හා ෂරීආව දිරිගන්වන බව බොරු ප්‍රචාරයන් ඉදිරිපත් කිරීම තුළින් සමාජය භයානක ප්‍රපාතයකට තල්ලු කිරීමට උත්සහ දරන්නේ දැ'යි අසන්නෙමු.

ලොවෙහි ප්‍රථම වරට 2014 ජූලි මස හය වන දින ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් විකාශනය කරන ලද සවිස්තරාත්මක ගුවන් විදුලි වැඩ සටහන මගින් හා 2014 අගෝස්තු මස 30 වන දින නිකුත් කරන මාධ්‍යය ප්‍රකාශනය මගින් "සමස්ත ලංකා ජම්ඉයතුල් උලමා" සංවිධානය විසින් අයි.එස්.අයි.එස්. සංවිධානය ඉස්ලාමයට පටහැනි අන්තවාදි සංවිධානයක් ලෙස හෙළිදරවු කළ බව දන්වා සිටින්නට කැමැත්තෙමු.

අප ඉතා කණගාටුවට පත් වන කරුණක් නම් පෙරාතුවම "සමස්ත ලංකා ජම්ඉයතුල් උලමා" සංවිධානය විසින් අල් කුර්ආන් හා අල් හදීස් අනුසාරයෙන් ප්‍රකාශනයක් සමාජයට ඉදිරිපත් කර තිබියදීත් අල් කුර්ආනය හා අල් හදීස් පිළිබඳ අඩුපාඩු පැවසීමට උත්සුක වීමයි.

## අල් කුර්ආන් හා නබි වදන් වටහා ගැනීම සඳහා පිළිපැදිය යුතු පොදු නීතිරීති

අල් කුර්ආනය පිළිබඳව අර්ථ දැක්වීමක දී අනුගමනය කළ යුතු නීති රීති පිළිබඳව සංක්ෂිප්ත විග්‍රහයක් පහතින් ඉදිරිපත් කොට ඇත්තෙමු. අල් කුර්ආනය හැදෑරීමේදී වැදගත් නීතියක් වූ සන්දර්භයේ වැදගත්කම සඳහා දක්වන පහසු උදාහරණයක් අල් කුර්ආනයෙන්ම පහතින් උපුටා දක්වා ඇත්තෙමු.

"එබැවින් සලාතය (නැමැති නැමදුම) ඉටු කරන්නන් කෙරෙහි විනාශය අත් වේවා!" (අල් කුර්ආන් 107:4)

මෙම අල් කුර්ආන් වැකිය පමණක් කියවා තේරුම් ගන්නා අයෙකු කිසි දිනෙක සලාතය එනම් ඉස්ලාමය ඉගැන්වීම් අනුව දෛනිකව පස් වතාවක් ඉටු කළ යුතු අනිවාර්යය නැමදුම ඉටු නොකරනු ඇත.

මෙම වැකිය නිවැරදිව අවබෝධ කර ගැනීම පිණිස එයට පෙර හා පසු වැකියන් කියවා අවබෝධ කර ගැනීම (සන්දර්භය) අත්‍යාවශ්‍ය වෙයි. එනිසා මෙම වැකියට ආශ්‍රිත 5 හා 6 වැනි වැකියන් විමසා බලමු.

"එබැවින් සලාතය ඉටු කරන්නන් කෙරෙහි විනාශය අත් වේවා!" (අල් කුර්ආන් 107:4)

"ඔවුන්ගේ සලාතය පිළිබඳව නොසැලකිලිමත්ව සිටින්නන් ඔවුන්මය." (අල් කුර්ආන් 107:5)

"(තම ක්‍රියාවන් පිළිබඳව අන් අයට පෙන්වමින්) උජාරුපාන්නන් ඔවුන්මය." (අල් කුර්ආන් 107:6)

විනාශයට යොමු වන ලෙස සලාතය ඉටු කරන්නන් කවරෙකුද යත් නොසැලකිලිමත්ව හා අන් අයට පෙන්වීම සඳහා සලාතය ඉටු කරන්නන් බව එම පරිච්ඡේදයේම 5 හා 6 වැනි වැකියන්ගෙන් ඉතා පැහැදිලිව විග්‍රහ වේ. මේ අනුව අල් කුර්ආනය අවබෝධ කර ගැනීමට නම් පහත සඳහන් වැදගත් නීති රීති පිළිබඳ නිවැරදි දැනුමක් අනිවාර්යයෙන්ම තිබිය යුතු වෙයි.

1. අල් කුර්ආනය අවබෝධ කර ගැනීම පිණිස සන්දර්භය ඉතා වැදගත් වේ. එහෙයින් වැකියක් පිළිබඳ විමසුමක යෙදෙන විට සන්දර්භය කෙරෙහි අවධානය යොමු කිරීම ඉතාම අතවශ්‍ය කරුණකි.

2. අල් කුර්ආනය අවුරුදු 23 ක් තිස්සේ ඒ ඒ අවස්ථාවට අනුකූලව හා අවශ්‍යතාවට අනුව මුළු මිනිස් වර්ගයාගේ මග පෙන්වීම සඳහා ලොව මැවුම්කරුවා විසින් මුහම්මද් තුමාණන්ට පහළ කරනු ලැබීය. එබැවින් අල් කුර්ආනය පිළිබඳව අර්ථ විග්‍රහයක් කිරීමට නම් ඉස්ලාමීය ඉතිහාසය පිළිබඳව ගැඹුරු හා නිවැරදි දැනුමක් තිබීම ඉතා වැදගත් වේ.

මේ ආකාරයෙන්ම නබි වදන් විග්‍රහ කිරීමේදී එම හදීසය 'සහීහ්' ගණයට අයත් නබිවදනක්ද? නැතිනම් 'ළඊෆ්' ගණයට අයත් නබි වදනක් ද? යන්නෙන් හා ඉතිහාසය හා එම අවස්ථාවන් පිළිබඳව දැනුමක් තිබීම අත්‍යාවශ්‍ය වේ. මෙම හදීස් කලාව ඉතා ගැඹුරු කලාවක් වන අතර කෙටියෙන් පවසනවා නම්, 'සහීහ් හදීසය' යනු එම නබිවදන මගින් ඍජුවම යම් නීතියකට එළඹිය හැකිවන අන්දමින් කිසිදු සැකයක් නොමැති වාර්තාකරුවන් හරහා වාර්තා වී තිබෙන නබිවදනය. 'ළඊෆ් හදීසය' යනු එම නබිවදන මගින් ඍජුවම යම් නීතියකට එළඹිය නොහැකිවන අන්දමින් යම් සැකයක් ඇති වාර්තාකරුවන් හරහා වාර්තා වී තිබෙන නබිවදනය.

3. එලෙසම ඇතැම් අල් කුර්ආන් වදන් සඳහා විග්‍රහයන් එහි සන්දර්භයෙන් බැහැර අනෙකුත් අල් කුර්ආන් වදන්හි ද අන්තර්ගතව ඇත. එහෙයින් අල් කුර්ආනය නිවැරදිව අවබෝධ කර ගැනීම පිණිස සම්පූර්ණ අල් කුර්ආනය පිළිබඳව දැනුමක් තිබීම ඉතාම වැදගත් සාධකයක් බව සඳහන් කළ යුතුව ඇත. මත්පැන් තහනම් කිරීම පිළිබඳව අල් කුර්ආන ඉගැන්වීම සම්පූර්ණ ලෙස අවබෝධ කර ගැනීමට නම් මේ සම්බන්ධයෙන් ඇති වැකි සියල්ල එනම් 2:219, 4:43, 5:90 සමස්තයක් වශයෙන් හා එහි කාලවකවානු අනුව අවබෝධ කර ගත යුතු වෙයි. මේ පිළිබඳව ඇති ඉගැන්වීම් අල් කුර්ආනයේ විවිධ පරිච්ඡේදයන්හි අන්තර්ගත වී ඇති අතර සම්පූර්ණ අල් කුර්ආනය පිළිබඳව පූර්ව දැනුමකින් තොරව මේ පිළිබඳව ඇති එක් වැකියක් පමණක් ගෙන විග්‍රහයක යෙදීම විකෘති මතයක් ඇති වීමට නියත වශයෙන්ම හේතු වෙයි.

4. තවත් විටෙක අල් කුර්ආන් වැකි පිළිබඳව විග්‍රහයක් නබි වදන්හි තිබිය හැක. එහෙයින් අල් කුර්ආන් පිළිබඳ නිවැරදි අවබෝධයක් සඳහා නබි වදන් පිළිබඳ දැනුම ද වැදගත් සාධකයකි. සලාතය, උපවාසය, ZසකාතZ හා හජ් වැනි ඉස්ලාමයේ වැදගත් ආගමික පිළිවෙත් පිළිබඳව අල් කුර්ආනය ඉතා කෙටි විග්‍රහයක් ලබා දෙන අතර ඒවා ඉටු කිරීමේ සම්පූර්ණ ක්‍රමවේදය නබි වදන්හි හා එතුමන්ගේ ක්‍රියාවන්හි අන්තර්ගත වී ඇත.

5. අල් කුර්ආන් වැකි පහළ කළ ඓතිහාසික සන්දර්භය හා හේතුව (අස්බාබ් අල් නුසුල්) දැන සිටීම ද වැදගත් වේ. කවුරුන් සඳහා කුමන අවස්ථාවක කුමක් සඳහා පහළ කරන ලද්දේ ද යන්න පිළිබඳව නිවැරදි දැනුමක් අනිවාර්යයෙන්ම තිබිය යුතුය. ඉදිරි විග්‍රහයන් මගින් මේ පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට හැකි වනු ඇත.

6. අල් කුර්ආනයේ අරාබි භාෂා යෙදුම ඉතාම උත්තරීතර තත්ත්වයකින් යුක්ත වන අතර එයට සම කළ හැකි භාෂා ශෛලියක් මුළු අරාබි සාහිත්‍යයේම නොමැති බව මුස්ලිම් හා මුස්ලිම් නොවන අරාබි භාෂා විද්වතුන්ගේ මතයයි. එම භාෂා දැනුම නොමැතිව අල් කුර්ආනයට අර්ථ දැක්වීම් ඉදිරිපත් කිරීම බරපතළ අර්ථ විකෘති වීම් වලට හේතු විය හැක. එහි යොදා ඇති වාක්‍යයන් පිළිබඳව අර්ථ රාශියක් තිබිය හැකි අතර පරිපූර්ණ අල් කුර්ආන් පිළිබඳ සම්මත නීති රීතීන් (Sciences of Al Quraan) නොදැන අර්ථ දැක්වීම නුසුදුසු ක්‍රියාවකි.

7. අල් කුර්ආන් අර්ථ දැක්වීම පිළිබඳ විද්වතුන්ගේ හා අනෙකුත් ඉස්ලාමීය විද්වතුන්ගේ විග්‍රහයන් ද ඉතාම වැදගත්ය. රටක ක්‍රියාත්මක සාමාන්‍ය නීතිය විග්‍රහ කිරීමේදීත් එම නීතිය සම්පාදනය කිරීමට හේතු වූ පසුබිම, එය එක් සංසිද්ධියක් උදෙසා පමණක් සීමා වුවක් ද, එම නීතිය සම්මත කිරීමේදී ඉදිරිපත් කරන ලද අරමුණු, එම නීතිය උපයෝගී කරගනිමින් දෙන ලද නඩු තීන්දු, නීති විශාරදයින් විසින් දෙන ලද විග්‍රහයන් හා එම නීතියට අදාළ භාෂාමය විග්‍රහය ආදිය ගැන සලකා බැලීම සාමාන්‍ය සම්ප්‍රදායකි. එසේ නොකොට මෙම ආගමික ග්‍රන්ථයන්හි අඩංගු වැකියක් දෙකක් පමණක් උපුටා දක්වා සම්පූර්ණ දහමම ඒ තුළ අන්තර්ගත කොට නිග්‍රහාත්මකව අර්ථ දක්වන්නෙක් කෙතරම් බරපතළ වැරැද්දක් කරන්නේ ද යන්න පිළිබඳව කා හට නම් මත වෙනසක් තිබිය හැක්කේ ද?

**(9) චෝදනාව** : කුරාණය 48:29

"මොහොමද් අල්ලාහ් විසින් පත්කළ නබිවරයාය. ඔහුගේ අනුගාමිකයෝ අනිවාර්යයෙන් ම ඉස්ලාමය විශ්වාස නොකරන්නන්ට විරුද්ධව සාහසික වන අතර ඔවුනොවුන්ට (අනුගාමිකයින් අතර) කරුණාබර විය යුතුය".

**විග්‍රහය:** පළමුව මෙම වැකියේ වඩාත්ම නිවැරදි සිංහල අර්ථ දැක්වීම කෙරෙහි අවධානය යොමු කරමු.

"මුහම්මද් අල්ලාහ්ගේ රසූල්වරයාය(පණිවිඩකරුය). ඔහු සමග සිටියවුන් ප්‍රතික්ෂේපකයින් කෙරෙහි ඉතා දැඩිව ද ඔවුන් අතර කරුණාවන්තයින් ලෙසද සිටිති." (අල් කුර්ආන් 48:29)

මෙහි දක්වා ඇති ප්‍රතික්ෂේපකයින් කවුරුන් ද යන්න අවබෝධ කරගැනීම පිණිස මෙම පරිච්ඡේදයේ 25 වැනි වැකියේ සිට කියවිය යුතුව ඇත. එම වැකි කිහිපයෙහි පරිවර්තනය පහතින් උපුටා දක්වන්නෙමු.

"(48:25) ඔවුන්මය (අල්ලාහ්ව) ප්‍රතික්ෂේප කර, නුඹලාව මස්ජිදුල් හරාමය වෙතින් ද හද්ය (නම් කැප කරන්නාවූ සතුන්) නියමිත ස්ථානයට රැගෙන විත් ගාල් කරනු ලැබීමෙන් ද වැළැක්වූයේ. නුඹලා නාඳුනන විශ්වාසික පිරිමින් හා විශ්වාසික ස්ත්‍රීන් (මක්කහ්වෙහි) සිටිය දී නුඹලා (යුද්ධ කර) ඔවුන්ව පාගා (විනාශ කොට, ඒ හේතුවෙන් නුඹලා) නොදැනුවත්වම නුඹලාට පවක් සිදුවීමට ඉඩ තිබුණි. (මෙසේ නොවූයේ) අල්ලාහ් අභිමත කළ අයව ඔහුගේ කරුණාවෙහි ඇතුළු කරනු පිණිසය. (මක්කහ්වෙහි සිටි විශ්වාසික) ඔවුන් (ප්‍රතික්ෂේපකයින්ගෙන්) වෙන් වූයේ නම් ඔවුන් අතුරින් ප්‍රතික්ෂේප කළවුන්ව අපි වේදනීය දඬුවමකින් දඬුවම් දී ඇත්තෙමු. (26) ප්‍රතික්ෂේප කළවුන් තමන්ගේ හදවත්හි උද්ධච්චකම වන අඥානයේ උද්ධච්චකම ඇති කර ගත් කල්හි අල්ලාහ් තම ශාන්තභාවය ඔහුගේ රසූල්වරයා කෙරෙහි ද විශ්වාසිකයින් කෙරෙහි ද පහළ කළේය. තවද ඔහු ඔවුන්ව බිය භක්තියේ වදනට[5] බැඳීමක් ඇති කළේය. තවද ඔවුහු එයට ඉතා සුදුස්සන් හා එයට හිමි කරුවන් වූවෝය. තවද අල්ලාහ් සියලු දෑ කෙරෙහි සර්වඥ විය. (27) සැබැවින්ම අල්ලාහ් ඔහුගේ රසූල්වරයාට සත්‍යයෙන් යුතු වූ සිහිනය සැබෑ කළේය.[6] (එනම්) අල්ලාහ් අභිමත කළේ නම් නුඹලා සුරක්ෂිත වූවන් ලෙස ද නුඹලාගේ හිස් මුඩු කළවුන් හා කොට කළවුන් ලෙස ද නුඹලා බියෙන් තොරව ද මස්ජිදුල් හරාමයට ඇතුළු වන්නෝමය. එබැවින් නුඹලා නොදැන සිටි දෑ ඔහු දන්නේය. තවද ඒ හැර (හයිබර්හි) සමීප ජයග්‍රහණයක් ද ඔහු ඇති කළේය. (28) සෑම දහමකටම වඩා මෙය(ඉස්ලාමය) ශ්‍රේෂ්ඨ කරවීම පිණිස මග පෙන්වීම හා සත්‍ය දහම සමග තම රසූල්වරයාව එව්වේ ඔහුමය. තවද සාක්ෂි දරන්නෙකු වශයෙන් අල්ලාහ් ප්‍රමාණවත්ය.

(29) මුහම්මද් අල්ලාහ්ගේ රසූල්වරයාය. ඔහු සමග සිටියවුන් ප්‍රතික්ෂේපකයින් කෙරෙහි ඉතා දැඩිව ද ඔවුන් අතර කරුණාවන්තයින් ලෙසද සිටිති."

---

5) භක්තියේ වදන යනු 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නොමැත යන්නයි.

6) මුහම්මද් තුමාණන් තම සගයින් සමග මක්කහ්වේ පිහිටි ශුද්ධ වූ මස්ජිදයට ගොස් උම්රා වන්දනාව ඉටු කර එහි අවසන් පිළිවෙත වන හිස මුඩු ගා සිටීම සිහිනයෙන් දුටුවේය. නබිවරුන්ගේ සිහින සත්‍ය දේව පණිවිඩයක් වන හෙයින් මෙම සිහිනය මුස්ලිම්වරුන් උම්රහ් වන්දනාව ඉටු කරනු ඇත යන්නට අනාවැකියක් වුව ද එය සිදු වන කාලය පිළිබඳව කිසියම් හෝ ඉඟියක් නොවීය. එහෙයින් මෙම උම්රහ් වන්දනාව එම වසරෙහිම ඉටු කළ යුත්තක් යැයි සිතූ මුහම්මද් තුමාණන්, තම සගයින්ගෙන් විශාල පිරිසක් සමග මක්කා නගරය කරා පිටත් විය. නමුත් මුහම්මද් තුමාණන් හුදෙයිබියා පිටියෙහි සිදු වූ ගිවිසුමට අත්සන් තැබීමට එකඟ වූ හෙයින් උම්රහ් වන්දනාව ඉටු කරන්නට නොහැකි විය. මුහම්මද් තුමාණන් දුටු සිහිනය එම වසරෙහිම සිදු නොවුව ද වර්තමානයේ එම සිහිනය සැබෑ වනු ඇත යැයි අල්ලාහ් මෙම වැකිය තුළින් පවසන්නේය. එසේම ඊළඟ වසරෙහිම ඔවුන් සියල්ල උම්රහ් වන්දනාව පරිපූර්ණ කළෝය. එය 'උම්රතුල් කලා' යැයි හඳුන්වන ලදී.

මෙම වැකිය පහළ වීමට හේතු වූ ඓතිහාසික සාධක මෙම වැකිවලින් විස්තර වේ. මුහම්මද් තුමාණන් හා පිරිස ඉස්ලාමීය දින දර්ශනයේ හය වන වසරේ නිරායුද ව ආගමික වතාවත් සඳහා මදීනා නගරයේ සිට මක්කා නගරය වෙත ළඟා වෙමින් සිටින අවස්ථාවේ හුදෛබියා නම් ස්ථානයේ දී මක්කාවේ විසූ ප්‍රතික්ෂේපකයින් විසින් මෙම පිරිස ඉදිරියට යෑම වළක්වන ලදී. මෙමගින් ඔවුන් ඉටු කිරීමට පැමිණි ආගමික වතාවත් අතහැර දැමීමට සිදුවිය. මෙම පීඩාකාරී වාතාවරණය යටතේ දෙපාර්ශවය විසින් සාකච්ඡා කොට මුස්ලිම්වරුන්ට ඉතා අවාසිදායක ලෙස පෙනෙන්නට තිබුණු ගිවිසුමකට අත්සන් කොට ආපසු හැරී එන්නට සිදු විය. මෙම වැකිය පහළ වන්නේ ගිවිසුම අත්සන් කොට එසේ හැරී ආපසු එමින් සිටියදීය. මෙලෙස මුස්ලිම්වරුන්ව තම ආගමික වතාවත් ඉටු කිරීමෙන් වළක්වා ඉතා අසාධාරණ කොන්දේසි සහිත ගිවිසුමකට අත්සන් කිරීමට කටයුතු කළ ප්‍රතික්ෂේපකයින් පිළිබඳවයි මෙම වැකියේ සඳහන් වන්නේ. මෙම පසුබිම අවබෝධ කරගන්නේ නැතිව තම සිතැගියාවට අනුව වචන යොදමින් අල් කුර්ආන් වැකි වලට අර්ථ දැක්වීමට යෑම තම නොදැනුවත්කම ප්‍රදර්ශනය කිරීමක් පමණි.

**(10) චෝදනාව** : කුරාණය 3:85

"තවද කිසිම පුද්ගලයෙකු ඉස්ලාමය හැර වෙනත් ආගමක් තෝරා ගන්නේ ද හෝ ඇළුම් කරන්නේ ද, ඉස්ලාමය කිසිලෙසකින්වත් එය පිළිගන්නේ නැත. (එනම් එවැනි නිදහසකට ඉස්ලාමයේ ඉඩක් නැත).

**විග්‍රහය** : පළමුව මෙම අල් කුර්ආන් වැකියේ වඩාත් නිවැරදි සිංහල අර්ථ දැක්වීම කෙරෙහි අවධානය යොමු කරමු.

"ඉස්ලාම් නොවන (අන්) දහමක් කවරෙකු සොයන්නේද එය ඔහුගෙන් පිළිගනු නොලබන්නේමය. තවද ඔහු මතු ලොවෙහි අලාභවන්තයින්ගෙන් (කෙනෙකු) වන්නේය." (අල් කුර්ආන් 3:85)

මෙම මතය ඉස්ලාමයට පමණක් සීමාවූවක් ලෙස දක්වමින් චින්තන නිදහසට ඉස්ලාමය තුළ ඉඩක් නොමැති බව විදහා දක්වන්නට බොළඳ උත්සාහයක් මෙමගින් ගෙන ඇත. ඉස්ලාමය තුළින් මිනිසායේ බුද්ධියට සීමාවන අන්දමින් චින්තන නිදහස ලබා දී ඇති බව ආරම්භයේ අප ඉදිරිපත් කළ කරුණු තුළින් පාඨක ඔබට වැටහී ඇතැ'යි විශ්වාස කරන්නෙමු.

සර්ව බලධාරී අල්ලාහ් සර්ව ලෝ මවා පරිපාලනය කොට පරිපෝෂණය කර මෙතරම් විශිෂ්ඨ දායාදයන් මිනිසාට දායාද කර තිබියදී, මිනිසා තම සැබෑ මැවුම්කරු පසෙකලා වෙනතකට යොමු වීම කිසිසේත්ම පිළිගත නොහැක්කකි. නිදසුනක් ලෙස තමන්ව ඇතිදැඩි කළ තම දෙමාපියන්ට අකීකරු වී ඔවුනට ද්‍රෝහී වෙමින් කටයුතු කරන පුතෙකු මෙන් ය.

ඇතැම් විවේචකයින් ඉස්ලාම් දහමට පමණක් ඇඟිල්ල දිගු කළ ද මෙවැනිම මතයක එම විවේචකයින්ම සිටින්නේ යන්න වටහා ගැනීමට අකමැත්තෙන් හෝ පහත සඳහන් කොටස ඔබගේ අවධානය පිණිස ඉදිරිපත් කිරීමට අපට සිදු වී ඇත.

## මිත්‍යා දෘෂ්ටි කර්මයාගේ විපාකාදිය

පහත සඳහන් කොටස මහාචාර්ය රේරුකානේ චන්ද්‍රවිමල මහනාහිමි විසින් රචිත "බෞද්ධයාගේ අත්පොත" ග්‍රන්ථයෙන් උපුටා ගත්තෙමු. මෙම ග්‍රන්ථයේ මිත්‍යා දෘෂ්ටිය පිළිබඳ බොහෝ විස්තර ඉදිරිපත් කොට ඇත.

"නාහං භික්ඛවේ, එකධම්මම්පි සමනුපස්සාමි යං එවං මහාසාවජ්ජං: යථයිදං භික්ඛවේ මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨි පරමා භික්ඛවේ වජ්ජානීති"

"මහණෙනි, මේ මිත්‍යා දෘෂ්ටිය යම් බඳු ද එසේ මහාසාවද්‍ය වූ අන් එකම ධර්මයෙකු දු මාගේ සර්වඥතාඥානයෙන් නොදකිමි. මිත්‍යා දෘෂ්ටිය වරදවල් අතුරෙන් සියල්ලට ම මහත් වරද වේයැ'යි තථාගතයන් වහන්සේ වදාළ සේක. (මහාචාර්ය රේරුකානේ චන්ද්‍රවිමල මහනාහිමි විසින් රචිත " බෞද්ධයාගේ අත්පොත: 78 වැනි පිටුව).

## මිත්‍යා දෘෂ්ටියෙහි විපාක

"මේ මිත්‍යා දෘෂ්ටිය වනාහි මහා සාවද්‍ය වූ අකුසල කර්මයකි. ඒ බව බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායෙහි මෙසේ දේශනා කොට ඇත. "මහණෙනි, මේ මිත්‍යා දෘෂ්ටිය තරම් මහා සාවද්‍ය වූ අන් එකද

ධර්මයක්වත් මගේ බුදු ඇසින් මම නොදකිමි. එහෙයින් මේ මිත්‍යා දෘෂ්ටිය අතිශයින්ම බරපතළ වූ මහා වරදකි. අකුසලයකි" යනුයි.

සාමාන්‍යයෙන් මේ මිත්‍යා දෘෂ්ටිය නම් වූ අකුසල කර්මයෙහි යෙදුණු පුද්ගලයෙක් වේ නම්, ඔහුට මේ සසරින් එතෙර වීමට අවකාශයක් නැත්තේය. සතර අපා ආදියෙහි වෙසෙන සත්වයෝ පවා කල්ප විනාශය වන කල්හි ආභස්සර බ්‍රහ්ම ලෝකයෙහි උපදිති. එහෙත් නියත මිසදිටුවාට ඒ කාල සීමාවෙහි පිටසක්වළ එක්තරා අපායක දුක් විඳීමට සිදු වන්නේය".(කර්මය හා විපාකය - 1 කාණ්ඩය 11 වැනි පිටුව - අභිධර්ම විශාරද ලසන්ත රත්නගොඩ)

එහෙයින් මෙවන් කරුණු පිළිබඳ විශ්වීය සම්මතක් ඇති හෙයින් ඒවාට චෝදනා එල්ල කිරීම උගතුන්ට නුසුදුසු යැයි අප සිතන්නෙමු. මෙවැනි ඉගැන්වීම් තුළ සියලු ආගම් අතර අනෙකාව හඳුනාගනිමින් අනෙකාගේ අදහසට ගරු කරමින් අවබෝධයෙන් ආගමික සංහිඳියාවක ජීවත් වීම ඉතා සුදුසු යැයි අප සිතන්නෙමු.

## (11) **චෝදනාව** : කුරාණය 8:39

"තවද (මුළු ලොව පුරාම) අල්ලාහ්ගේ ඉස්ලාමය පමණක් ඉතිරිවන ලෙස <u>අනෙකුත් සියළුම ආගම්, ජීවන රටා, ඇදහිලි, චාරිත්‍ර වාරිත්‍ර, සංස්කෘතීන්, සම්ප්‍රදායන් සහ නීතිරීති (FITNAH)</u> භූමියෙන් විනාශකොට අතුගා දමන තුරු (මුළු ලොව පුරාම) සියළුම අන්‍යාගමිකයින්ට විරුද්ධව සටන් කරන්න. ඔවුන් තම ආගම් අතහැර ඉස්ලාමය වැළඳගන්නේ නම්, අල්ලාහ්ට ඔවුන් කරන්නා වූ සියල්ල පෙනෙන්නේය".

**විග්‍රහය** : පළමුව මෙම කුර්ආන් වැකියේ වඩාත් නිවැරදි අර්ථ දැක්වීම කෙරෙහි යොමු වෙමු.

"<u>භීෂණය තුරන්ව ගොස්</u> දහම සම්පූර්ණයෙන්ම අල්ලාහ්ට සතුවන තෙක් ඔවුන් සමග නුඹලා සටන් වදිවු. ඔවුන් (භීෂණයෙන්) වැළකුණේ නම්, (ඔවුන් සමග නුඹලා සටන් නොවදිවු.) එවිට සැබැවින්ම අල්ලාහ් ඔවුන් කරමින් සිටි දෑ පිළිබඳව සර්ව සුපරීක්ෂාකාරීය." (අල් කුර්ආන් 8:39)

අප වෙත චෝදනාවක් වශයෙන් ඉදිරිපත් කොට තිබූ පරිවර්තනයත් ඉහතින් දී ඇති පරිවර්තනයත් කරුණාකර සසඳා බලන ලෙස කාරුණිකව ඉල්ලා සිටින්නට කැමැත්තෙමු. ආගමික ග්‍රන්ථ සම්බන්ධයෙන් මෙලෙස ද්වේශසහගත අයුරින් විකෘති කොට ඉදිරිපත් කිරීම කිසිදු දහමක් අනුමත කරන්නක් නොවේ. ඉහත චෝදනාවේ ඇති කොටස කියවන මුස්ලිම් නොවන ශ්‍රී ලාංකිකයෙකුගේ සිතේ ඉස්ලාමිකයින් පිළිබඳව ඇතිවන්නේ කුමන ආකාරයේ හැඟීමක් ද යන්න කරුණාකර මොහොතක් සිතා බලන්න. වෛරය හා ක්‍රෝධය පදනම් කරගෙන කරන්නා වූ මෙවන් ද්වේශ සහගත ප්‍රචාර තරයේ හෙළා දකින්නෙමු.

මෙම වැකිය පහළ කරනු ලැබුවේ මුහම්මද් තුමාණන් අවුරුදු 13ක් ම ප්‍රතික්ෂේපක මක්කාවාසී කුරෙෂ් නායකයින්ගේ අති භයානක භීෂණය හා හිංසනය දරාගත නොහැකිව මදීනා නගරයට දේශාන්තරණය කිරීමෙන් පසු මෙම කුරෙෂ් නායකයින් විශාල හමුදාවක් සමග මදීනා නගරය ආක්‍රමණය කිරීමට පැමිණි මදීනා නගරය අසල ඇති බද්ර් නම් ස්ථානයේ සිදුවූ පළමු යුද ගැටුම පදනම් කරගෙනය. මෙම වැකියේ "ෆිත්නා" යන අරාබි පදයට චෝදනා ඉදිරිපත් කරන්නන් දී ඇති අර්ථ ලැයිස්තුව ඕනෑම අයෙකු මවිතයට පත් කරවන්නකි. මෙම බද්ර් යුද්ධය ඇති වන්නේ ආක්‍රමණකාරී කුරෙෂ් ප්‍රතික්ෂේපකයින් විසින් කළ යුද මෙහෙයුම හේතුවෙනි. මෙම වැකියේ සඳහන් වන්නේ එම ආක්‍රමණකාරී කුරෙෂ් ප්‍රතික්ෂේපකයින් පිළිබඳවය. මෙම වැකියෙහි අල්ලාහ් මුස්ලිම්වරුන්ට සටන් වදින මෙන් අණ කොට ඇත්තේ ඉහත සඳහන් පරිදි ඔවුන්ට නිදහසේ තම දහම ඇදහීමට බාධා හා හිංසා කරමින් සිටි එම මක්කාවාසී ප්‍රතික්ෂේපකයින්ට එරෙහිව ඉස්ලාම් දහම ඇදහීමට හැකිවන තත්ත්වයක් උදාවන තුරු ප්‍රයත්නයක් දරණ මෙන්ය. මේ අනුව බැලූ කල මෙම වැකිය පොදුවේ සෑම මුස්ලිම් නොවන්නෙකුම ආමන්ත්‍රණය නොවන්නක් බව කියවන ඔබට පහසුවෙන් වැටහෙනු නියතය.

## (12) **චෝදනාව** : කුරාණය 9:05

"තවද ශුද්ධ වූ මාස 4 පසු වූ පසු වූ වහාම, පිළිම වන්දනාකරුවන් සහ බහු දේවවාදෙන් දුටු දුටු තැන කපා කොටා ඝාතනය කරන්න. එසේම ඔවුන්ව වටලා අල්ලාගෙන බැඳ දමන්න. එසේම ඔවුන් යන එන තැන්වල මග රැකසිට කඩා පැන පහර දෙන්න.(Ambush), එවිට එම හිංසනයෙන් පීඩාවට පත්වී ඉවසාගනු

නොහැකිව) ඔවුන් තම ආගම අතහැර අල්ලාහ්ගේ ආගම (ඉස්ලාමය) වැළඳ ගන්නේ නම් එවැනි අයව තෝරා මුදා හරින්න. අල්ලාහ් සමාව දෙන්නාය, අල්ලාහ් මහා කාරුණිකයාය".

**විග්‍රහය** : අල් කුර්ආනයේ 9 වැනි පරිච්ඡේදයේ 5 වැනි වැකිය පිළිබඳ විවේචනයකින්, අවලාදයකින් තොරව ජාතික මෙන්ම ජාත්‍යන්තර ඉස්ලාම් භීතිකා වෙබ් අඩවියක් හෝ අනෙකුත් ඉස්ලාම් විරෝධී ප්‍රචාරයක් දකින්නට නොමැති තරම් යැයි පැවසීම සත්‍යය වශයෙන්ම අතිශයෝක්තියක් නොවේ. ඉංග්‍රීසි බසින් ඇති වෙබ් අඩවි මෙම වැකිය හඳුන්වා දී ඇත්තේ "අසිපතේ වැකිය" (Verse of the Sword) ලෙසටය. ලොව වසනා ඕනෑම පිළිම වන්දනාකරුවෙකු ඝාතනය කිරීමට මෙම වැකිය මගින් විවෘත අවසරයක් හා අනුමැතියක් ලබා දී ඇති බව ඔවුන් චෝදනා කරති. මෙමගින් විශේෂයෙන්ම මෙරට බෞද්ධ ජනයාගේ සිත්සතන්හි පදනම් විරහිත අනිසි බියක් හා පිළිකුලක් ඉස්ලාමය හා මුස්ලිම්වරුන් පිළිබඳව ඇති කිරීමට මෙම වෛරය හා ක්‍රෝධය වැපිරීමේ කාර්යයෙහි නියැළී සිටින්නන් සිදු කරමින් සිටිති. මෙම කපටි ව්‍යායාමය පරාජය කොට සත්‍යය කුමක් ද යන්න පැහැදිළි කිරීම අපගේ වගකීම බවට පත් ව ඇත. මෙම අපේක්ෂාව පදනම් කරගනිමින් එම වැකියට පසුබිම් වූ ඓතිහාසික සිදුවීම් මෙන්ම එම වැකියේ සන්දර්භයේ ඇති අනෙකුත් වැකි පිළිබඳ විග්‍රහයක් පහතින් ඉදිරිපත් කර ඇත්තෙමු.

විකෘති කොට ඉදිරිපත් කරන ලද එම වැකියේ නිවැරදි පරිවර්තනය අනුව අර්ථ දක්වා ඇති අයුරු පහතින් දක්වා ඇත්තෙමු.

"තහනම් මාසයන් ඉක්ම ගිය පසු (නුඹලා සමග යුද වැදී සිටින) ආදේශකයින්ව දුටු තැන කපා දමවු. ඔවුන්ව සිරභාරයට ගනිවු. ඔවුන්ව වටලවු. ඔවුන් සැගවෙන සෑම තැනකම ඔවුන් වෙනුවෙන් සැගවී සිටිවු. ඔවුන් (ඔවුන්ගේ අපරාධයන්ගෙන් ද ප්‍රතික්ෂේපයෙන් ද) පසුතැවිලි වී වැළකී (විශ්වාස කර) සලාතය ද පිළිපැද සකාත් ගෙවුවහොත් ඔවුන්ව ඔවුන්ගේ මාර්ගයෙහි අත හරිනු. සැබැවින්ම අල්ලාහ් අති ක්ෂමාශීලීය හා අති කරුණාභරිතය." (අල් කුර්ආන් 9:5)

මෙම අල් කුර්ආන් වැකිය චෝදනාවක් ලෙස අප වෙත ඉදිරිපත් කොට ඇති ආකාරය හා නිවැරදි පරිවර්තනය අතර ඇති වෙනස් කම් හා විකෘති කිරීම් ඉතා පැහැදිලිව ඕනෑම අයෙකුට ඉතා පහසුවෙන් අවබෝධ කර ගත හැකි වනු ඇතැ'යි විශ්වාස කරන්නෙමු. නිශ්චිත ඓතිහාසික සන්දර්භානුගත සිදුවීමක් පමණක් පදනම් කරගෙන පහළ වූ මෙම වැකියේ කරුණු සියලුම මුස්ලිම් නොවන්නන්ට එරෙහිව සැමදා සැම විට සැම තැන බලගැන්විය යුතු අදහසක් හැටියට හුවා දක්වන්නට දරා ඇති බොළඳ උත්සාහය සත්‍යය වශයෙන්ම තම සිතේ ඇති මුස්ලිම් විරෝධය මනාව හෙළිදරවු කරන්නකි. මෙම වැකියේ නිවැරදි අර්ථ දැක්වීම හා විග්‍රහය පහතින් ඉදිරිපත් කොට ඇත්තෙමු.

මෙම අල් කුර්ආන් වැකිය පහළ වීමට හේතු වූ ඓතිහාසික පසුබිම පළමුව තේරුම් ගත් විට මෙම වැකියෙහි නිවැරදි අර්ථය අවබෝධ කර ගැනීම පහසු වනු ඇත.

ඒක දේවත්වය වෙත හා සාරධර්ම සපිරි සමාජ ප්‍රතිසංස්කරණය උදෙසා මුහම්මද් තුමාණන් කළ ඇරයුම මක්කා වාසී කුරෛෂ් ගෝත්‍රිකයින්ගේ දැඩි විරෝධයට ලක් වූ අතර එතුමාගේ දේශනයන් පිළි ගත් දුබල, දිළිඳු බහුතරයකට අනේක විධ වද හිංසාවන්ට මුහුණ පෑමට එම කාලවකවානුවේ දී සිදු විය.

මෙම තත්ත්වය තුළ වසර දහතුනක් වැනි දීර්ඝ කාලයක් මක්කා වැසියන්ගේ දැඩි තාඩන පීඩනයන්ට මුහුණ දෙමින් කටයුතු කිරීමෙන් අනතුරුව එතුමාට හා මුස්ලිම්වරුන්ට මක්කාව අතහැර මදීනා නගරයට දේශාන්තරණය කිරීමට පසුබිම සකස් වී තිබුණි. මදීනා නගරයට දේශාන්තරණය කිරීමෙන් පසුවත් මුස්ලිම්වරුන්ට එරෙහිව හමුදා මෙහෙයුම් කිහිපයක් දියත් කළහ. 'බද්ර්','උහුද්' හා 'හන්දක්' නමින් හැඳින්වෙන හමුදා ප්‍රහාරයන් මෙයින් කිහිපයකි. මුහම්මද් තුමාණන් හා පිරිස මදීනා නගරයට දේශාන්තරණය කිරීමෙන් පසු හයවන වසරේ දී මක්කා නගරයට පැමිණ 'උම්රා' (මක්කා වේ මස්ජිදුල් හරාම් පල්ලිය ආශ්‍රිතව සිදු කරන ඉස්ලාමයේ එක් නැමදුමක්) වතාවත් ඉටු කිරීමට කටයුතු කළ අවස්ථාවේ දී හුදෛබියා නම් වූ ස්ථානයේ දී ඔවුන්ව වළක්වාලීමට මක්කාවේ ඉස්ලාම් විරෝධීන් විසින් කටයුතු කරන ලදී. මෙතැන දී ඇති වූ අති පීඩාකාරී තත්ත්වය මත මුස්ලිම්වරුන්ට ඉතා අවාසි සහගත බව පෙනෙන්නට තිබූ සටන් විරාම ගිවිසුමක් අත්සන් කරන ලදී. එම ගිවිසුමද එයට වර්ෂ එකහමාරක දී මක්කා වාසීන් විසින් බිඳ දමන ලදී.

ඉහත සඳහන් ගිවිසුම අනුව මක්කාවාසී කුරෛෂ් ගෝත්‍රිකයින් හා මුස්ලිම්වරුන් අතර සටන් විරාමයක් සඳහා එකඟතාවකට එළඹෙන ලදී. මේ අනුව කුරෛෂ් ගෝත්‍රිකයින් හා ඔවුන්ට සහය දක්වා ගිවිසුම් ගත වී සිටි ඔවුන්ගේ පාක්ෂික ගෝත්‍රිකයින් සමග ද මුස්ලිම්වරුන් සටන් විරාම ගිවිසුමේ කොන්දේසි රැකිය යුතු විය. අනිත් අතින් මුස්ලිම්වරුන් සමග සාම ගිවිසුම් අත්සන් කොට තිබූ මුස්ලිම්

නොවන ගෝත්‍රිකයින් ද කුරෛෂ්වරුන් හා ඔවුන්ගේ පාක්ෂික ගෝත්‍ර සමග මෙම සටන් විරාම ගිවිසුමේ කොන්දේසි රැකිය යුතු විය. වැඩිකල් නොගොස් කුරෛෂ් පාක්ෂික බනූ බක්ර් ගෝත්‍රිකයින් විසින් මුස්ලිම්වරුන් සමග ගිවිසුම් ගත ව සිටි මුස්ලිම් නොවන බනූ කුzසාආ ගෝත්‍රිකයින්ට පහර දී එම ගෝත්‍රයේ බොහෝ දෙනෙකුව ඝාතනය කරන ලදී. සටනට පිවිසි මෙම දෙපාර්ශවය මැද සිටි කුරෛෂ්වරුන් විසින් ප්‍රහාරය ආරම්භ කළ ඔවුන්ගේ බනූ බක්ර් පාක්ෂිකයින්ව පාලනය කොට මෙම ගැටුම සමතයකට පත් කරනු ඇතැ'යි මුස්ලිම්වරුන් විසින් අපේක්ෂා කරන ලදී. නමුත් ඓතිහාසික සාක්ෂි අනුව කුරෛෂ් ගෝත්‍රිකයින් විසින් මුස්ලිම්වරුන් සමග එකඟ වූ ගිවිසුම උල්ලංඝනය කරමින් තම පාක්ෂික බනූ බක්ර් ගෝත්‍රිකයින්ට අවි හා තම සාමාජකයින්ගේ සහාය හා සහභාගිත්වය ද ලබා දෙමින් මුස්ලිම්වරුන් සමග ගිවිසුම් ගතව සිටි මුස්ලිම් නොවන බනූ කුzසාආ ගෝත්‍රිකයින්ව ඝාතනය කිරීමට කටයුතු කරන ලදී. මේ අනුව කුරෛෂ්වරුන් විසින් මුස්ලිම්වරුන් සමග එකඟ වූ ගිවිසුම කඩ කිරීමේ පළමු පියවර කුරෛෂ්වරුන් විසින් සිදු කරනු ලැබීය.

මෙම ගැටුම සම්පූර්ණයෙන්ම මුස්ලිම් නොවන ගෝත්‍රිකයින් අතර හටගත් එකකි. මුස්ලිම්වරුන්ගේ අපේක්ෂාව මුස්ලිම් නොවන්නන් ඝාතනය කිරීමක් නම් මෙම තත්ත්වය පිළිබඳව මුස්ලිම්වරුන්ට කරන්නට තිබූ වඩාත් උචිත පියවර වූයේ නිහඬ නිරීක්ෂකයින් බවට පත්වීම පමණි. නමුත් එකඟ වූ ගිවිසුම් ආරක්ෂා කිරීම ඉස්ලාමීය ආචාර ධර්ම අතර ප්‍රධාන තැනක් ගැනෙන්නක් හෙයින් ඔවුන් සමග ගිවිසුම් ගතව සිටි මුස්ලිම් නොවන බනූ කුzසාආ ගෝත්‍රිකයින්ගේ සහායට ඒම මුස්ලිම්වරුන්ගේ වගකීමක් විය. මුස්ලිම් භීතිකා ව්‍යාපාරිකයින්ගේ මුසාවාද ප්‍රචාරය හිරු දුටු පිනිබිඳක් ලෙසින් වාෂ්ප කොට හැරීමට මෙම ඓතිහාසික සත්‍යය පමණක් ප්‍රමාණවත්ය. එසේ පවසමින් වඩාත් සවිස්තරාත්මක විග්‍රහයක් පහතින් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන්නෙමු.

මෙහි සඳහන් ඉස්ලාම් විරෝධීන්ගේ ක්‍රියාකලාපයන් කෙලෙසකවත් මක්කා නගරයේ ආරක්ෂාව සඳහා යෝග්‍යය නොවන බව ඉහත සඳහන් කරුණු වලින් මනාව පැහැදිලි වෙයි. ගිවිසුම් කඩ කරමින් නිතර ප්‍රහාරයන් එල්ල කරමින් විශ්වාස ද්‍රෝහී ලෙස කටයුතු කිරීම හේතුවෙන් ඔවුන් සමග සහවාසය ඉතා අවදානම් ක්‍රියාවක් බව පැහැදිලිව පෙනෙන්නට තිබූ හෙයින් ඔවුන්ට මක්කා නගරයෙන් ඉවත් වීමට මාස හතරක් කල් දෙනු ලැබීය. මෙම කල් දීම පිළිබඳව සඳහන් අල් කුර්ආන් වැකි මක්කාවේ ජනයාට පාරායනය කර පෙන්වීමට මුහම්මද් තුමාණන් විසින් මදීනා නගරයේ සිට මක්කා නගරයට නියෝජිතයින් දෙදෙනෙකු එවන ලදී. මෙම කාලය තුළ ඔවුන් ඉවත් වුවහොත් ඔවුන් සමග ගැටුමක් ඇතිකර ගැනීමේ අවශ්‍යතාවක් කිසිසේත්ම උදා නොවෙයි. නමුත් එසේ ඉවත් නොවී මක්කාවේ රැඳෙන්නන් පිළිබඳවයි මෙහි සඳහන් වන්නේ. රටේ නීතිය උල්ලංඝනය කරමින් කටයුතු කිරීම මෙම පිටුවහල් කිරීමට ප්‍රධාන හේතුවයි.

ඉහත සාකච්ඡාවට බඳුන් වී ඇති අල් කුර්ආන් වැකියේ සන්දර්භය වෙත අවධානය යොමු කරමු.

(9:1) (මෙය) ආදේශකයින් අතුරින් නුඹලා කවරෙකු සමග ගිවිසුම් ඇති කර ගත්තේ ද ඔවුන් වෙත **අල්ලාහ්** හා තම **රසූල්**වරයාගෙන් (ධර්මදූතයාගෙන්) වූ නිදොස් වීම( පිළිබඳව ප්‍රකාශනය)කි.

(ඉස්ලාම් විරෝධී කුරෛෂ් හා ඔවුන්ගේ සහායක ගෝත්‍රිකයින් සමග මුස්ලිම්වරුන් සටන් විරාම සාම ගිවිසුමක් ඇති කර ගෙන තිබූ අතර එය කුරෛෂ් පාර්ශවයේ බනූ කිනානා ගෝත්‍රය හැරෙන්නට එම පාර්ශවයේ අන් සැවොම විසින් උල්ලංඝනය කොට තිබුණි. මුස්ලිම්වරුන්ට ඒක පාර්ශවීයව ගිවිසුමක් රැකිය නොහැකි හෙයින් එයින් ඉවත් වීමේ ප්‍රකාශනය මෙම වැකියෙන් ප්‍රසිද්ධියට පත් කොට ඇත.) (මූලාශ්‍රය : තන්වීර් අල් මික්බාස් මින් තෆ්සීර් ඉබ්නු අබ්බාස්)

(9:2) එබැවින් (ප්‍රතික්ෂේපකයිනි!) සිව් මසක් (මෙම **මක්කහ්**) භූමියෙහි නුඹලා (සිත් පරිදි) සැරිසරවූ. තවද නුඹලා **අල්ලාහ්**ව නොහැකියාවට පත් නොකරන්නන් බවද **අල්ලාහ්** ප්‍රතික්ෂේපකයින්ව අවමානයට ලක් කරන්නෙකු බවද දැන ගනිවූ.

(ගිවිසුම කඩ කිරීමත් සමග වහාම යුද ප්‍රකාශයක් නොකොට ඔවුන්ට මාස හතරක කාලයක් ලබා දීමෙන් අපරාධ සිදු කළ පිරිස සම්බන්ධව යුක්තිගරුක ලෙස කටයුතු කිරීමට මෙම වැකියෙන් උපදෙස් දී ඇත. ගිවිසුම කඩ කරමින් ඉස්ලාමිකයින්ට සතුරුකම් කරමින් ඔවුන්ගේ මිත්‍ර පාක්ෂිකයින් ඝාතනය කළ පිරිස පිළිබඳවයි මෙහි සඳහන් වන්නේ. ඉවත් වීමට මාස හතරක් දී තිබුණ ද ඔවුන්ගේ කුමන්ත්‍රණකාරී ප්‍රයෝගයන් පිළිබඳව විමසිලිවත් වන ලෙස උපදෙස් දී තිබේ. මෙහි පසුබිම හා සන්දර්භය පිළිබඳව අවබෝධයකින් තොරව මුස්ලිම් භීතිකාව ඇති කිරීම පමණක් අරමුණු කොට ගෙන කටයුතු කරන විට සත්‍යයෙන් බැහැරව අදහස් දැක්වීම් නොවැළක්විය හැක්කක් නොවන බව පිළිගන්නෙමු. ඔවුන්ට ඉවත් වන්නට දුන් නියෝගය රටින් පිටුවහල් කිරීමක් නොවේ. මෙම කාල වකවානුව වන විට මක්කා ප්‍රදේශය ද මුස්ලිම් රාජ්‍යයේ කොටසක්ව පැවතිණි. මෙම අපරාධකරුවන්ට ඉවත් වන්නට උපදෙස් දී තිබුණේ අති

පෞරාණික එමෙන්ම මුස්ලිම්වරුන්ගේ අති උත්තරීතර මක්කාවේ පිහිටි පල්ලිය හා ඒ අවට ඇති පුණ්‍ය භූමි ප්‍රදේශයෙන් පමණි. අති විශාල එම උතුම් හා පෞරාණික පල්ලිය වෙත ආගමික කටයුතු සඳහා පැමිණෙන ජනයාගේ ආරක්ෂාව සහතික කිරීම පිණිස නීති විරෝධී ක්‍රියාවන්හි නියැලෙමින් කටයුතු කරන මෙම පිරිස එම ප්‍රදේශයෙන් ඉවත් කිරීමේ අවශ්‍යතාවක්ව තිබුණි. එදත් අදත් මක්කාව අසල පිහිටි ජිද්දා වැනි නගරයන්හි මුස්ලිම්නොවන්නන් ජීවත් වීම දැකිය හැක.)

(9:3) තවද (මෙය) ආදේශකයින්ගෙන් **අල්ලාහ්** ද ඔහුගේ **රසූල්**වරයා ද නිදොස් වූ බව අති මහත් වූ **හජ්** දිනයෙහි ජනයා වෙත **අල්ලාහ්**ගෙන් හා ඔහුගේ **රසූල්**වරයාගෙන් වූ දැන්වීමකි. එබැවින් නුඹලා පශ්චාත්තාප (වී **අල්ලාහ්** වෙත යොමු) වූයෙහු නම් එය නුඹලාට යහපත්ය. තවද නුඹලා (**අල්ලාහ්**ට) පිටුපෑවෙහු නම් නුඹලා **අල්ලාහ්**ව නොහැකියාවට පත් නොකරන්නන් බව දැන ගනිවු. තවද (**නබි**වරය,) ප්‍රතික්ෂේප කළවුනට වේදනීය දඬුවමක් පිළිබඳව ශුභාරංචි පවසවු.

(ගිවිසුම් කඩ කරමින් සාපරාධී ක්‍රියාවන්හි නියැලුණු සාහසික පිරිසට තම නොමනා ක්‍රියාවන් පිළිබඳ පසුතැවිලි වී සතුරුකමින් ඉවත්වන ලෙස මෙම අල් කුර්ආන් වැකියෙන් දන්වා ඇත. ඔවුන්ගේ කුමන්ත්‍රණකාරී ක්‍රියා මගින් අල්ලාහ්ගේ අභිමතය පරාජය කිරීමට නොහැකි බවත් ගිවිසුම් කඩ කරමින් මිනිස් ඝාතන ආදී සාපරාධී ක්‍රියාවන්හි දිගින් දිගටම නියැළෙන්නන්ට එරෙහිව දඬුවම් ලබා දෙන සහතිකය ද මෙමගින් ලබා දී ඇත.)

(9:4) (නමුත්) ආදේශකයින් අතුරින් නුඹලා කවුරුන් සමග ගිවිසුම් ඇති කර ගෙන පසුව (එම ගිවිසුමෙහි) නුඹලාට ඔවුන් කිසිවක් අඩු නොකර නුඹලාට එරෙහිව කිසිවෙකුට උදව් නොකර සිටියවුන්ට හැරය. එබැවින් ඔවුන්ගේ ගිවිසුම ඔවුන්ගේ කාලය (අවසන් වන) තෙක් ඔවුනට නුඹලා සම්පූර්ණ කරවු. සැබැවින්ම **අල්ලාහ්** බිය භක්තිකයින්ව ප්‍රිය කරන්නේය.

(මෙයට පෙර වැකියෙහි සඳහන් දඬුවම් දීම සීමා කොට ඇත්තේ එකඟ වූ ගිවිසුම් කඩ කරමින් මුස්ලිම්වරුන්ට එරෙහිව කටයුතු කළ ඉස්ලාම් විරෝධීන්ට පමණි. මෙම වැකියෙන් මුස්ලිම්වරුන් සමග ගිවිසුම් ගත වී මුස්ලිම්වරුන්ට එරෙහිව හෝ මුස්ලිම්වරුන්ගේ සතුරන්ට සහාය දක්වමින් කටයුතු නොකළ පිළිම වන්දනයෙහි යෙදුණු මුස්ලිම් නොවන පිරිස සමග එම ගිවිසුම් අනුව කටයුතු කොට ඔවුන්ට සාමයෙන් සිටීමට අවකාශය ලබා දීම මුස්ලිම්වරුන්ගේ වගකීමක් බව අවධාරණය කරයි. මෙම මුස්ලිම් නොවන පිරිස මුස්ලිම්වරුන් සමග ගිවිසුම් අත්සන් කොට ඉන්පසු එහි කිසිම කොන්දේසියක් කඩ නොකළා මෙන්ම මුස්ලිම්වරුන්ගේ අනෙකුත් සතුරන්ට මුස්ලිම්වරුන්ට එරෙහිව උපකාර නොකළ පිරිසයි. ඔවුන් ගිවිසුමේ කොන්දේසි කඩ නොකළාක් මෙන් මුස්ලිම්වරුන් ද එය ආරක්ෂා කරමින් ඒ අනුව කටයුතු කළ යුතු බව උපදෙස් ලබා දී ඇත.)

(9:5) ශුද්ධ වූ මාසයන් ඉක්ම වූ පසු (නුඹලා සමග යුද වැදී සිටින) ආදේශකයින්ව නුඹලා දුටු තැන මරා දමවු. තවද ඔවුන්ව අල්ලා ගනිවු. තවද ඔවුන්ව වටලා ගනිවු. නුඹලා සැම විපරමින් සිටිය යුතු ස්ථානයකම ඔවුන් වෙනුවෙන් (සැඟවී) වාඩිවී සිටිවු. එවිට ඔවුන් (ප්‍රතික්ෂේපයෙන් ඉවත් වී) පශ්චාත්තාප වී **සලාතය** (දෛණික පස්වේල නැමදුම) ස්ථාපිත කර **zසකාත්** (දුගීන්ට පිරිනමන අනිවාර්‍යය වූ දන්දීම) ද ලබා දුන්නේ නම් ඔවුන්ගේ මගෙහි ඔවුන්ව අත හැර දමවු. සැබැවින්ම **අල්ලාහ්** අති ක්ෂමාශීලීය. පරම කරුණාභරිතය.

(මෙම පරිච්ඡේදයේ බොහෝ වැකි අදාළ වන්නේ ක්‍රි. ව. හයවන සියවසේ එක්තරා නිශ්චිත අපරාධකාරී පිරිසක් එකඟ වූ ගිවිසුම් කඩ කරමින් මිනිස් ඝාතන ආදිය සිදුකරමින් සමාජ විරෝධී අයුරින් ක්‍රියා කිරීම සම්බන්ධයෙනි. මෙම වැකි සැමදා සැමට සැම විට අදාළ වන ලෙසක් දක්වමින් ඉස්ලාම් විරෝධී ප්‍රචාරකයින් ගෙන යන්නේ සත්‍යය වශයෙන්ම ඉතා කපටි හා ද්වේශ සහගත ප්‍රචාරයකි. එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදී ගැටුම පැවති අවධියේ කිලිනොච්චියට පහර දෙන ලෙස හමුදා ප්‍රධානීන් නියෝගයක් නිකුත් කොට තිබිය හැක. මෙම නියෝගය අදාළ වන්නේ එම ත්‍රස්තවාදී ක්‍රියා පැවති නිශ්චිත ඓතිහාසික සන්දර්භයක නිශ්චිත පිරිසකට එරෙහිව පමණි. තම නියෝග පුස්තකයේ කිලිනොච්චියට පහර දීමට නියෝගයක් ඇති බව පවසමින් එම ගැටුම් අවසන් වූ වර්තමානයේ හමුදා ප්‍රධානියෙකු නැවත කිලිනොච්චියට පහර දීමට කටයුතු කළහොත් වහාම එම නිළධාරියාව මානසික රෝහලක ප්‍රතිකාර සඳහා යොමු කරනු නොඅනුමානය. එලෙසම එක්තරා නිශ්චිත පිරිසකගේ අපරාධකාරී ක්‍රියා සම්බන්ධයෙන් නිශ්චිත ඓතිහාසික සන්දර්භයක් තුළ ක්‍රියා කිරීමට අදාළ අල් කුර්ආන් වැකි සැමට සැමදා සැම විට අදාළ වන උපදෙස් යැයි යමෙක් හුවා දක්වන්නට කටයුතු කරන්නේ ද අනිවාර්යයෙන්ම ඔවුන්ව ද මානසික ප්‍රතිකාර සඳහා යොමු කළ යුතු වෙනවා නොවේ ද?)

(9:6) තවද ආදේශකයින් අතුරින් කෙනෙකු නුඹගෙන් අභය පැතුවේ නම් **අල්ලාහ්**ගේ වදන් වලට ඔහු සවන් දෙන තුරු නුඹ ඔහුට අභය ලබා දෙවූ. පසුව ඔහුව ඔහුගේ ආරක්ෂක ස්ථානයකට සේන්දු කරවවූ. එය (මක්තිසාද යත්) ඔවුන් (දහම පිළිබඳව) නොදැනුවත් පිරිසක් හේතුවෙනි.

(මෙම වැකිය මගින් ද ඉස්ලාමය පිළිබඳ අවලාදාත්මක ප්‍රචාර ඉදිරිපත් කරන්නන්ගේ පදනම් විරහිත චෝදනා සහමුලින්ම බිඳ වැටී යයි. ඉහත පස්වන වැකියෙන් උගන්වන්නේ පිළිම වන්දනාකරුවන් සැවොම සැමදා ඝාතනය කිරීමේ ප්‍රතිපත්තියක් බව නොදැනුවත් කමින් පවසන්නන් මෙම වැකියෙන් උගන්වන උත්තරීතර ප්‍රතිපත්තිය කෙරෙහි අවධානය යොමු කරන්නේ නම් යෙහෙකැ'යි යෝජනා කරන්නෙමු. මුස්ලිම්වරුන් සමග ඉතා දරුණු අයුරින් සටන් වැදී සිටි ඉස්ලාම් විරෝධියෙක් රැකවරණ පතා සිටියේ නම් පළමුව ඔහුට අල් කුර්ආනයේ වදන් වලට සවන් දීමට අවස්ථාවක් ලබා දී ඔහුට ආරක්ෂාව ඇති ස්ථානයක් කරා යොමු කරන ලෙස මෙම වැකියෙන් උපදෙස් දී ඇත. යුද ආචාර ධර්ම පිළිබඳ කතා කරන්නන් පොදුවේ ඉදිරිපත් කරන්නේ තමන්ට යටහත් වන සතුරු සෙබළා සිරභාරයට ගෙන කටයුතු කිරීමේ ප්‍රතිපත්තියකි. නමුත් ඉස්ලාමයේ යුද ආචාර ධර්ම අනුව සතුරු සෙබළා යටහත් වුවහොත් ඔහුට ආරක්ෂාව සහතික වන ස්ථානයකට ගෙන ගොස් මුදා හැරීම එක් ප්‍රතිපත්තියක් බව මෙයින් පැහැදිළි වේ. මෙහි දී අල් කුර්ආන් වැකි වලට සවන් දීමට ඉඩ හැරීම යන්නෙන් අදහස් වන්නේ ඔහුව ඉස්ලාමයට හරවා ගැනීමේ වංක උත්සාහයක් බව පැවසීමට ඉඩ ඇත. එය එසේ කරනු ලබන්නේ ඔහු සටන් කොට ඇත්තේ සත්‍යයට එරෙහිව බව පෙන්නුම් කිරීමට විනා අවිචාරවත් අන්දමින් ආගම් වෙනස් කිරීමේ උත්සාහයක් සඳහා නොවන බව ආගමික නිදහස පිළිබඳ ඉදිරිපත් කළ විවිධ වැකි වලින් අවබෝධ කර ගෙන ඇතැ'යි සිතන්නෙමු.

එහෙයින් ලොව කිසිදු පිළිවෙතක නොමැති උත්තරීතර ඉගැන්වීම් අනුව ඉස්ලාමීය මග පෙන්වීම සැකසී ඇති බව මෙයින් පැහැදිළි වනු ඇතැ'යි විශ්වාස කරන්නෙමු.)

(9:7) (ආදේශකයින් අතුරින්) මස්ජිදුල් හරාම් (මක්කාවේ පිහිටි ඉපැරණි ප්‍රධාන මස්ජිදය) අබියස නුඹලා ගිවිසුමක් ඇති කර ගත්තවුන් (සමග) මිස (අන්) ආදේශකයින්ට **අල්ලාහ්** අබියස ද තම **රසූල්**වරයා අබියස ද ගිවිසුමක් තිබිය හැක්කේ කෙසේ ද? එබැවින් ඔවුන් නුඹලා සමග (ගිවිසුමේ කොන්දේසි පිළිපදිමින්) ඍජු ලෙස කටයුතු කරන තාක්කල් නුඹලා ඔවුන් සමග ඍජු ලෙස කටයුතු කරවූ. සැබැවින්ම **අල්ලාහ්** බිය භක්තිකයින්ව ප්‍රිය කරන්නේය.

(මුස්ලිම්වරුන් සමග ඇති කරගත් ගිවිසුම් කිහිප විටක්ම උල්ලංඝනය කරමින් මුස්ලිම්වරුන් සමග සටනට පිවිසි මුස්ලිම් විරෝධීන් සමග ගිවිසුමක් තිබිය හැක්කේ කෙසේ ද? ගිවිසුමක් යථාර්ථයක් වීම සඳහා දෙපාර්ශවයම එහි කොන්දේසි පිළිගෙන ඒවා පිළිපැදිය යුතු වෙයි. මුස්ලිම්වරුන්ට පමණක් අනිත් පාර්ශවය විසින් අමු අමුවේ උල්ලංඝනය කරනු ලබන ගිවිසුමක් ඒක පාර්ශවීයව පිළිගැනීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීමක් තිබිය නොහැක. මෙම වැකියෙන් උපදෙස් දී ඇත්තේ ගිවිසුම් කඩ නොකොට අවංක ලෙස කටයුතු කළ මුස්ලිම් නොවන්නන්ගේ ගිවිසුම් ආරක්ෂා කරමින් මුස්ලිම්වරුන් ද කටයුතු කළ යුතු බවය.)

(9:8) නුඹලාට එරෙහිව ඔවුන් ජය ලැබුවේ නම් නුඹලා තුළ ඇති ඥාති සම්බන්ධකම ද ගිවිසුම ද ඔවුන් සැලකිල්ලට නොගනිමින් සිටියදී (නුඹලා හා ඔවුන් අතර ගිවිසුමක් ඇති විය හැක්කේ) කෙසේ ද? ඔවුන්ගේ මුවින් ඔවුහු නුඹලාව තෘප්තියට පත් කරති. (නමුත්) ඔවුන්ගේ හදවත් (එය) පිටුපාති. තවද ඔවුන්ගෙන් බොහෝ දෙනා පාපතරයින්ය.

(මෙයට ඉහත වැකිය පිළිබඳ ඉදිරිපත් කළ වැකියේ විග්‍රහය අනුව මෙය ගිවිසුම් කඩ කොට මුස්ලිම්වරුන්ව ආක්‍රමණය කිරීමට කටයුතු කළ පිරිස සම්බන්ධයෙනි. ඔවුනට සුළු වශයෙන් හෝ ජයග්‍රාහී ඉහළ තත්ත්වයක් ඇති බව හැඟී ගිය සෑම විටම ඥාති සබඳතාවක් හෝ ගිවිසුමක් හෝ කිසි විටෙක සැළකිල්ලට නොගෙන ගැටුම්කාරී අයුරින් කටයුතු කිරීම ඔවුන්ගේ පිළිවෙත බවට පත් වී තිබුණු බව මෙයින් පැහැදිළි කෙරේ.)

(9:9) ඔවුන් අල්ලාහ්ගේ වදන් වෙනුවට සුළු වටිනාකමක් ගත්තෝය. තවද ඔහුගේ(අල්ලාහ්) මාර්ගයෙන් (ජනයින්ව) වැළැක්වූවෝය. සැබැවින්ම ඔවුන් කරමින් සිටි දෑ නපුරු විය.

(මක්කාවාසී ඉස්ලාම් විරෝධීන්ගේ ප්‍රධාන අරමුණ වී තිබුණේ ජනයාව ඉස්ලාමයෙන් වළක්වාලීමට කටයුතු කිරීමය.)

(9:10) විශ්වාසිකයෙකුගේ විෂයෙහි ඥාති සම්බන්ධකම ද ගිවිසුම ද ඔවුන් සැලකිල්ලට නොගන්නෝය. තවද සීමාව ඉක්මවා යන්නෝ ඔවුන්මය.

(9:11) ඔවුන් (ප්‍රතික්ෂේපයෙන් ඉවත් වී) පශ්චාත්තාප වී සලාතය ස්ථාපිත කර zසකාත් (දුගීන්ට පිරිනමන අනිවාර්යය වූ දන්දීම) ද ලබා දුන්නේ නම් දහමෙහි (ඔවුන්) නුඹලාගේ සහෝදරයින්ය. තවද අපි දැනුමැති පිරිසකට (අපගේ) වදන් පැහැදිලි කරන්නෙමු.

(9:12) තවද ඔවුන් තම ගිවිසුමෙන් පසු ඔවුන්ගේ ප්‍රතිඥාවන් කඩ කර නුඹලාගේ දහමට නින්දා ඇති කළේ නම් ප්‍රතික්ෂේපයේ ප්‍රධානීන් සමග නුඹලා යුද වදිවු. සැබැවින්ම ඔවුනට කිසිදු ප්‍රතිඥාවන් නොමැත. (එසේ නම්) ඔවුන් (ඔවුන්ගේ මෙම පිළිවෙතින්) වැළකිය හැක්කේය.

(9:13) තමන්ගේ ප්‍රතිඥාවන් කඩ කර (තම) රසූල්වරයාව (මව් බිමෙන්) පිටුවහල් කිරීමට ස්ථිරව අදිටන් කර ප්‍රථමයෙන් නුඹලා සමග (යුද වැදීමට) ආරම්භ කළ පිරිසක් සමග නුඹලා සටන් කළ යුතු නොවේ ද? නුඹලා ඔවුනට බිය වන්නෙහු ද? නුඹලා විශ්වාසිකයින්ව සිටියෙහු නම් අල්ලාහ්, ඔහුමය නුඹලා බියවන්නට ඉතා සුදුස්සා වනුයේ.

(ගිවිසුම් කඩ කිරීම, මුහම්මද් තුමාණන්ව හා මුස්ලිම්වරුන්ව පිටුවහල් කිරීම හා පළමු ප්‍රහාරය සිදු කිරීම මක්කාවාසී මුස්ලිම් නොවන්නන්ට එරෙහිව 5 වන වැකියේ සඳහන් යුද තත්ත්වය සඳහා හේතු සාධක වූ බව මෙයින් මනා ලෙස පැහැදිලි වෙයි. මෙවන් තත්ත්වයක් තුළ සතුරා සමග යුද කිරීම හැර වෙනත් විකල්පයක් ඇති දැ'යි විමසන්නට කැමැත්තෙමු. නමුත් මෙම පරිච්ඡේදයේ පස්වැනි වැකිය පමණක් හුවා දක්වමින් අල් කුර්ආනය සියලුම මුස්ලිම් නොවන්නන්ව දුටු තැන ඝාතනය කිරීමට අනුමැතිය දී ඇති බව පවසමින් මුස්ලිම් භීතිකාවක් ගොඩනැගීමට උත්සාහ කරන්නන් කෙතරම් බරපතළ අයුරින් ආගමික ග්‍රන්ථ විකෘති කිරීමට කටයුතු කර ඇත්තේදැ'යි කරුණාකර සිතා බලන්න. දහමක් හෝ එම දහම අනුගමනය කරන්නන් කෙරෙහි මුසාවාදය මත පමණක් පදනම් වී වෛරයක්, ක්‍රෝධයක් ඇති කිරීමට කටයුතු කරන්නන් කෙතරම් පිරිහීමකට පත් වී ඇති පිරිසක් ද යන්න ඉහත විග්‍රහයන් විචාරශීලීව හා බුද්ධිමත් අයුරින් විමර්ශනය කරන්නෙකුට ඉතා පැහැදිළි අයුරින් පෙනී යනු ඇතැ'යි විශ්වාස කරන්නෙමු.)

## (13) චෝදනාව :

9:14 "පිළිම වන්දනාකරුවන්ට සහ බහුදේවවාදීන්ට විරුද්ධව සටන් කරන්න. එලෙස අල්ලා විසින් ඔබ (මුස්ලිම් වරුන්) ලවා ඔවුන්ව විනාශ කරනු ඇත. එසේම අල්ලා විසින් ඔබ ලවා ඔවුනට අවමන් කොට ඔවුන්ව නිග්‍රහ කොට, ඔවුන්ට එරෙහිව මුස්ලිම්වරුන්ට ජයග්‍රහණය අත්කර දෙනු ලබයි. මෙලෙස ඔවුන්ට එරෙහිව ඔබලාගේ හදවත් තුල කැකෑරෙන වෛරය සංසිඳුවනු ඇත."

**විග්‍රහය** : පළමුව මෙම කුර්ආන් වැකියේ නිවැරදි සිංහල අර්ථ දැක්වීම වෙත අවධානය යොමු කරමු.

"නුඹලා ඔවුන් සමග යුද වදිවු. අල්ලාහ් නුඹලාගේ අත් මගින් ඔවුනට දඬුවම් කරන්නේය. තවද ඔවුන්ව අවමන් කරන්නේය. තවද ඔහු ඔවුන්ට එරෙහිව නුඹලාට උදව් කරන්නේය. තවද ඔහු විශ්වාසික පිරිසගේ හදවත් සනසන්නේය." (අල් කුර්ආන් 9:14)

මෙම වැකිය අල් කුර්ආන් 9:5 වන වැකියේ පටන් සඳහන් වන සිද්ධියට අදාළ වැකියකි. මෙය 'බනූ බක්ර්' හා 'බනූ කුසාආ' නැමැති ගෝත්‍රයන් දෙකක් අතර ඇති වූ යුද ගැටුම පිළිබඳ සඳහන් කරයි. මෙම ගෝත්‍රයන් දෙකම මුස්ලිම් නොවූ ආදේශකයින්ව සිටි අතර 'බනූ බක්ර්' නම් ගෝත්‍රය මක්කාවේ ආදේශකයින් සමග ගිවිසුමෙන් බැඳුණු අය ලෙස හා 'බනූ කුසාආ' නම් ගෝත්‍රය මුස්ලිම්වරුන් සමග ගිවිසුමෙන් බැඳුණු අය ලෙස සිටියෝය. හිජ්රි සය වැනි වර්ෂයේ මුස්ලිම්වරුන් හා මක්කාවේ ආදේශකයින් අතර සිදු වූ සාම ගිවිසුමෙහි 'මෙම ගිවිසුම මෙම ගෝත්‍රයන් දෙක කෙරෙහි ද ක්‍රියාත්මක විය. එබැවින් එකා අනෙකාට කිසිදු අපරාධයක් නොකළ යුතුය.' යන්නෙන් සඳහන් වී තිබුණි. එනමුත් මක්කාවේ ආදේශකයින් සමග ගිවිසුමෙන් බැඳුණු අය වන බනූ බක්ර්වරුන් මුස්ලිම්වරුන් සමග ගිවිසුමෙන් බැඳුණු අය වන බනූ කුසාආවරුන්ට ප්‍රාණයන් ආරක්ෂා කළ යුතු ශුද්ධ වූ මස්ජිදුල් හරම් සීමාව තුළ දී පවා පහර දී මරා දමන්නට වූහ. මෙම ගැටුමේ දී මක්කාවේ ආදේශකයින් තමන් සමග ගිවිසුමෙන් බැඳුණු අය වන බනූ බක්ර්වරුන්ට ආයුධ සපයා උදව් කර මෙම ගැටුමෙහි හවුල්කරුවන් බවට ද පත් වූහ. එබැවින් මුස්ලිම්වරුන් සමග කර ගත් ගිවිසුම කඩ කර ඔවුන්ට හා ඔවුන් සමග ගිවිසුමෙන් බැඳුණු ගෝත්‍රයට අපරාධ කළ එම ආදේශකයින්ට එරෙහිව අල්ලාහ් උදව් කර මොවුන් කළ අපරාධය හේතුවෙන් කුමන ගින්නක් බනූ කුසාආවරුන්ගේ හදවත් තුළ දැවී තිබුණේ ද එය නිවා දමා ඔවුන්ගේ හදවත් සිසිල් කරන බවට අල්ලාහ් දුන් ප්‍රතිඥාව දන්වමින් මෙම වැකිය පහළ විය.

**(14) චෝදනාව :** කුරාණය 9:123

"මුස්ලිම්වරුනි, නුඹලා ආසන්නයේ වෙසෙන මුස්ලිම් නොවන ජනයාට එරෙහිව කලකෝලහාල ඇතිකරන්න. ඔවුන්ට පහර දෙන්න. එසේම, නුඹලාගේ සාහසික බව ඔවුන්ට දැනෙන ලෙස කටයුතු කරන්න. එසේම අල්ලාහ් සිටින්නේ උත්තම / ශ්‍රද්ධා වන්ත (එනම් එලෙස මුස්ලිම් නොවන ජනයාට එරෙහිව සටන් කරන) මුස්ලිම්වරුන් සමග බව දැනගන්න".

**විග්‍රහය** : පළමුව මෙම කුර්ආන් වැකියේ නිවැරදි සිංහල අර්ථ දැක්වීම කෙරෙහි අවධානය යොමු කරමු.

"විශ්වාස කළවුනි, ප්‍රතික්ෂේපකයින් අතුරින් නුඹලා අවට සිටින්නවුන් සමග යුද වදිවු. තවද ඔවුන් නුඹලා තුළ දැඩිභාවය දැක ගත යුතුය. තවද අල්ලාහ් බිය භක්තිකයින් සමග යැයි නුඹලා දැන ගනිවු." (අල් කුර්ආන් 9:123)

මෙම වැකියෙහි අල්ලාහ් මුස්ලිම්වරුන්ට සටන් කරන මෙන් විධානය කොට ඇත්තේ තමන්ට අසලින් සිටි එනම් මක්කාවේ වෙසෙන තමන්ට හිංසා අපරාධ කළ ප්‍රතික්ෂේපකයින්ට හා ඔවුන් සමග ගිවිසුමෙන් බැඳුණු ගෝත්‍රයන්ට එරෙහිවය. ඔවුන් මුස්ලිම්වරුන්ට කළ හිංසා අපරාධයන් ඉතිහාසයෙහි නොසැඟවූවක්ය. මෙම වැකියෙහි පොදුවේ සියලු ප්‍රතික්ෂේපකයින්ට එරෙහිව සටන් කරන මෙන් අල්ලාහ් අණ කර තිබුණේ නම් මදීනාවට අසලින් වෙසෙන ප්‍රතික්ෂේපකයින්ට එරෙහිව සටන් වදින මෙන් විධානය නොකොට පොදුවේ ප්‍රතික්ෂේපකයින්ට එරෙහිව සටන් කරන මෙන් අණ කරන්නට තිබුණි. මන්දයත් මදීනාව තුළ ද ප්‍රතික්ෂේපකයින් හා ආදේශකයින් වාසය කරමින් සිටියෝය. එපමණක් නොව 'ෂාම්, යෙමන්' වැනි දුරින් පිහිටි රටවල් වලින් ද මදීනාව හා මදීනාව අවට ප්‍රදේශයන් වලට ප්‍රතික්ෂේපකයින් ව්‍යාපාර සඳහා පැමිණෙමින් සිටියෝය. මෙම විධානය සෑම ප්‍රතික්ෂේපකයෙකුටම එරෙහිව තිබුණේ නම් දුර සිට පැමිණෙන මොවුන්ට එරෙහිව ද සටනෙහි යෙදෙන්නට විධානය කරන්නට තිබුණි. නමුත් සටන් කරන මෙන් විධානය කර ඇත්තේ මුස්ලිම්වරුන්ව ඥාතිත්වය නොසලකා තවද ඔවුන් සමග කර ගත් සාම ගිවිසුම නොසලකා ඔවුන්ට එරෙහිව නොයෙකුත් අයුරින් පහර දුන් මක්කාවේ සිටින එම ප්‍රතික්ෂේපකයින්ට එරෙහිවය.

මෙහි අප අවධානය යොමු කළ යුතු කරුණක් නම් මෙම වැකියෙහි 'ගිල්ළහ්' යන පදය භාවිත කොට ඇත. එයට 'රළු බවින් හැසිරීම' යන අර්ථය ද ඇති අතර එයට දැඩි බව, ශක්තිමත් බව යන අර්ථ ද තිබේ. මෙම වැකියෙහි මෙම පදය තුළින් පළමුවන අර්ථය අදහස් නොකරන අතර දෙවන අර්ථය අදහස් කෙරේ යන්න අනිවාර්යයෙන්ම අවබෝධ කර ගත යුතු කරුණකි. "ඔවුන් නුඹලා තුළ දැඩිභාවය දැක ගත යුතුයි." යන වැකිය දන්වන්නේ 'දැඩි බව, ශක්තිමත් බව නුඹලා තුළ තිබිය යුතුයි. එබැවින් නුඹලාට එරෙහිව යුද වදින්නන් නුඹලාට පහර දීමට හෝ නුඹලාව සැහැල්ලු ලෙස සිතීමට හෝ ධෛර්යයක් නොමැති වන අයුරින් නුඹලා තුළ ශක්තිමත් බවක් හා ගාම්භීරත්වයක් ඔවුනට හැඟිය යුතුයි.' යන්නයි. ඕනෑම සමූහයක් තවත් සමූහයක් සමග බලහත්කාර කමින් අපරාධිතව හැසිරීම ඔවුන්ගේ අයිතීන් උල්ලංඝනය කිරීමක් බව පැහැදිලි වූවකි. එහෙත් 'යම් සමූහයක් අන් අය තමන්ට අපරාධයක් කිරීමට ධෛර්යයක් නොවන අයුරින් තම ගාම්භීරත්වය ආරක්ෂා කර ගැනීම තමන්ට අයත් අයිතීන්ගෙන් එකකි.' යන්න ද පැහැදිලි වූවකි.

**(15) චෝදනාව :** සහීහ් අල් බුහාරී 1:2:24 (නබි තුමාගේ මෙහෙවර ප්‍රකාශය)

"මොහොමද් දේශනා කළා 'සියලුම මිනිසුන් ලා ඉලාහා ඉල්ලල්ලාහ්' (එනම් අල්ලාහ් හැර වෙනත් කිසිම දෙවියෙකු නැත. අල්ලාහ් හැර වෙනත් කිසිම දෙවියෙකුට හෝ ආගමකට වන්දනාමාන ලැබීමට අයිතියක් නැත) යන වැකිය කියා දිවුරන තුරු (එනම් ඉස්ලාමය වැළඳ ගන්නා තුරු) ඔවුන්ට විරුද්ධව කල කෝලාහල / සටන් කළ යුතු බවට (අල්ලාහ් විසින්) නියෝග කොට ඇත. එසේ දිව්රන (එනම්, ඉස්ලාමය වැළඳ ගන්නා තුරු) කවරෙකුගේ හෝ පමණක් ජීවිතය සහ ඔහුගේ දෙපොල ආරක්ෂා වනු ඇත."

**විග්‍රහය** : ඉහත හදීස් වැකියේ නිවැරදි පරිවර්තනය වෙත යොමු වෙමු. ඉහතින් දක්වා ඇත්තේ එම නබි වදනේ කොටසකි. එහි සම්පූර්ණ කොටස පහත සඳහන් අයුරිනි.

"අල්ලාහ් හැර නැමදුමට සුදුසු අන් කිසිවෙකු නොමැත. මුහම්මද් අල්ලාහ්ගේ ගැත්තා හා ධර්ම දූතයා යන්න ප්‍රකාශ කරන තුරු හා 'සලාතය' (පස්වේල නැමදුම) ස්ථාපිත කොට 'සකාතය' (දුගීන්ට පිරිනැමිය

යුතු අනිවාර්ය දන්දීම) දෙන තුරු ජනයා සමග සටන් කිරීමට (අල්ලාහ් විසින්) මට නියෝග කොට ඇත. ඔවුන් එසේ කරන්නේ නම් ඉස්ලාමීය නීතියට අනුව හැර ඔවුන්ගේ වස්තුව හා ජීවිත මගෙන් ආරක්ෂා සහිතය. ඔවුන්ගේ ක්‍රියා පිළිබඳ ගිණුම අල්ලාහ් සතුය." (සහීහ් බුහාරි - 4 වන වෙළුම, හදීස් අංක 196)

මුහම්මද් තුමාණන්ගේ මෙම ප්‍රකාශනය පිළිබඳව විමසීමක් කිරීමේ දී 'යුකාතිල්' හා 'අක්තුල' යන අරාබි පදයන්හි නිවැරදි අර්ථය අප විසින් පළමුව අවබෝධ කර ගැනීම අත්‍යාවශ්‍ය වෙයි. 'යුකාතිල්' යන්නෙහි අර්ථය 'සටන් කිරීමට' යන්න වන අතර 'අක්තුල' යන්නෙහි අර්ථය 'ඝාතනය කිරීමට' යන්නය. මෙම ප්‍රකාශනයේ යොදා ඇත්තේ 'යුකාතිල්' නම් පදය වන අතර එයින් අදහස් වන්නේ ඉස්ලාමය තුළින් දිව්‍යමය සත්‍යය අවබෝධ කර ගැනීමට කටයුතු කරන ජනයා වළකාලන බලවේග සමග සටනක (අරගලයක) යෙදීමයි. මෙම සටන සන්නද්ධ සටනක්ම පමණක් යැයි අරුතක් දිය නොහැක. අයුක්තිය, අසාධාරණය, දූෂ්ටකම්, හිංසනය හා කළහකම් වැනි සමාජ යහපතට හානිකර සියලු කටයුතු වලට එරෙහිව කරන්නා වූ ඉස්ලාමීය අරගලය මෙම වදනින් අරුත් ගැන්විය හැක.

ජාතික හා ජාත්‍යන්තර ඉස්ලාම් විරෝධී වෙබ් අඩවි හා අනෙකුත් සමාජ මාධ්‍යයන් ඉහත මුහම්මද් තුමාණන්ගේ ප්‍රකාශනය (හදීස් වැකිය) උපුටා දක්වමින් ඉස්ලාමය සියලු ආචාරධර්මී පිළිවෙත් උල්ලංඝනය කරමින් බලය හා ජීවිත තර්ජන ඉදිරිපත් කරමින් ජනයා ඉස්ලාම් දහම වෙත හරවා ගැනීමට කටයුතු කරන බවට චෝදනාවක් ඉදිරිපත් කරයි. නමුත් මෙම ප්‍රකාශනයට පදනම් වූ ඓතිහාසික පසුබිම මෙන්ම එහි නිවැරදි අර්ථය විමසා බැලීමේ දී මෙවැනි චෝදනාවක් මතු කිරීමට කිසිදු හැකියාවක් නොමැති බව ඉතාමත්ම පැහැදිලි අයුරින් දක්නට ඇත. එහෙයින් පළමුව මෙම හදීස් වැකියේ පසුබිම විමසා බලමු.

**පසුබිම**

ආරම්භක මෙන්ම නූතන ඉස්ලාමීය විද්වතුන්ගේ මතය අනුව මෙම ප්‍රකාශනය කරන ලද්දේ ඉස්ලාම් විරෝධීන් විසින් නිතර උපුටා දක්වනු ලබන අල් කුර්ආනයේ නව වන පරිච්ඡේදයේ පස් වැනි වැකියේ සඳහන් යුද ගැටුම සම්බන්ධව ය. (මූලාශ්‍රයඃ ඉබ්න් කතීර් අල් කුර්ආන් විවරණය 4 වන වෙළුම 377 වැනි පිටුව - ඉබ්න් ජුසයි අල් කුර්ආන් විවරණය http://bewley.virtualave.net/tawbai.html). අප විසින් අල් කුර්ආනයේ 9 වන පරිච්ඡේදයේ 5 වැනි වැකිය පිළිබඳව මතු කොට තිබූ සියලු පදනම් විරහිත චෝදනා පිළිබඳ ඉතාම නිවැරදි විග්‍රහයන් ඉදිරිපත් කොට ඇත්තෙමු. මෙම වැකියෙන් සඳහන් කොට ඇති යුද තත්ත්වය ඇති වන්නේ මක්කාහි විසූ කුරෛෂ් ගෝත්‍රික ප්‍රතික්ෂේපකයින් විසින් මුස්ලිම්වරුන් සමග එළඹ සිටි සටන් විරාම ගිවිසුම කඩ කරමින් මුස්ලිම්වරුන් සමග ගිවිසුම් අත්සන් කොට සිටි මුස්ලිම් නොවන ජන කොට්ඨාශයකට එරෙහිව සාපරාධී ලෙස මිනිස් ඝාතන සිදු කරමින් කටයුතු කිරීමට ඉදිරිපත් වීම පසුබිම් කොට ගෙනය.

මෙම ගැටුම සම්පූර්ණයෙන්ම මුස්ලිම් නොවන ගෝත්‍රිකයින් අතර හටගත් එකකි. මුස්ලිම්වරුන්ගේ අපේක්ෂාව මුස්ලිම් නොවන්නන් ඝාතනය කිරීමක් නම් මෙම තත්ත්වය පිළිබඳව මුස්ලිම්වරුන්ට කරන්නට තිබූ වඩාත් උචිත පියවර වූයේ නිහඬ නිරීක්ෂකයින් බවට පත්වීම පමණි. නමුත් එකඟ වූ ගිවිසුම් ආරක්ෂා කිරීම ඉස්ලාමීය ආචාර ධර්ම අතර ප්‍රධාන තැනක් ගැනෙන්නක් හෙයින් ඔවුන් සමග ගිවිසුම් ගතව සිටි මුස්ලිම් නොවන බනූ කුසාආ ගෝත්‍රිකයින්ගේ සහායට ඒම මුස්ලිම්වරුන්ගේ වගකීමක් විය. මුස්ලිම් භීතිකා ව්‍යාපාරිකයින්ගේ මුසාවාද ප්‍රචාරය හිරු දුටු පිනිබිඳක් ලෙසින් වාෂ්ප කොට හැරීමට මෙම ඓතිහාසික සත්‍යය පමණක් ප්‍රමාණවත් ය. එසේ පවසමින් මෙම අල් කුර්ආන් වැකියට අදාළව සිදු වූ යුද තත්ත්වය පිළිබඳව මුහම්මද් තුමාණන් විසින් කරන ලද ඉහත ප්‍රකාශනය ගැන වඩාත් සවිස්තරාත්මක විග්‍රහයක් පහතින් ඉදිරිපත් කොට ඇත්තෙමු.

**විග්‍රහය ඃ**

මෙම හදීස් වැකියේ මතභේදාත්මක කොටස ලෙස ඇතැමුන් දකින්නේ "අල්ලාහ් හැර නැමදුමට සුදුසු අන් කිසිවෙකු නොමැත, මුහම්මද් අල්ලාහ්ගේ ගැත්තා හා ධර්ම දූතයා යන්න ප්‍රකාශ කරන තුරු හා 'සලාතය'(පස්වේල නැමදුම) ස්ථාපිත කොට 'සකාතය'(දුගීන්ට පිරිනැමිය යුතු අනිවාර්ය දන්දීම) දෙන තුරු ජනයා සමග සටන් කිරීමට (අල්ලාහ් විසින්) මට නියෝග කොට ඇත" යන කොටස පිළිබඳවය. ඇතැම් විවේචකයින් දක්වන මතය අනුව මුහම්මද් තුමාණන් හා එතුමාණන්ගේ සහගාමීන් විසින් අරාබිකරයේ ජනයාට කඩුව දිගු කරමින් ඉස්ලාමය වැළඳ ගන්නා ලෙස ජීවිත තර්ජන ඇති කරමින් කටයුතු කළ බව ද සඳහන් කරති. මෙම අරුමෝසම් මතය ඇතැම් ප්‍රාචීන ශාස්ත්‍රඥයින් හා ඉස්ලාම් විරෝධීන් විසින් ටික කාලයක් ජනයා අතරේ අලෙවි කරමින් මුස්ලිම්වරුන් පිළිබඳ පදනම් විරහිත බියක් හා පිළිකුලක් ඇති කිරීමට කටයුතු කළහ. නමුත් මෙම හදීස් වැකියේ නිවැරදි අර්ථ දැක්වීම අනුව වසර 1400 කට පමණ පෙර එළඹ සිටි ගිවිසුම් කඩ කරමින්, ඉස්ලාමිකයින් සමග ගිවිසුම් ගතව සිටි මුස්ලිම් නොවන පිරිස

සාහසික අයුරින් ඝාතනය කරමින් හා වසර 10ක පමණ මුස්ලිම්වරුන්ගේ මක්කා කාල වකවානුවේ හා ඉන් පසුව මදීනා නගරයේ ආරම්භ වූ ඉස්ලාමීය ජනරජයට එරෙහිවත් කටයුතු කළ කුරෙෂ් ගෝත්‍රික ප්‍රතික්ෂේපකයින් පිළිබඳව තීරණාත්මක පියවරක් ගැනීමේ අවශ්‍යතාව ඉස්ලාමීය නායකයින් වෙත බලකරනු ලැබීය. මෙම හදීස් වැකියට පාදක වූ අල් කුර්ආනයේ 9 වන පරිච්ඡේදයේ වැකි විග්‍රහ කිරීමේ දී පහත සඳහන් විකල්පයන් තුන ඔවුන් වෙත ඉදිරිපත් කරන ලද බව දක්නට ඇත.

1. සියලු සාපරාධී ක්‍රියාවන්ගෙන් වැළකී අවි බිම තබා ඉස්ලාමීය රාජ්‍යයේ සාමකාමී පුරවැසියන් ලෙස ජීවත් වීම හෝ,

2. ඉස්ලාමය වැළඳ ගැනීම හෝ,

3. ඉහත සඳහන් කිසිදු කොන්දේසියක් පිළිනොගන්නේ නම් මාස හතරක කාලයක් තුළ ඉස්ලාමීය රාජ්‍ය පාලන ප්‍රදේශයෙන් ඉවත්ව යෑම.

අප විසින් අවධානය යොමු කළ යුතු වැදගත් කරුණක් වනුයේ විශේෂයෙන්ම මක්කා නගරයේ ජීවත් වූ වසර 10ක කාල වකවානුවේ හා ඉන් පසුවත් මුස්ලිම් ජනයාට කළ හැකි සියලු ආකාරයේ සාපරාධී ක්‍රියාවන්හි නියැලුණු මක්කාවාසී කුරෙෂ් ගෝත්‍රිකයින් පිළිබඳව මක්කා නගරය මුස්ලිම්වරුන්ගේ පාලනයට පත් වූ අවස්ථාවේ මුහම්මද් තුමාණන් ක්‍රියා කළ ආකාරය පිළිබඳවය.

මුහම්මද් තුමාණන් තමන්ගේ හමුදාවට උපදෙස් දී තිබුණේ තමන් සමග අවි ගැටුමකට එන පිරිස සමග පමණක් සටන් කරන ලෙසටය. ඉස්ලාමයේ පරම සතුරෙකු වූ අබූ සුෆ්යාන් කුරෙෂ් ගෝත්‍රිකයින් අතරේ පිළිගත් නායකයෙක් විය. මක්කා නගරය ඉස්ලාමිකයින්ගේ පාලනයට පත් වූ දිනයේ මුහම්මද් තුමාණන් කුරෙෂ් ගෝත්‍රිකයින්ව අමතමින් පහත සඳහන් කරුණු ඔවුන් වෙත ඉදිරිපත් කරන ලදී.

1. අබූ සුෆ්යාන්ගේ නිවසේ ආරක්ෂාව පැතූ පිරිස ආරක්ෂිතය.

2. අවි බිම තැබූ පිරිස ආරක්ෂිතය.

3. තම නිවස තුළ රැඳී සිටියවුන් ආරක්ෂිතය.

මුස්ලිම්වරුන්ගේ ශ්‍රේෂ්ඨතම ජයග්‍රහණය ලෙස සැලකෙන මක්කා නගරය තම පාලනයට පත් වූ දිනයේ දී තමන් ඉතාම ශක්තිමත්ව සිටි මොහොතේ දී වත් කිසිවෙකුට ඉස්ලාමය වැළඳ ගන්නා ලෙස බලකරනු නොලැබීය. යටත් වුණු ජනයාට ඉහත කොන්දේසි හැර කිසිවක් ඉදිරිපත් කරනු නොලැබීය. ඉස්ලාමිකයින්ව ඝාතනය කොට ඔවුන්ට එරෙහිව කළ හැකි සියලු ආකාරයේ අපරාධයන් සිදු කරමින් හා අති භයානක භීෂණයක් මුදාහරිමින් කටයුතු කළ අපරාධකාරී කුරෙෂ් ජනයා තමන්ට ඉතා භයානක දඬුවම් වලට මුහුණ පාන්නට සිදුවේවි යැයි බියෙන් තැති ගෙන සිටි අවස්ථාවේ මුහම්මද් තුමාණන්ගේ ආමන්ත්‍රණයට ඇතුළත් වූ පහත සඳහන් කොටස එතුමාණන්ගේ ශ්‍රේෂ්ඨත්වය වඩාත් ඉස්මතු කර පෙන්වයි.

"අද දින නුඹලා සියලු දෙනාම නිදහස් ය. නුඹලා වෙත කිසිදු චෝදනාවක් ඉදිරිපත් කරනු නොලැබේ. මහා කාරුණික අල්ලාහ් නුඹලා සැමට සමාව දෙනු ඇත. අල්ලාහ් කාරුණිකත්වයේ උල්පතය."

මෙම හදීස් වැකිය පිළිබඳ අනිසි බියක් ඇති කිරීමට ඉතා වංචනික අයුරින් කටයුතු කරමින් සිටින ඉස්ලාම් විරෝධී පිරිස තවත් හදීස් මූලාශ්‍රයක සඳහන් කොටසක් උපුටා දැක්වීම චේතනාන්විතව පැහැර හැර ඇති බව දැක්විය යුතුව ඇත.

"අල්ලාහ් හැර නැමදුමට සුදුසු අන් කිසිවෙකු නොමැත, මුහම්මද් අල්ලාහ්ගේ ගැත්තා හා ධර්ම දූතයා යන්න ප්‍රකාශ කරන තුරු හා 'සලාතය'(පස්වේ නැමදුම) ස්ථාපිත කොට 'සකාතය (දුගීන්ට පිරිනැමිය යුතු අනිවාර්ය දන්දීම)' දෙන තුරු ජනයා සමග සටන් කිරීමට (අල්ලාහ් විසින්) මට නියෝග කොට ඇත. ඔවුන් එසේ කරන්නේ නම් ඉස්ලාමීය නීතියට අනුව හැර ඔවුන්ගේ වස්තුව හා ජීවිත මගෙන් ආරක්ෂා සහිතය. ඔවුන්ගේ ක්‍රියා පිළිබඳ ගිණුම අල්ලාහ් සතුය යනුවෙන් පවසා (අල් කුර්ආනයේ 88 වැනි පරිච්ඡේදයේ 21-22 වැකිය වූ) "එබැවින් (**නබි**වරය,) නුඹ උපදෙස් දෙවූ. සැබැවින්ම නුඹ හුදෙක් උපදෙස් දෙන්නෙකු පමණය. (22) ඔවුන් කෙරෙහි නුඹ බල කරන්නෙකු නොවේ." යැයි පාරායනය කර පෙන්වන ලදී" (මූලාශ්‍ර: තිර්මිදී 5 වන වෙළුම 44 වැනි පරිච්ඡේදය හදීස් අංක 3341 - සහීහ් මුස්ලිම් 1 වන පරිච්ඡේදය හදීස් අංක 35).

දහම පිළිබඳව කිසිදු ආකාරයක බලපෑමක් කිරීම අල් කුර්ආනයේ ඉගැන්වීම් අනුව සහමුලින්ම තහනම් ක්‍රියාවකි. මේ පිළිබඳව ඉහත අප සඳහන් කර ඇත්තෙමු.

මේ පිළිබඳව ඉතා ප්‍රායෝගික උදාහරණයක් ඔබගේ අවධානය පිණිස ඉදිරිපත් කරන්නට කැමැත්තෙමු. මෙරට තුල එල්.ටී.ටී.ඊ. ක්‍රියාකාරකම් පැවති 2005 වර්ෂයේදී ආරක්ෂක අංශය විසින් උතුරට පහර දෙන ලෙස නියෝගයක් නිකුත් කිරීම සාමාන්‍ය සිද්ධියකි. නමුත් මෙයින් අදහස් වන්නේ උතුරේ ත්‍රස්තවාදී ක්‍රියාකාරකයින්ට එරෙහිව හමුදා මෙහෙයුමක් දියත් කරන ලෙසය. එයින් ඔබ්බටත් සිදුවීම් දෙස අවධානය යොමු කළ විට පුනරුත්ථාපනය වූ එල්.ටී.ටී.ඊ. සාමාජිකයින් හා සාමාන්‍ය ද්‍රවිඩ ජනයා කෙරෙහි එම නියෝගය කිසිසේත්ම වලංගු නොවන බව අප සැවොම දන්නා කරුණකි. මෙ අනුව එක් නිශ්චිත අවස්ථාවක නිශ්චිත හේතු පදනම් කොට ගෙන නිකුත් කරන ලද නියෝග සැමදා සැම විට සැමට බල නොපාන බව පැහැදිලි කරුණකි. ඉහත නියෝගය පදනම් කරගෙන වර්ෂ සියයකට පසු උතුරේ සියලු ජනයා ඝාතනය කිරීමට ආරක්ෂක අංශය විසින් නියෝගයක් නිකුත් කළ බව යමෙක් පවසන්නේ නම් එහි ඇති අර්ථ විකෘති භාවය අවබෝධ කර ගැනීම ඕනෑම අයෙකුට කළ හැකි දෙයකි. මෙසේ තිබියදී වර්ෂ 1400 කට පෙර නිශ්චිත හේතු මත පැවසූ ප්‍රකාශයක් ඓතිහාසික සන්දර්භයෙන් බැහැරව කෙසේ නම් වර්තමානයට අදාළ දෙයක් ලෙස හුවා දක්වන්නට කටයුතු කළ හැක්කේ ද කියා අසන්නට කැමැත්තෙමු.

**(16) චෝදනාව** : කුරාණය 2:190 සඳහා එම පිටුවේම පසු වදනක් ලෙසින් ජිහාඩය සඳහා සපයා ඇති අර්ථකථනය.

"ජිහාඩ් යනු අල්ලාහ්ගේ අරමුණු වෙනුවෙන් ප්‍රචණ්ඩත්වය (ත්‍රස්තවාදය) සහ පූර්ණ බලය සහ ආයුද සන්නද්ධව අල්ලාහ්ව සහ මොහොමද්ව (එනම් ඉස්ලාමය) විශ්වාස නොකරන්නවුන්ට (එනම් අන්‍යාගමික ජන සමාජයට) විරුද්ධ ව මුස්ලිම්වරුන් විසින් කළයුතු වන ශුද්ධ වූ යුද්ධයයි. ජිහාඩය ඉස්ලාමයේ ඉතාම වැදගත් වූ ක්‍රියාවලියකි. එය ඉස්ලාමයේ ඇති එක් බල කණුවකි. ජිහාඩය හරහා ඉස්ලාමය ස්ථාපිත කරන්නේය. එය අල්ලාහ්ගේ වචනයට උත්තරීතර භාවය ලබා දෙන්නේය. එමෙන්ම ජිහාඩය මගින් ඉස්ලාමය ප්‍රචලිත කරන්නේය. ජිහාඩය අත හැරියහොත් ඉස්ලාමය විනාශ වන්නේය. එසේම මුස්ලිම්වරුන් බල රහිත බෙලහීන තත්ත්වයට ඇද වැටෙන්නේය. මුස්ලිම්වරුන්ගේ අභිමානය / ආඩම්බරකම / බල මහිමය නැති වන්නේය. ඔවුන්ගේ භූමිය අන්‍යයන් සොරකම් කරන්නේය. මුස්ලිම්වරුන්ගේ බල අධිකාරිය සහ අන්‍යය ආගමිකයින් ඉස්ලාමයට යටත් කරගැනීමේ හැකියාව විනාශ වී යන්නේය. ජිහාඩය සෑම මුස්ලිම්වරයෙකුගේම අනිවාර්ය යුතුකමක් සහ බන්ධනීය වගකීමක් ය. කිසිවෙකු හෝ එම වගකීම මගහරින්නේ නම් / නොකරන්නේ නම් ඔහු මියයන්නේ මිත්‍යා දෘෂ්ටිකයෙකු ලෙසය".

**විග්‍රහය** : පළමුව මෙම 2:190 වන අල් කුර්ආන් වැකියේ නිවැරදි සිංහල අර්ථ දැක්වීම කෙරෙහි අවධානය යොමු කරමු.

"කවරෙකු නුඹලා සමග යුද වදින්නේ ද ඔවුන් සමග අල්ලාහ්ගේ මාර්ගයෙහි නුඹලා යුද වදිවූ. නමුත් නුඹලා සීමාව ඉක්මවා නොයවූ. සැබැවින්ම අල්ලාහ් සීමාව ඉක්මවා යන්නන්ව ප්‍රිය නොකරයි." (අල් කුර්ආන් 2:190)

බුද්ධිමය සංවාදයකදී මෙවන් ඉතා සාවද්‍ය හා කිසිදු මුලාශ්‍රයක් නොමැති කරුණු ඉදිරිපත් කිරීම නොකළ යුත්තකි. ඔබ ලිපියෙහි මෙය අල් කුර්ආනයේ 2:190 වැනි වැකියට අර්ථ කථනයක් ලෙස දක්වා ඇත. මෙහි මුලාශ්‍රය කුමක් ද? කෙසේ නමුත් මෙහි අල් කුර්ආන් 2:190 වැකිය හා ඉස්ලාමයේ සංකල්පයක් වූ ජිහාදය පිළිබඳ ඉතාම සාවද්‍ය අදහස් කිහිපයක් දක්වා ඇත. එහෙයින් මෙම සාධක දෙක පදනම් කරගෙන විග්‍රහයක් ඉදිරිපත් කරන්නට අපේක්ෂා කරන්නෙමු.

එමෙන්ම "ජිහාදය" යනු "ශුද්ධ වූ යුද්ධය" යැයි අසත්‍ය අර්ථකථනය ලොව හමුවේ තැබීමට උත්සාහ කරන බව පෙනී යන්නෙමු. 'ජිහාද්' යන පදය ශුද්ධ යුද්ධය නොහොත් 'Holy War' යනුවෙන් ඉස්ලාම් නොවන්නන් අතර ප්‍රසිද්ධ වුවද 'Holy War' යන්නෙහි සැබෑ අරාබි පරිවර්තනය වූ 'හර්බ් මුබද්දසා' යන පදය අල් කුර්ආනයේ හෝ නබි වදන් කිසිවක හෝ සඳහන් වී නොමැත. ඉස්ලාමීය පිළිවෙත්, චර්යා හෝ නීති ග්‍රන්ථයන්හි ද මෙම වචනය දක්නට නොමැත. අවාසනාවට මාධ්‍ය විසින් ජිහාද් යන වචනයට සමානාර්ථ පදයන් ලෙස ශුද්ධ යුද්ධය, ධර්ම යුද්ධය යනාදිය උපයෝගි කර ගෙන ඇත. ශුද්ධ යුද්ධය යන පදය මුල් වරට භාවිතයට එන්නේ කිතුනුවන්ගේ ක්‍රියාකාරකම් මුල් කරගෙනය. මේ පිළිබඳව බී.බී.සී. ආයතනය දක්වා ඇති තොරතුරු වෙත අපගේ අවධානය යොමු කරමු.

"හර්බන් II පාප් තුමා විසින් ශුද්ධ භූමියේ පූජනීය ස්ථානයන් අත්පත් කර ගැනීම අරමුණු කොට ගෙන වර්ෂ 1095 දී මුස්ලිම්වරුන්ට එරෙහිව ආරම්භ කරන ලද සන්නද්ධ හමුදා මෙහෙයුම (Crusades) ශුද්ධ යුද්ධය (Holy War) නමින් හඳුන්වන ලදී. (http://www.bbc.co.uk/ethics/war/religious/holywar.shtml)

මේ අනුව 'ශුද්ධ යුද්ධය' යනු මුස්ලිම්වරුන්ට එරෙහිව ආරම්භ කරන ලද්දක් මිස කිසිසේත්ම මුස්ලිම්වරුන්ගේ ක්‍රියාකාරකමක් නොවන බව පැහැදිලි වනු ඇතැ'යි විශ්වාස කරන්නෙමු. **මේ අනුව ජිහාද් යනු 'ශුද්ධ යුද්ධය' නොවේ.**

අල් කුර්ආන් 2:190 වැකියෙන් දක්වා ඇති ශ්‍රේෂ්ඨ ඉගැන්වීම් විමසා බලමු. මෙහි ඉතාම පැහැදිලි මග පෙන්වීම් දෙකක් ලබා දී ඇත. එනම් :

1. තමන් සමග සටන් වදින්නන් සමග පමණක් සටන් වැදීම මෙම වැකියේ ප්‍රධානතම උපදේශයයි. මේ අනුව ඕනෑම අයෙකු සමග සටන් කිරීමට ඉස්ලාමිකයින්ට අවසරයක් නොමැත.

2. එසේ සටන් වැදීමේ දී සීමාව ඉක්මවා කටයුතු නොකිරීමට වග බලාගත යුතුය යන්න ද මෙහි තවත් වැදගත් උපදේශයකි. වර්තමානයේ යුද ගැටුම්හි නිරත බොහෝ හමුදා තම සීමාවන් ඉක්මවා ගොස් අහිංසක සිවිල් වැසියන් හා පූජකවරුන් ඝාතනය කිරීම, කාන්තාවන් දූෂණය කිරීම, පූජනීය ස්ථාන හා නිවෙස් විනාශ කිරීම යනාදිය සාමාන්‍ය සිදුවීම් බවට පත් වී ඇත. මෙලෙස හැසිරීමට ඉස්ලාමිකයින්ට කිසිසේත්ම අනුමැතියක් නොමැත.

මෙම ඉගැන්වීම් සමග ඕනෑම අයෙකුට තිබිය හැක්කේ කුමන ආකාරයේ ගැටළුවක්දැ'යි විමසන්නට කැමැත්තෙමු.

මේ අනුව ජිහාදය පිළිබඳ මතු වන්නා වූ සැකයන් දුරලා සැබෑ ජිහාදය යනු කුමක් දැ'යි විවෘත දැසින් බැලීම අනිවාර්යය වනු ඇත.

## ජිහාද්හි සැබෑ අර්ථය

ජිහාද් යන අරාබි වචනයේ භාෂාමය අර්ථය ප්‍රයත්නය, වෑයම, ආයාසය, උත්සාහය යන පදයන්ගෙන් එක්තරා ප්‍රමාණයකට හුවා දැක්විය හැකිය. ඉස්ලාමීය ව්‍යවහාරයේ ජිහාද් යනු හුදෙක් ප්‍රයත්නය යන අර්ථය පමණක් ගෙන දෙන්නක් නොවේ. එය යහ විපාක අපේක්ෂාවෙන් දෙවිඳුන්ගේ (අල්ලාහ්ගේ) තෘප්තිය උදෙසා කරන්නා වූ නැමදුමක් ද වෙයි. මේ අනුව අල්ලාහ්ගේ තෘප්තිය උදෙසා කරන්නා වූ සියලු යහ ප්‍රයත්නයන් ජිහාද් යනුවෙන් විග්‍රහ කිරීම නිවැරදිය. තවත් අතකින් පීඩාකාරී, හිංසාකාරී හා දුෂ්කරත්වය මැද දහමේ නියමයන්ට පටහැණි නොවී යුක්තිය ස්ථාපිත කිරීම සඳහා කරන්නා වූ ප්‍රයත්නය ජිහාදය ලෙස විග්‍රහ කළ හැක. ජිහාදයේ අනු ප්‍රභේද කිහිපයක් ඉස්ලාමීය විද්වතුන් විසින් විස්තර කොට ඇතත් බහුතරයේ මතය අනුව එහි ප්‍රභේද පහක් ලෙස පහතින් දක්වා ඇත.

චෛතසිකයෙන් කරන්නා වූ ජිහාදය (ජිහාද් බින් නෆ්ස්/බල්බ්)

දිව උපයෝගි කරගෙන කරන්නා වූ ජිහාදය. (ජිහාද් බිල් ලිසාන්)

පෑන/දැනුම උපයෝගී කරගෙන කරන්නා වූ ජිහාදය (ජිහාද් බිල් බලම්/ඉල්ම්)

දෑත උපයෝගී කරගෙන කරන්නා වූ ජිහාදය (ජිහාද් බිල් යද්)

අසිපත (ආයුධ) උපයෝගී කරගෙන කරන්නා වූ ජිහාදය (ජිහාද් බිස් සෙයිෆ්)

මේවා හැරෙන්නට විවිධ ඉස්ලාම් විරෝධී පාර්ශවයන් විසින් ඔවුන්ගේ මනඃකල්පිත මතවාදයන් ඉදිරිපත් කරමින් "මනෝමය ජිහාදයක්" පිළිබඳව අදහස් දක්වති. එය ඔවුන්ගේ හුදු මනඃකල්පිතයක් පමණක් මිස අන් කිසිවක් නොවන බව අවධාරණයෙන් පවසන්නට කැමැත්තෙමු.

ඉහත සඳහන් ජිහාද් ප්‍රභේදයන් පිළිබඳව විස්තර විමසා බලමු.

## චෛතසිකයෙන් කරන්නා වූ ජිහාදය (ජිහාද් බින් නෆ්ස්/බල්බ්)

ඉස්ලාමීය ඉගැන්වීම් අනුව විවිධ අවස්ථාවන්හි දී ශ්‍රේෂ්ඨතම ජිහාදය (ජිහාද් අල් අක්බර්) කුමක් ද කියා පැහැදිලි කොට ඇත. වරෙක ශ්‍රේෂ්ඨතම ජිහාදය තම චෛතසිකයේ මතුවන අකුසලයට නැඹුරු වූ හැඟීම් සමග චෛතසික අරගලයක යෙදීම බව ඉස්ලාමය උගන්වයි(මුස්නද් අහ්මද් 24004). මෙම ක්‍රියාවලිය මගින් කෙනෙකුගේ චෛතසිකය පාරිශුද්ධත්වයට පත්කොට අභ්‍යන්තර සාමය ළඟාකර ගනිමින්

කෝපය හා වෛරය පිටුදකින තත්ත්වයක් උදා කරගැනීමට හැකි වන්නේය. මිනිසාගේ ශ්‍රේෂ්ඨ පැවැත්ම හා සාරධර්ම සපිරි යහ ජීවිතය සහතික කළ හැක්කේ චිත්ත පාරිශුද්ධිය මගිනි.

මෙම 'ජිහාද්' ප්‍රභේදය සහමුලින්ම තම චෛතසිකය සමග කරන්නා වූ සටනකි, අරගලයකි. ඉස්ලාමයට අනුව සැබෑ සොල්දාදුවා තම චෛතසිකය සමග සටන් කරන්නාය.

## දිව උපයෝගි කරගෙන කරන්නා වූ ජිහාදය. (ජිහාද් බිල් ලිසාන්)

සමාජයේ සිදු වන වැරදි, අපයෝජන හා දූෂණයන්ට එරෙහිව හා නැගීම, සත්‍යය අන් අයට පැහැදිලි කර දීමට හා යහ මගට ජනයාව ආරාධනා කරන්නට කරන්නා වූ දේශන, සාකච්ඡා, සංවාද ආදිය මෙයට අන්තර්ගත වේ. අසාධාරණ දුෂ්ට පාලකයෙකු ඉදිරියේ නිර්භයව සත්‍යය ප්‍රකාශ කර සිටීම ශ්‍රේෂ්ඨ ජිහාදයක් බව ඉස්ලාමය අපට උගන්වයි. (මූලාශ්‍රයඃ සුනන් අත් තිර්මිදී/ වෙළුමඃ8/ පිටුවඃ345)

## පැන/දැනුම උපයෝගී කරගෙන කරන්නා වූ ජිහාදය (ජිහාද් බිල් බලම්/ඉල්ම්)

ලොවෙහි සිදුවන අයුක්තියට හා අසාධාරණයට එරෙහිව කටයුතු කිරීම, ඉස්ලාමයට එරෙහිව මතු කරන්නා වූ චෝදනා හා වැරදි මතයන් හෝ දුර්මතයන් පිළිබඳව යහ හා නිවැරදි අයුරින් කරුණු පහදා දීම උදෙසා කරන්නා වූ විද්වත් ගවේෂණයන් මෙන්ම ඉස්ලාමය පහසුවෙන් අවබෝධ කරගැනීමට උපකාරී වන අයුරින් ලිපි හා ග්‍රන්ථයන් සකස් කිරීමට කටයුතු කිරීම මෙයට ඇතුළත්ය. යුක්තිය, සාධාරණය හා දහම වෙනුවෙන් ප්‍රාණත්‍යාගිත්වයේ යෙදෙන්නාගේ රුධිරයට වඩා විද්වතාගේ තීන්ත ශ්‍රේෂ්ඨය. ඉස්ලාමයට එරෙහිව නැගෙන මෙවන් චෝදනාවන්ට නිවැරදි කරුණු විග්‍රහ කොට සත්‍යය පහදා දීමට අප විසින් ඉදිරිපත් කර ඇති පොත් පිංචද මෙම ජිහාද් ප්‍රභේදයට අන්තර්ගතය.

## දෑත උපයෝගී කරගෙන කරන්නා වූ ජිහාදය (ජිහාද් බිල් යද්)

මෙම ප්‍රභේදය භෞතික ක්‍රියාකාරකම් සමග පදනම් වූ ප්‍රයත්නයකි (ජිහාදයකි). අසරණයින්ට හා දුගීන්ට පිහිට වීම, ඩෙංගු වැනි වසංගත රෝග මැඩලීම සඳහා හා ජනයාට ප්‍රයෝජනවත් අන් ශ්‍රමදාන කටයුතු, 'සකාත්' නම් වූ දුගීන්ට පිරිනැමිය යුතු අනිවාර්ය දන්දීම හා 'සදකා' නම් වූ වෛකල්පීය දන්දීම්, 'හජ්' හා 'උම්රා' නම් වූ ආගමික වතාවත් ඉටු කිරීම මෙයට ඇතුළත්ය. වරෙක යුද තත්ත්වයක් ඇති වූ අවස්ථාවක මුහම්මද් තුමාණන්ගේ සහගාමියෙකු පැමිණ තමන්ගේ දෙමව්පියන් වයෝවෘධ තත්ත්වයේ සිටින හෙයින් යුද බිමට යෑම හා දෙමාපියන් බලාගැනීම අතුරින් ඔහු විසින් තෝරා ගත යුත්තේ කුමක්දැ'යි විමසූ විට දෙමාපියන්ට උවැටන් කරමින් ඔවුන්ගේ විෂයයෙහි ජිහාද් කරන ලෙස දන්වා සිටින ලදී. (මූලාශ්‍රය ඃ බුහාරී 3004)

## අසිපත (ආයුධ) උපයෝගී කරගෙන කරන්නා වූ ජිහාදය (ජිහාද් බිස් සෙයිෆ්)

සාමය, යුක්තිය හා සාධාරණය වෙනුවෙන් අසිපතින් ජිහාදයක (ප්‍රයත්නයක) නියැලීමට සමහර අවස්ථාවන්හි අවශ්‍ය වේ. අසිපතින් ජිහාදයක නියැලීමට හැක්කේ අවස්ථාවන් දෙකක පමණය. මෙම අවස්ථාවන් දෙකෙහි දී සටනට පිවිසීම අල් කුර්ආන් ඉගැන්වීම් අනුව අනිවාර්ය කොට තිබේ.

- සුරක්ෂාවරණ ජිහාදය හා ආක්‍රමණික ජිහාදය

ඔබගේ රටට එරෙහිව පහර දුනහොත් ඉස්ලාමය හා ආත්මාරක්ෂාව පදනම් කරගෙන සටනට පිවිසීම. මෙය පුද්ගල හෝ කණ්ඩායම් ගැසී පදනම් විරහිත ලෙස ගන්නා තීන්දුවක් මත සිදු නොවන්නකි. රාජ්‍ය හෝ වගකීම් සහිත ජනතා නායකත්වය හා මග පෙන්වීමක් මත මෙය සිදුවිය යුතුය. මෙය 'සුරක්ෂාවරණ ජිහාදය' ලෙස හැඳින් වේ. මෙම ජිහාද් පිළිවෙත පිළිබඳව අල්ලාහ් අල් කුර්ආන්යේ මෙසේ සඳහන් කරයි.

"කවරෙකු නුඹලා සමග යුද වදින්නේ ද ඔවුන් සමග අල්ලාහ්ගේ මාර්ගයෙහි නුඹලා යුද වදිවු. නමුත් නුඹලා සීමාව ඉක්මවා නොයවු. සැබැවින්ම අල්ලාහ් සීමාව ඉක්මවා යන්නන්ව ප්‍රිය නොකරයි." (අල් කුර්ආන් 2:190)

- ලොවෙහි සිදුවන අපරාධ, අවනීතිය, දුෂ්ටකම්, ත්‍රස්තවාදය, ආදියට එරෙහිව ඉස්ලාමීය රාජ්‍යයක් විසින් ගන්නා වූ යුධමය පියවරක් ලෙස දෙවන අවස්ථාව නම් කළ හැක.

දුෂ්ටකම් හා අසාධාරණය සිදුවන බව පෙනී පෙනී නිහඬ වීමට ඉස්ලාමීය රජයකට අනුමැතිය නොමැත. ස්ත්‍රී බලහත්කාරකම්, ළමා අපයෝජන, මත්කුඩු හා මත්ද්‍රව්‍ය, සොරකම, ත්‍රස්තවාදය, අසාධාරණ

පහර දීම් වැනි දෑ පැතිරෙමින් තිබෙන තත්ත්වයක නිහඬ විය හැක්කේ කිනම් ඉස්ලාමීය රජයකට ද? ස්වභාවික නීතිය උල්ලංඝනය නොකොට මේවාට එරෙහිව කටයුතු කිරීම අපගේ වගකීමයි.

සතුරාගේ ආධිපත්‍යය හා බල මහිමය බිඳ දමා සතුරාගේ දුෂ්ටකම්, පීඩාව හා මැරවරකම් අවසන් කොට සාමය, යුක්තිය හා සාධාරණය ස්ථාපිත කරන තුරු ජිහාදයේ නියැළීම ඉස්ලාමීය රජයකට අනිවාර්ය වන්නේය. මෙය "ආක්‍රමණික ජිහාදය" ලෙස හැඳින් වේ. මෙම ජිහාද් පිළිවෙත පිළිබඳව අල්ලාහ් අල් කුර්ආනයේ සඳහන් කරයි.

"අපගේ පරමාධිපතියාණනී, අපරාධ කරමින් සිටින්නා වූ වැසියන්ගෙන් යුත් මෙම නගරයෙන් අපව ඉවත් කරනු මැනව! ඔබගෙන් වූ ආරක්ෂකයෙකු අප වෙනුවෙන් පත් කරනු මැනව! තවද ඔබගෙන් වූ උදවුකරුවෙකු අප වෙනුවෙන් පත් කරනු මැනවැ!"යි පවසා සිටින දුර්වලත්වයට (පත් කර හිංසාවට) ලක් කරනු ලැබූ පුරුෂයින්, ස්ත්‍රීන් හා ළමුන් වෙනුවෙන් අල්ලාහ්ගේ මාර්ගයේ නුඹලා සටන් නොවැද (නිහඬව) සිටීමට නුඹලාට කුමක් වී ද?" (අල් කුර්ආන් 4:75)

මේ අනුව ජිහාද් යනු :

1. තම මනසේ ඇතිවන වැරදි හා අකුසලයට නැඹුරු වූ සිතුවිලි සමග සටන් කොට චිත්ත පාරිශුද්ධිය ඇති කර ගැනීමට කටයුතු කිරීම ජිහාද් වේ.

2. ලොවෙහි සිදුවන අපරාධ, දුෂ්ටකම් මෙන්ම ඉස්ලාම් විරෝධී ක්‍රියාවන්ට එරෙහිව හඬ නැඟීම ජිහාද් වේ.

3. ලොවෙහි සිදුවන අපරාධ, දුෂ්ටකම් මෙන්ම ඉස්ලාම් විරෝධී ක්‍රියාවන්ට එරෙහිව ලිඛිතව ප්‍රයත්න දැරීම ජිහාද් වේ.

4. ශරීරය යහපත් ක්‍රියා සඳහා උපයෝගී කිරීම හා දෙවිඳුන් විසින් ලබා දී ඇති වරප්‍රසාදයන් හා සම්පත් යහ ක්‍රියාවන් සඳහා වැය කිරීම ජිහාද් වේ.

5. රාජ්‍යයකට පහර දුන්විට එම රාජ්‍යය ආරක්ෂා කිරීම හා සතුරාගේ ආධිපත්‍යය හා බල මහිමය බිඳ දමා සතුරාගේ දුෂ්ටකම්, පීඩාව හා මැරවරකම් අවසන් කොට ලොවෙහි සාමය ස්ථාපිත කිරීම ජිහාද් වේ.

මේ අනුව ශ්‍රී ලාංකේය මුස්ලිම්වරුන්ට අදාළ වන්නේ ඉහත 1 සිට 4 දක්වා වූ ජිහාද් ප්‍රභේද පමණක් වන අතර යුක්තිය සාධාරණය සඳහා වූ ආක්‍රමණශීලී හා සුරක්ෂාවරණය සඳහා කරන්නා වූ 5 වැනි ප්‍රභේදය රාජ්‍ය අනුග්‍රහයකින් තොරව ශ්‍රී ලාංකේය මුස්ලිම්වරුන්ට අදාළ නොවන බව බුද්ධිමත්ව හා යථාර්ථයෙන් කරුණු විමසුමක යෙදෙන ඕනෑම අයෙකුට පැහැදිලිව පෙනෙන්නට ඇති සත්‍යයකි. එසේ නම් 'ජිහාදය' පදනම් කරගෙන 'මුස්ලිම් භීතිකාවක්' හා 'මුස්ලිම් පිළිකුලක්' ඇති කිරීමට වෙර දැරීම අර්ථ ශූන්‍ය පදනම් විරහිත ප්‍රයත්නයක් පමණක් බව සනාථ වෙනවා නොවේද? යහ මිනිසෙකු වශයෙන් සෑම මුස්ලිම්වරයෙකුටම අනිවාර්ය වන 1 සිට 4 දක්වා වූ ජිහාද් ප්‍රභේද පිළිබඳව ඉදිරිපත් කළ හැකි විවේචන කුමක් ද කියා දැන ගන්නට කැමැත්තෙමු. විවේචන ඇත්නම් අප වෙත යොමු කරන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

## (17) චෝදනාව :

48:19 "තවද මුස්ලිම්වරුන් විසින් මුස්ලිම් නොවන සමාජයන් විනාශ කරමින් ඔවුන්ගේ වස්තුව දේපල සහ සම්පත් සියල්ල විශාල ප්‍රමාණයන්ගෙන් අත්පත් කර ගන්නේය. එබැවින් අල්ලාහ් සැමදා මහා බලගතුය, මහා ප්‍රඥාවන්තයාය."

**විග්‍රහය** : පළමුව මෙම කුර්ආන් වැකියේ නිවැරදි සිංහල අර්ථ දැක්වීම වෙත අවධානය යොමු කරමු.

"තවද යුද්ධයෙන් ජය ගත් වස්තූන් අධික වශයෙන් (ද ඔවුනට ස්ථිර කළේය.) ඔවුහු ඒවා ලබා ගන්නෝය. තවද අල්ලාහ් අති බලසම්පන්න හා සර්ව ප්‍රඥාවන්තය. (20) (යුද බිමේ දී සතුරන්ගෙන්) අත්පත් කරගත් වස්තූන් අධික වශයෙන් අල්ලාහ් නුඹලාට ප්‍රතිඥා දී තිබුණි. නුඹලා ඒවා ලබා ගන්නෝය. මෙය නුඹලාට ඔහු ඉක්මන් කළේය. තවද විශ්වාසිකයින්ට සංඥාවක් වනු පිණිස ද ඔහු නුඹලාව ඍජු මග රැගෙන යනු පිණිස ද (නුඹලාගේ සතුරු) ජනයින්ගේ දෑත් නුඹලා වෙතින් වළක්වාලීය." (අල් කුර්ආන් 48:19)

මෙම වැකියෙහි 'ගනීමත්' (යුද්ධාජුද වස්තූන් හෙවත් යුද බිමේ දී සතුරන් දමා ගොස් අත් වූ වස්තූන්) පිළිබඳව සඳහන් වී ඇත. මෙයට 'බලෙන් උදුරාගනු ලබන වස්තූන්' යැයි ඇතැමුන් විසින් පරිවර්තනය කර තිබෙන අතර 'මුස්ලිම්වරුන් විසින් මුස්ලිම් නොවන්නන්ගෙන් බලෙන් උදුරාගනු ලබන

වස්තූන් එය මුස්ලිම්වරුන් සතු වූවක්' යැයි ගෙන හැර පෙන්වා ඇත. ඇත්තෙන්ම මෙය ව්‍යාජ ප්‍රචාරයකි. මන්දයත් පළමුව මෙම වැකිය මුස්ලිම් නොවන සෑම කෙනෙකු හා සම්බන්ධ වූවක් නොව මුස්ලිම්වරුන් සමග යුද වදින්නන් පමණක් හා සම්බන්ධ වූවකි. එනම් මුස්ලිම්වරුන් තමන් සමග සටනට පෙලඹෙන්නන්ට එරෙහිව යුද වැද ජයග්‍රහණය කළේ නම් ඔවුන් දමා ගොස් අත් වන වස්තූන් 'ගනීමත්' (හෙවත් යුද බිමේ දී සතුරා දමා ගොස් අත් වූ) වස්තූන් යැයි පැහැදිලි කොට ඇත. ඇතැමුන් පවසන්නාක් මෙන් 'ගනීමත්' යනු 'මුස්ලිම් නොවන ඕනෑම අයෙකුගෙන් උදුරාගනු ලැබූ හෝ පැහැරගනු ලැබූ වස්තූන්' යැයි විග්‍රහ කිරීම නිවැරදි වනවා නම් මුස්ලිම්වරුන්ට මදීනාවේ තමන්ගේ අසල්වැසියන් ලෙස වාසය කළ මුස්ලිම් නොවන්නන්ගේ වස්තූන් බලෙන් තමන් සතු කර ගන්නට තිබිණ. නමුත් ඔවුන් එසේ කටයුතු නොකිරීම 'ගනීමත්' යනු යුද බිමේ දී සතුරන්ව ජය ගැනීමෙන් අනතුරුව අත්වන වස්තූන් බවට පැහැදිලි සාධකයක් වී ඇත.

දෙවනුව 'ගනීමත්' යන පදයට 'බලෙන් පැහැර ගනු ලබන වස්තූන්' යැයි අර්ථකථනය කිරීම වැරදි බව තහවුරු වන්නේය. මන්දයත් අරාබි භාෂාවෙහි 'ගොවිතැන් හෝ ව්‍යාපාර වැනි මුදල් ඉපයීමේ අරමුණින් කරනු ලබන කිසිදු උත්සහයකින් තොරව අත් වන වස්තූන්' වලට 'ගුන්මුන්' යන පදය භාවිත වේ. 'ගනීමත්' යන පදය මෙම පදයෙන් බෙදී ආ එකකි. යුද්ධයේ දී සතුරන්ව ජය ගැනීමෙන් අත් වන වස්තූන් ඉහත සඳහන් වස්තූන් ඉපයීමේ කිසිදු උත්සහයකින් තොරව අත් වන්නේය. එබැවින් මෙයට 'ගනීමත්' යන පදය භාවිත වේ. මෙම පදයට 'බලෙන් පැහැර ගනු ලබන වස්තූන්' යැයි විග්‍රහ කිරීම එම වචනය අනිසි ලෙස භාවිත කිරීමක් වේ. මන්දයත් 'වස්තූන් බලෙන් පැහැර ගැනීම' යනු නීත්‍යානුකූල නොවූවකි. යම් පිරිසක් මුස්ලිම්වරුන්ට විරුද්ධව යුද වැද මුස්ලිම්වරුන් සටනින් ජය ලැබුවේ නම් ඔවුන්ගේ වතු හා කුඹුරු වැනි සම්පත් බලෙන් සතු කර ගැනීම හෝ ඒවා විනාශ කිරීම, ගොඩනැගිලි බිඳ දැමීම, තමන්ට අයිති නොවන අන් අයගේ වස්තූන් තමන්ගේ වස්තූන් මෙන් භාවිත කිරීම ඉස්ලාමීය නීතීන් වලට සහමුලින්ම පටහැණි වූවකි. වරක් මුස්ලිම්වරුන්ගේ සේනාව එක් යුද්ධයක් ජය ගත් අවස්ථාවේ එළුවන් කිහිපයක් අනිසි ලෙස අත් කර ගෙන ඒවා කපා උයන්නට ද වූහ. නබි මුහම්මද් තුමාණන් එතැනට පැමිණි විට එම සිද්ධිය දැක කෝපයට පත් වී ඔවුන් පිසමින් සිටි භාජන පෙරළා දමා එම එළුවන් දහය වෙනුවට මහත් ඔටුවෙකු දී හානිය පියවූවේය.

'ගනීමත්' හෙවත් යුද බිමේ දී සතුරන් දමා ගොස් අත් වූ වස්තූන් සතු කර ගැනීමේ නීතිය නම් යුද්ධයේ දී ජයගත් වස්තූන් සියල්ල රජය වෙත රැස් කළ යුතුය. ඉන් පසුව එයින් පහෙන් කොටසක් රජයේ පොදු භාණ්ඩාගාරයට සතු වේ. එම කොටස පොදු භාණ්ඩාගාරයේ නීතියට අනුව මුස්ලිම්වරුන් හා මුස්ලිම් නොවන්නන් යන කිසිදු භේදයකින් තොරව රට වැසියන් වෙනුවෙන් වියදම් කරනු ලැබේ. එම කාලයේ සෙබළුන්ට නියමිත වැටුප් නොතිබුණ හෙයින් එයින් ඉතිරි කොටස් හතර ඔවුනතර බෙදා දෙනු ලැබිණ. ඇතැම් අවස්ථාවන් වල පොදු සුභසාධක කටයුතු සැලකිල්ලට ගෙන රජය විසින් ඉතිරි කොටස් හතරෙන් යම් ප්‍රමාණයක් රඳවා තබා ගත හැකිය.

- ❖ මේවා තුළින් කරුණු දෙකක් ඉතා පැහැදිලිවම දිස් වන්නේය.
    - I. පළමුවැන්න 'ගනීමත්' යනු සෑම මුස්ලිම් නොවන්නන්ගේ වස්තූන් හෝ පැහැර ගන්නා ලද වස්තූන් හෝ නොවේ. එයට වෙනස්ව සතුරන්ට එරෙහිව සටන් කර ඔවුන් විසින් හැර දමා ගොස් තිබූ වස්තුව සතු කර ගැනීමයි.
    - II. දෙවැන්න මෙම 'ගනීමත්' වස්තූන් අතුරින් කුමන දැයක් කාගේ දෑතට හසු වන්නේ ද ඔහුට එය සතු කර ගත නොහැකිය. එනමුත් එයට කෙනෙකු අයිතිකරු විය හැක්කේ නීත්‍යානුකූලවය.

කිසියම් රටක් තවත් රටක් සමග යුද වැද ජය ලැබුවේ නම් ජය ලැබූ රට පරාජිත වූ රටෙන් අත් කර ගත් වස්තූන් තමන් සතු කර ගෙන එය බෙදා දීම හෝ භාවිත කිරීම වර්තමානයේ ද ලොවෙහි දක්නට ඇති සාමාන්‍ය කරුණකි. එනමුත් යුද්ධයෙහි ජය ගත් සේනාවක් තම සතුරු සේනාවේ වස්තූන් අත් කර ගැනීමට ඉස්ලාමයෙහි අනුමැතිය දී තිබුණ ද එය අත් කර ගැනීම අනිවාර්යය නොවන අතර එය පරාජයට පත් අයගේ අයිතිය යටතේම අත් හැර දැමිය හැකිය. යුදෙව්වන් සමග සිදු වූ 'හයිබර්' නම් යුද්ධය අවස්ථාවේ දී නබි මුහම්මද් තුමාණන් 'ගනීමත්' වස්තූන් විෂයෙහි ක්‍රියා කළේ එලෙසය.

## (18) චෝදනාව ඃ

"අල් ටබරී, වෙළුම VI, පිටුව 101ඃ 'අප කිසිදිනෙක නොදුටු සහ අප්‍රසන්න දේ මොහොමද්ගේ පවිටු ක්‍රියාවන් නිසා අපට විඳින්නට සිදු විය. ඔහු අපගේ පාරම්පරික පෙර සිරිතට නිග්‍රහ සහ අපහාස කළේය.

අපගේ මුතුන්මිත්තන්ට පරිභව කළේය. අපගේ ආගම නින්දා සහගතව විවේචනය කලේය. අපගේ සමාජය බේද බින්න ඇති කොට දෙකඩ කලේය. අපගේ දෙවියන්ට නිග්‍රහ කොට අවමන් කලේය. ඔහුගේ ක්‍රියා කලාපය හරහා අප සමාජය මහා ව්‍යසනයනයකට ගොදුරු විය."

**විග්‍රහය :** ඉහත ඔබ ලිපියෙහි සඳහන් කර ඇති කොටසෙහි සම්පූර්ණ පාඨය පහතින් දක්වා ඇත්තෙමු.

නබි මුහම්මද් තුමාණන් තනිවම සිටින අවස්ථාවක උත්බහ් බින් රබීආ කුරෛෂ්වරුන්ගේ සභාවෙහි සිටින විට මෙසේ පැවසුවේය. : **"මුහම්මද් වෙත මා ගොස් ඔහු ඔහුගේ කාර්යය ඔහු නවත්වා ගනු පිණිස ඔහුට යම් කරුණු ඉදිරිපත් කරන්නට කැමැත්තෙමි. අප වෙනුවෙන් ඔහු මෙයින් පසු බහින්නේ නම් ඔහු කුමක් ප්‍රිය කරන්නේද එය අපි පිරිනමමු."** එවිට රැස්ව සිටි සියල්ලන් ඔහු නැණවත් නායකයෙකුව සිටි හෙයින් **"අබුල් වලීද් (උත්බා බින් රබීආ)! ඔබගේ කැමැත්ත පරිදි ක්‍රියා කරන්න."** යැයි පැවසුවෝය.

පසුව ඔහු නබි මුහම්මද් තුමාණන් වෙත පැමිණ එතුමාණන්ට මෙසේ පැවසුවේය. : **"මාගේ සහෝදරයාගේ පුතනුවනි! ඔබ දැනුවත් පරිදි අපගේ පවුල් අතුරින් හා කුලයන් අතුරින් ඔබ ඉතා උසස් තරාතිරමට අයත් කෙනෙකි. කිසිදු පුද්ගලයෙකු තම සමූහයා වෙත මෙතෙක් නොගෙන ආ දැයක් ඔබ ඔබගේ සමූහයා වෙත ගෙනැවිත් සිටින්නෙහිය. ඔබ අපගේ නැණවත් පුද්ගලයින්ව අඥානයින් බවට පත් කළෙහුය. ඔබ අපගේ මුතුන් මිත්තන්ව මිත්‍යා දෘෂ්ඨිකයින් යැයි පවසන්නෙහුය. ඔබ අපගේ දෙවිවරුන්ට දොස් පවසන්නෙහුය. තවද ඔබ අපගේ එක්සත්භාවය බෙදා වෙන් කර දැමුවෙහුය. මෙවන් ඔබගේ හැසිරීම් සියල්ල ලෞකික වස්තූන් බලාපොරොත්තුවෙන් නම් ඔබට අපගේ වස්තූන් සියල්ල එක්රැස් කර දෙන්නෙමු. නැතිනම් ඔබ නායකත්වය ප්‍රිය කරන්නේ නම් අප ඔබව අපගේ නායකයෙකු ලෙස පත් කරන්නෙමු. තවද ඔබ නොමැතිව කිසිදු කරුණක් අපි තීරණය නොකරන්නෙමු. එසේත් නොමැති නම් මේවා සියල්ල ඔබට අදෘෂ්‍යමාන යක්ෂයෙකුගෙන් වූ බැල්මක් හේතුවෙන් වූයේ නම් අප උපරිම උත්සහයකින් වෛද්‍ය කරන්නෙකුව (ප්‍රතිකාර ලබා ගැනීම සඳහා) ඔබට දන්වන්නෙමු. මන්දයත් එම බැල්ම එම පුද්ගලයාව තමාට අත්හැරිය නොහැකි කරුණු කිරීමට පොළඹවන්නේය."** මේ වන විට නබි තුමාණන් මේවා සියල්ලට සවන් දෙමින් නිහඬව සිටියේය.

ඔහු නිහඬ වූ පසු නබි තුමාණන් : **"අබුල් වලීද් (උත්බා බින් රබීආ)! මා පවසන්නා වූ දැට නුඹ සවන් දෙවු"** යැයි ඔහුට පවසා අල් කුර්ආනයේ "හාමීම් අස් සජදා" නම් සූරහ්වේ පළමුවැනි වැකියේ සිට සුජූද්හි වැකිය දක්වා (අල් කුර්ආන් 41:1-38) පාරායනා කර පෙන්වා අනතුරුව හිස නමා නැමදුම් කළහ.

(1) හා මීම්. (2) (මෙම පුස්තකය) සැමට කරුණාභරිත පරම කරුණාභරිතයාණන් වෙතින් පහළ කිරීමකි. (3) (මෙය) දැනගන්නා වූ පිරිසට අරාබි බසින් වූ පාරායනය කරන්නක් ලෙස එහි වදන් පැහැදිලි කරනු ලැබූ පුස්තකයකි. (4) (තවද මෙය) ශුභාරංචියක් ලෙස ද අවවාදයක් ලෙස ද වේ. එහෙත් ඔවුන්ගෙන් බහුතරය (එයට) පිටුපෑවෝය. එබැවින් ඔවුහු ශ්‍රවණය නොකරන්නෝය. (5) තවද "නුඹ අපව කවර දෙයක් වෙත කැඳවන්නෙහි ද එ(ම විශ්වාස)යට එරෙහිව අපගේ හදවත් ආවරණයෙහිය. අපගේ කන් තුළ අගුලක් ද අප හා ඔබ අතර බාධකයක් ද ඇත. එබැවින් නුඹ (නුඹගේ මාර්ගයෙහි) ක්‍රියා කරවු. සැබැවින්ම අප (අපගේ මාර්ගයෙහි) ක්‍රියා කරන්නන් වෙමු." යැයි ඔවුහු පැවසූහ. (6) (නබිවරය,) නුඹ පවසවු "මම නුඹලා මෙන් මිනිසෙකුමය. නුඹලාගේ දෙවියන් එකම දෙවියෙකු බව මා හට වහී (දේව පණිවිඩ) පහළ කරනු ලැබ ඇත. එබැවින් නුඹලා ඔහු(ට අවනත වීම) වෙත ස්ථිරව සිටිවු. තවද නුඹලා ඔහුගෙන් පාප ක්ෂමාව අයැදිවු. තවද ආදේශ කරන්නන්ට විනාශයකි. (7) ඔවුහු කවුරුන්දයත් zසකාත් (දුගීන්ට පිරිනැමිය යුතු අනිවාර්‍යය දන්දීම) නොදෙන්නන් වෙති. තවද ඔවුහු අවසාන දිනය පිළිබඳව ප්‍රතික්ෂේප කරන්නන් වෙති." (8) සැබැවින්ම කවුරුන් විශ්වාස කර යහකම් කළේ ද ඔවුනට අඛණ්ඩ වේතනයක් ඇත.

(9) (නබිවරය,) නුඹ පවසවු "දින දෙකක් තුළ මිහිතලය මැවූ කෙනාව(අල්ලාහ්ව) නුඹලා ප්‍රතික්ෂේප කර නුඹලා ඔහුට සමගාමීන් ඇති කරන්නේ ද? විශ්වයේ පරමාධිපති ඔහුමය. (10) ඔහු එ(ම මිහිතලයෙ)හි එය ඉහළින් කඳු මුදුන් ඇති කළේය. තවද ඔහු එහි අභිවෘද්ධිය ඇති කර එහි දින හතරක් තුළ ඒවායේ බවභෝග නිර්ණය කළේය. (ඒවා) අයැදින්නන්ට ද (නොඅයැදින්නන්ට ද) එකසේමය.[7] (11) පසුව අහස දෙසට එය දුමක්ව තිබිය දී ඔහු(අල්ලාහ්) අවධානය යොමු කොට එයට ද මිහිතලයට ද "නුඹ දෙපළ කැමැත්තෙන් හෝ අකමැත්තෙන් හෝ (මට අවනත වීම පිණිස) පැමිණෙවු" යැයි පැවසුවේය. ඒ දෙපළ " ඔබට අවනතවන්නන්ව අපි පැමිණියෙමු" යැයි පැවසූහ. (12) පසුව ඔහු අහස් හතක් ලෙස දින දෙකක් තුළ

7) එනම් ලෞකික ජීවිතයේ දී ප්‍රතික්ෂේපක හෝ අල්ලාහ්ව විශ්වාස කළ සියල්ලන්ටම භේදයකින් තොරව ලොවේ සම්පත් පිරිනමනු ලැබේ.

ඒවා සකස් කර, සෑම අහස්තලයෙහි( සිටින දූතයින්ට)ම ඒවාට අයත් නියමයන් දැනුම් දුන්නේය. තවද අප (මිහිතලයට) සමීප වූ අහස, පහන්(තාරකා) මගින් අලංකාර කර ඇත්තෙමු. තවද (අපි එම තාරකා ඇති කළේ අහසට) ආරක්ෂාවක් ලෙසය. මෙය අති බලසම්පන්න සර්වඥයාණන්ගේ නියමයයි."

(13) එබැවින් ඔවුන් පිටුපෑවෙහු නම්, එවිට ආද්වරුන්ගේ හා සමූද්වරුන්ගේ හෙණ හඬ(දඬුවම) මෙන් හෙණ හඬක්(දඬුවමක්) පිළිබඳව නුඹලාට මම අවවාද කරමි" යැයි (නබිවරය,) පවසවු. (14) අල්ලාහ් හැර නුඹලා (වෙනත් කිසිවෙකුට) නැමදුම් නොකරන ලෙස (පවසමින්) ඔවුන්ට ඉදිරියෙන් හා ඔවුන්ට පසුපසින් ඔවුන් වෙත රසූල්වරුන් පැමිණි විට, "අපගේ පරමාධිපති (අප අතරට රසූල්වරයෙකු යැවීමට) අභිමත කළේ නම්, මලක්වරුන් පහළ කර( යව)න්නට තිබුණි. එබැවින් කවර දෙයක් සමග නුඹලා එවනු ලැබුවේ ද සැබැවින්ම අපි (එය) ප්‍රතික්ෂේප කරන්නන් වන්නෙමු" යැයි ඔවුහු පැවසූහ. (15) එබැවින් ආද් සමූහයා පිළිබඳව (සඳහන් කරන්නේ) නම්, ඔවුහු කිසිදු නිරවද්‍යයෙන් තොරව මිහිතලයේ උඩඟුකම් පෑහ. තවද "බලයෙන් අපට වඩා දැඩි වූවන් කවුරුන් දැ?"යි ඔවුහු පැවසූහ. සැබැවින්ම ඔවුන්ව මැවූ අල්ලාහ් ඔවුනට වඩා බලයෙන් දැඩි බව ඔවුහු නොදුටුවෝ ද? තවද ඔවුහු අපගේ සංඥාවන් ප්‍රතික්ෂේප කරමින් සිටියහ. (16) එබැවින් මෙලොව ජීවිතයෙහි අවමානයේ දඬුවම අපි ඔවුනට භුක්ති විඳවනු පිණිස (ඔවුන්ට) අවාසනාවන්ත වූ දිනයන්හි දැඩි (මොර හඬකින් යුත්) සීත කුණාටුවක් ඔවුන් වෙත අපි යැව්වෙමු. සැබැවින්ම මතු ලොව දඬුවම (මෙයට වඩා) දැඩි අවමානයකි. තවද ඔවුන් උදව් කරනු නොලබති. (17) තවද සමූද් සමූහයා පිළිබඳව (සඳහන් කරන්නේ) නම්, ඔවුනට අපි මග පෙන්වූයෙමු. (නමුත්) ඔවුන් යහමගට වඩා (ප්‍රතික්ෂේපයෙන් යුත්) අන්ධභාවය (ප්‍රිය කර) තෝරා ගත්තෝය. එබැවින් ඔවුන් උපයමින් සිටි දෑ හේතුවෙන් නින්දනීය දඬුවමේ මහා හඬ ඔවුන්ව ග්‍රහණය කළේය. (18) තවද විශ්වාස කර බිය භක්තියෙන් සිටියවුන්ව අපි ආරක්ෂා කළෙමු. (19) අල්ලාහ්ගේ සතුරන්(ප්‍රතික්ෂේපකයින්, නිරා) ගින්න වෙත එක්රැස් කරනු ලබන (විනිශ්චය) දින (නුඹ සිහිපත් කරවු). එවිට ඔවුහු (සියලු ප්‍රතික්ෂේපකයින් පැමිණෙන තුරු) රඳවා තබනු ලබන්නෙහුය. (20) කෙතරම් (දුරට)ද යත් ඔවුහු ඒ වෙත පැමිණි වහාම ඔවුන්ගේ ශ්‍රවණ ද ඔවුන්ගේ දෘෂ්ටි ද ඔවුන්ගේ චර්ම(ශාරීරික අවයවයන්) ද ඔවුන් කරමින් සිටි දෑ පිළිබඳව ඔවුනට එරෙහිව සාක්ෂි දරති. (21) "අපට එරෙහිව නුඹලා සාක්ෂි දරනුයේ මන්දැ?"යි ඔවුහු තමන්ගේ චර්මයන්ගෙන් විමසනු ඇත. "සෑම දෙයක්ම කතා කරවන්නා වූ අල්ලාහ් අපව කතා කිරීමට සැලැස්වූවේය" යැයි ඒවා පවසති. නුඹලාව ප්‍රථම වරට මැව්වේ ඔහුමය. ඔහු වෙතමය නුඹලා නැවත යොමු කරනු ලබනුයේ. (22) නුඹලාගේ සවන් හෝ නුඹලාගේ දෘෂ්ටි හෝ නුඹලාගේ චර්ම නුඹලාට එරෙහිව සාක්ෂි දැරීමෙන් (ආරක්ෂා වීමට පාප ක්‍රියාවන් කරන අවස්ථාවේ දී) නුඹලා (ඒවායින්) සැඟවෙන්නන්ව නොසිටියෙහුය. එනමුත් නුඹලා කරන දැයින් බොහෝමයක් සැබැවින්ම අල්ලාහ් නොදන්නේ යැයි නුඹලා සිතූහ.[8] (23) නුඹලාගේ පරමාධිපති පිළිබඳව නුඹලා සිතූ නුඹලාගේ එම (වැරදි) සිතුවිල්ල නුඹලාව විනාශ කර දැමීය. එබැවින් නුඹලා අලාභවන්තයින් අතුරින් විය. (24) ඔවුන් (දඬුවම) ඉවසුව ද, (නොඉවසුව ද) ඔවුන්ගේ නවාතැන නිරයයි. ඔවුන් (අල්ලාහ්ගේ) තෘප්තිය පැතුව ද ඔවුන් තෘප්තිය ලැබූවන් අතුරින් නොවෙති.

(25) තවද අපි මොවුනට (ලෞකික ජීවිතයෙහි ෂෙයිතාන්වරුන් හා මිනිසුන් අතුරින්) සමීපතයින් නියම කළෙමු. (මෙම සමීපත) ඔවුන් මොවුහු අතර තිබෙන දෑ ද මොවුනට පසුව ඇති දෑ ද මොවුනට අලංකාර කර පෙන්වූහ.[9] තවද ජින්වරුන් හා මිනිසුන් අතුරින් මොවුනට පෙර ඉකුත් වී ගිය ප්‍රජාවන්( කෙරෙ)හි (වූ දඬුවමේ) වදන මොවුහු කෙරෙහි ද නියම විය. සැබැවින්ම මොවුහු අලාභවන්තයින් වූහ.

(26) තවද "මෙම අල් කුර්ආනයට නුඹලා සවන් නොදෙවු. තවද නුඹලා (පාරායනයෙහි) අබිබවා යනු පිණිස එහි (බාධා ඇති කරවන) නිෂ්ඵල ක්‍රියාවන් කරවු" යැයි ප්‍රතික්ෂේප කළවුන් පැවසූහ.[10] (27) සැබැවින්ම අපි ප්‍රතික්ෂේප කළවුනට දැඩි දඬුවමක් විඳින්නට සලස්වන්නෙමු. තවද ඔවුන් කරමින් සිටි දැහි ඉතා නරකය සඳහා සැබැවින්ම අපි ඔවුනට ප්‍රතිවිපාක ලබා දෙන්නෙමු. (28) එය අල්ලාහ්ගේ

---

8) එකල ජනයා තමන් බාහිරව කරන දෑ පමණක් අල්ලාහ්ගේ දැනුමට ගෝචර වන අතර තමන් අභ්‍යන්තරයෙන් කරන්නා වූ ක්‍රියාවන් අල්ලාහ් නොදනී යන මිථ්‍යා මතයක සිටියෝය. එබැවින් ඊට පිළිතුරු වශයෙන් විනිශ්චය දින දී පාපතරයින්ගේ අවයවයන් තමන්ටම එරෙහිව සාක්ෂි දරනු ඇත. යැයි මෙම වැකිය පැහැදිලි කර ඇත.

9) මෙම වැකියෙහි 'මොවුන් අතර තිබෙන දෑ' යනුවෙන් අදහස් කරන්නේ මොවුන් ලොවෙහි කරමින් සිටි පාපකාරී දෑය. 'මොවුන්ට පසුව ඇති දෑ' යනුවෙන් අදහස් කරන්නේ මොවුන් මතුලොව නැතැ'යි පවසන නැවත නැගිටුවීම හා විනිශ්චය වැනි දෑය.

10) නබි මුහම්මද් තුමාණන් අල් කුර්ආනය පාරායනය කරන විට එකල සිටි ඇතැම් ප්‍රතික්ෂේපකයින් ඉස්ලාමය වැළඳගත් හේතුවෙන් නැවත එසේ ජනයා ඉස්ලාමයට අවතීර්ණ වීම වළක්වාළීම සඳහා ඇතැමුන් ඔහුගේ එම පාරායනය නොඇසෙන පරිදි ශබ්ද නගමින් බාධා ඇති වන ආකාරයේ ක්‍රියාවන්හි නියැළුණහ.

සතුරන්ගේ ප්‍රතිවිපාකයයි. එනම් නිරයයි. එහි ඔවුනට සදාතනික නිවහන හිමිය. (එය) ඔවුන් අපගේ වදන් ප්‍රතික්ෂේප කරමින් සිටි හේතුවෙන් වූ ප්‍රතිවිපාකයක් වශයෙනි. (29) "අපගේ පරමාධිපතියාණනි, ජින් හා මිනිසුන් අතුරින් අපව මුළා කළ දෙදෙනාව[11] අපට පෙන්වනු මැනව! ඔවුන් දෙදෙනා පහත් වූවන්ගෙන් වනු පිණිස අපගේ පාද වලට පහළින් ඔවුන් දෙදෙනාව අපි පත් කරන්නෙමු" යැයි ප්‍රතික්ෂේප කළවුන් (නිරය තුළ දී) පවසන්නෝය.

(30) සැබැවින්ම "අපගේ පරමාධිපති අල්ලාහ්" යැයි (විශ්වාසයෙන් යුතුව) පවසා පසුව (එහි) ස්ථිරව සිටියවුන් (පිළිබඳව නම්) මලක්වරුන් ඔවුන් වෙත (මරණාසන්න මොහොතේ දී මෙලෙස පවසමින්) පහළ වෙති. "නුඹලා බිය නොවවු. තවද නුඹලා දුක් නොවවු. නුඹලාට ප්‍රතිඥා දෙනු ලබමින් සිටි (ස්වර්ග) උයන පිළිබඳව නුඹලා ශුභාරංචි ලබා ගනිවු. (31) මෙලොව ජීවිතයෙහි ද මතු ලොවෙහි ද අපි නුඹලාගේ භාරකරුවන්ය. තවද නුඹලාගේ ආත්මාවන් ආශා කරන දෑ නුඹලාට එ(ම ස්වර්ගයෙ)හි ඇත. තවද නුඹලා (පතමින්) අයැදින දෑ ද නුඹලාට එහි ඇත. (32) (මේවා සියල්ල) අති ක්ෂමාශීලී පරම කරුණාභරිතයාණන් ගෙන් වූ සංග්‍රහයක් වශයෙනි." (33) තවද කවරෙකු අල්ලාහ් වෙත (ජනයින්ව) කැඳවා යහකම් කර " සැබැවින්ම මම (අල්ලාහ්ට) අවනතවන්නන් අතුරින් කෙනෙකු" යැයි පවසන්නේ ද ඔහුට වඩා ප්‍රකාශයෙන් ඉතා අලංකාරවන්නා කවරෙක් ද? (34) තවද යහපත හා අයහපත සම නොවන්නේය. (එබැවින්) ඉතා යහපත් දැයින් (අයහපත) වළක්වවු. එ(සේ කළ )විට නුඹ අතර හා කවරෙකු අතර සතුරුකමක් ඇත්තේ ද ඔහු සැබැවින්ම සමීපතම මිතුරෙකු මෙන්( වන්නේ)ය. (35) ඉවසන්නන්ට මිස මෙ(ම යහපත් ගතිගුණ)ය දෙනු නොලැබේ. තවද මහත් වූ භාග්‍ය හිමි අයට මිස ද මෙය දෙනු නොලැබේ. (36) තවද සැබැවින්ම ෂෙයිතාන්ගෙන් වූ පෙලඹීමක් නුඹව පෙලඹ වූයේ නම් එවිගස අල්ලාහ් වෙතින් (ෂෙයිතාන්ගේ උවදුරින්) ආරක්ෂාව පතවු. සැබැවින්ම ඔහුමය සර්ව ශ්‍රාවකය. සර්වඥය.

(37) රාත්‍රිය ද දහවල ද හිරු ද සඳු ද ඔහුගේ සංඥාවන් අතුරිනි. නුඹලා හිරුට හෝ සඳුට සුජූද් නොකරවු. නුඹලා අල්ලාහ්වම නමදිමින් සිටින්නෙහු නම් මේවා මැව්වා වූ ඔහුවම නුඹලා සුජූද් කරවු. (38) පසුව ද (නබිවරය,) ඔවුන් උඩඟුකම්පාන්නේ නම් (ඔවුන්ව අත හැර දමවු. මන්දයත්) නුඹගේ පරමාධිපති අබියස වූවන්(මලක්වරුන්, ඔවුන් මෙන් නොව) රාත්‍රියෙහි ද දහවලෙහි ද ඔහුව(අල්ලාහ්ව) පිවිතුරු කරති. තවද ඔවුන් වෙහෙසට පත් නොවෙති.

මේ වන විට උත්බහ් තම පිටුපසින් පොළව මත තම දෑත් හිටුවා හිඳගෙන නිහඬව අවධානයෙන් සවන් දෙමින් සිටියේය. නබි තුමාණන් පාරායනය නතර කළ පසු **"අබුල් වලීද්! මා ඔබට පාරායනා කර පෙන්වූ දෑට සැබැවින්ම ඔබ සවන් දුන්නෙහිය. දැන් ඔබත් එයත් බලා ගනිවු."** යැයි ඔහුට පැවසුවේය. අනතුරුව උත්බහ් කුරෙයිෂ්වරුන් වෙත හැරී ගියේය. එවිට ඔවුන් : **"අල්ලාහ් මත දිවුරා පවසන්නෙමු! සැබැවින්ම අබුල් වලීද් නුඹලාගෙන් සමුගෙන ගියවිට සිටි තත්ත්වයේ නොව, පිවිතුරු තත්ත්වයක නුඹලා වෙත හැරී පැමිණ ඇත."** යැයි පැවසුවේය.

පසුව එම සභාවේ රැස් වී සිටි උදවිය ඔහු අමතා : "අබුල් වලීද්! සිද්ධිය කුමක්දැ?"යි ඇසුවෝය. එයට උත්බහ් : "අල්ලාහ් මත දිවුරා පවසන්නෙමි! මීට පෙර කිසිසේත් මා අසා නොමැති සුවිශුද්ධ වදන් කිහිපයක් මුහම්මද්ගෙන් මා ඇසුවෙමි. අල්ලාහ් මත දිවුරා පවසන්නෙමි! එය කවියක් හෝ හූනියමක් හෝ මන්තරයක් හෝ නොවේ. එබැවින් මේ විෂයෙහි නුඹලා මට අවනත වවු. මා වෙනුවෙන් එය නුඹලා අත්හැර දමවු. (යහපත වෙත ඇරයුම් කරන සදාචාරය ස්ථාපිත කරන) ඔහුගේ කාර්යය කරගෙන යෑමට නුඹලා ඉඩ හරිවු. තවද නුඹලා ඔහුට (බාධාවක් නොවී) ඉවත් වී සිටිවු. අල්ලාහ් මත දිවුරා පවසන්නෙමි! ඔහුගේ වදනින් මා කුමක් සවන් දුන්නෙමිද සැබැවින්ම එය (අල් කුර්ආන) මගින් මහගු කරුණක් (බලයක්) සිදු වනු ඇත. අරාබිවරුන් එය ලබා ගන්නේ නම් නුඹලා අන් අය මගින් සෑහීමට පත් වන්නෙහුය. නැතිනම් ඔහු රජවරයෙකු හෝ නබිවරයෙකු වන්නේ නම් ජනයින් අතුරින් එමගින් ඉතා භාග්‍යමත් අය වනුයේ නුඹලාය. මන්දයත් ඔහුගේ රාජධානිය නුඹලාගේ රජධානියයි. ඔහුගේ ගෞරවය නුඹලාගේ ගෞරවයයි." යැයි පැවසුවේය. එය ඇසූ ඔවුන් : "අබුල් වලීද්! මුහම්මද් නුඹට හූනියම් කර ඇතැ"යි පැවසුවෝය. එයට උත්බහ් : "මෙය මා නුඹලාට දුන් අදහසයි. නුඹලා සිතන දැයක් කර ගනිවු." යැයි පැසුවේය.

ඉහත සම්පූර්ණ කථා පාඨය කියවීමෙන් සත්‍යය කුමක්දැ'යි ඔබට නිසැකයෙන්ම වැටහෙනු නියතය. එමෙන්ම අද අපේ රටේ සමාජය මෙහෙය වමින් ඔවුන්ගේ මනස් වැනසීමේ ප්‍රබල වෑයමක ඇතැම් විවේචකයින් නියැලෙමින් සිටින බව අප ඉතා කණගාටුවෙන් දන්වා සිටින්නට කැමැත්තෙමු.

---

11) මෙහි 'දෙදෙනා' යනු ජින්වරුන් අතුරින් ෂෙයිතාන් ද මිනිසුන් අතුරින් ආදම් තුමාණන්ගේ පුතෙකු වන කාබිල් ද වේ. මක්නිසාදයත් ෂෙයිතාන් මුල්ම ප්‍රතික්ෂේපයට හා කාබිල් මහා පාපයක් වන ඝාතනයට ප්‍රථමයෙකු ලෙස යොමු වූ හේතුවෙනි.

ඕනෑම විෂයක් සම්පූර්ණයෙන් හැදෑරීමෙන් හා කියවීමෙන් හැර එහි යථාර්ථය කුමක්දැ'යි හඳුනා ගැනීමට නොහැකි බව බුද්ධිමත් කිසිවෙකු දන්නා කරුණකි. මෙහි සමාජය නොමග යැවීම සඳහා සම්පූර්ණ කථා පාඨයේ ඉතාම සුළු කොටසක් ගෙනහැර පෙන්වා දී ඇති බව පාඨකයින්ට පහසුවෙන් වැටහෙනු ඇත. මේ සමගම ඔබට නබි මුහම්මද් තුමාණන්ගේ මහගුභාවය පිළිබඳව වටහා ගැනීම සඳහා ලොව පිළිගත් මුස්ලිම් නොවන්නන් විසින් එතුමන්ගේ මහිමය ලොවට හෙළි කළ ප්‍රකාශයන් ගෙන හැර පෙන්වන්නට කැමැත්තෙමු.

## මුස්ලිම් නොවන විද්වතුන්ගේ මතයන්

මුහම්මද් තුමාණන් පිළිබඳව ලොව මුස්ලිම් නොවන විද්වතුන්, නායකයින්, ඉතිහාසඥයින්, රාජ්‍ය පාලකයින්, ප්‍රශංසාත්මක අදහස් පළකර තිබුණද එයින් එක් වැදගත් ප්‍රකාශන කිහිපයක් උපුටා දක්වන්නට අදහස් කරන්නෙමු.

- මහාත්මා ගාන්ධි තුමා මුහම්මද් තුමාගේ චරිතය පිළිබඳව “Young India” (1924) සඟරාවට අදහස් දක්වමින්,

  http://navedz.com/quotes-mahatma-gandhi-on-prophet-muhammad-pbuh/

"අද ලොව සිටින දස ලක්ෂ සංඛ්‍යාත හදවත් වල රැඳී සිටිනා ශ්‍රේෂ්ඨතම පුද්ගලයා පිළිබඳව දැන ගැනීමට මට අවශ්‍ය විය. එය කියවන විට ඉස්ලාම් දහම බහුතරයක් මනුෂ්‍ය හදවත් වල විශේෂ තැනක් ගැනීමට හේතු වූයේ අසිපත නොවන බව වැටහුණි. එයට හේතු වූයේ නබි වරයාගේ චාම් ජීවිත රටාවයි. තමන් ගැන කිසිවිටෙක නොතකන පරාර්ථකාමී ගුණාංගයයි. එතුමාගේ පොරොන්දු වලට එතුමා දැක් වූ වැදගත් කමයි. එතුමාගේ සගයින්ට හා අනුගාමිකයින්ට එතුමා දැක් වූ කැපවීමයි. එතුමාගේ නොබියවන සුළු ස්ථිර බව, දෙවිඳුන් කෙරෙහි එතුමා තැබූ අචල විශ්වාසය, එතුමාගේ අරමුණු කෙරෙහි එතුමාට තිබුණු අධිෂ්ඨානය යනාදිය එතුමන් ඉදිරියේ තිබූ සියලු බාධක සුනුවිසුණු කළා මිස එය කළේ අසිපත නොවේ. නබි තුමාගේ ජීවිත කතාවේ අවසාන කොටස මා කියවා නිම කළ විට, එතුමා ගැන මට කියවන්නට යමක් නැති බව දැක මා ඉමහත් ශෝකයට පත් වීමි."

- මහාචාර්ය මෛකල් එච්. හාට් නමැති ඇමෙරිකානු ජාතික විද්වතා නබි මුහම්මද් තුමාණන් පිළිබඳව දක්වා තිබූ අදහස් දෙසට අපගේ අවධානය යොමු කරමු.

"ලොව ඉපදුනු සියලු නායකයින් පිළිබඳව ඉතා ගැඹුරු පර්යේෂණයක නියැළී 1978 දී “The 100:A Ranking of the Most Influential Persons in History” නමැති ග්‍රන්ථය ප්‍රකාශයට පත් කළේය. එහි දී ඔහු විසින් අංක එකට තෝරා ගනු ලැබුවේ මුහම්මද් තුමාණන්වය. එයට හේතු පහත සඳහන් අයුරින් ඔහු ඉදිරිපත් කර ඇත්තේය.

"මා විසින් මුහම්මද් තුමාව ලොව ජීවත් වූ, ජන සමාජයේ යහපතට බලපෑම් කළ නායකයින්ගේ ලැයිස්තුවේ අංක එකට තෝරා ගැනීම ඇතැමුන්ගේ ආශ්චර්යට හා ප්‍රශ්න කිරීම් වලට ලක් විය හැක. නමුත් ආගමික මෙන්ම ලෞකික ක්ෂේත්‍රයේ ශ්‍රේෂ්ඨ වූ සාර්ථකත්වයක් ලබා ගත් තවත් නායකයෙක් මිනිස් ඉතිහාසයේ නොමැත."

- මහාචාර්ය කේ. එස්. රාමක්‍රිෂ්න රාඕ සිය “Muhammed" The Prophet of Islam” යන කෘතියේ මෙසේ පවසයි,

"මුහම්මද්ගේ චරිතය නම් පරිමාණයට ඇතුල් වී එය සම්පූර්ණයෙන් වටහා ගැනීම ඉතා දුෂ්කර බව පෙනේ. ඇත්තෙන්ම මට ග්‍රහණය කරන්නට ලැබුණේ ඉන් බිඳක් පමණි. එය කෙතරම් මනස්කාන්ත සිද්ධි මාලාවක එකතුවක්ද? වරෙක දෙවිඳුන්ගේ යටහත් දූතයෙක් එතුමා තුළින් පිළිබිඹු වෙයි. මොහොතින් එතුමා වීර සෙන්පතියෙකි. විටෙක ඔහු වෙළෙන්දෙකි. සැණින් එතුමා රාජතාන්ත්‍රිකයෙකි, කථිකයෙකි, සමාජ ප්‍රතිසංස්කරණය කරන්නෙකි. තවත් එතුමා අනාථයින්ගේ රැකවලෙකි. වහලුන් නිදහස් කරන්නට වෙර දරන්නෙකි. ස්ත්‍රීන්ගේ ගැලවුම්කරුවෙකි. විනිසුරුවෙකි. සැදැහැවත් පුද්ගලයෙකි. එපමණක් නොව මෙම චරිත සියල්ලේම එතුමා එක හා සමාන කතානායකයෙකි."

- දාර්ශනිකයෙකු වූ ජෝර්ජ් බර්නාඩ් ෂෝ ඔහුගේ “The Genuine Islam” නම් 1936 දී ලියූ පොතේ අදහස් දක්වමින්,

"එතුමා මිනිස් වර්ගයාගේ ගැලවුම්කරුවා යැයි අමතනු ලැබිය යුතුය. එතුමා වැනි පුද්ගලයෙකු මෙම ලෝකයේ අධිරාජයා බවට පත් වුවහොත් වර්තමාන ලොව මුහුණ පා සිටින සියලුම ගැටළු වලින් එතුමා ලොව මුදවා ලොවට අද අත්‍යවශ්‍ය වී ඇති සාමය හා සතුට ගෙනෙනු ඇත යැයි මා තරයේම විශ්වාස කරමි. ලොව මෙතෙක් පා තබා ඇති විශිෂ්ටතම පුද්ගලයා එතුමාය. එතුමා දහමක් දෙසුවේය. රාජ්‍යයන් ස්ථාපිත කළේය. ජාතියක් ගොඩ නැගුවේය. ගුණ යහපත් බවට නව මුහුණු වරක් ඉදිරිපත් කළේය. නව දේශපාලනමය හා සමාජයීය ප්‍රතිසංස්කරණයන් ආරම්භ කළේය. ප්‍රබල හා ක්‍රියාශීලී සමාජයක් ගොඩ නැගුවේය. එම සමාජය මුහම්මද්ගේ දෙසුම් සියල්ල ක්‍රියාවට නංවමින් ඒ සියල්ල ප්‍රායෝගික බව ලොවට සනාථ කරමින් සිටින අතර, සදාකල් පවතින සේ මනුෂ්‍ය වර්ගයාගේ සිතුම් පැතුම්හි හා හැසිරීම් රටාවන් අතින් මහත් ඵලදායී පෙරළියක් ඇති කර ඇත්තේය. තිරිසන් ක්‍රියා වලින්ද අඥාණයේ අඳුරෙන්ද එකිනෙකා කුළල් කා ගැනීමෙන් හා වහල් බවෙන් පෙළී ආර්ථික අහේනියේ ගිනිපෙත්තේ සිටි අරාබීන්ව එයින් නිදහස් කර සමෘධිමත් දියුණුවක් කරා උසස් කරමින් මානුෂික සානුකම්පාව හා ශ්‍රේෂ්ඨ ගුණ දම් වලින් හෙබි සමාජයක් පෙරදැරි කොට ගත් උතුම් දහමක ධජය යටතේ එතුමා ජනයාව එක්සත් කළේය. සිවුපාවුන් මෙන් ජීවත් වෙමින් සිටි මිනිස් රංචුවක් මේසා විශාල අනගිභවනීය තලයකට පත් කිරීම සඳහා එතුමන්ට ගත වුයේ දශක දෙකක කාලයක් පමණක් වීම මෙම විපර්යාසය වෙත නැණවත් ලෝකයාට ඇති වන විමතිය සිය දහස් වාරයකින් වැඩි කරනු නියතය."

**(19) චෝදනාව** : එමෙන්ම ඇතැම් විවේචකයින් අල් කුර්ආනය මිත්‍යා ප්‍රබන්ධයක් යැයි සමාජගත කිරීමට වෙර දරා ඇති බව පහසුවෙන් අපට වැටහෙනු ඇත.

**විග්‍රහය** : අල් කුර්ආනය මිත්‍යා ප්‍රබන්ධයක් නම් අල් කුර්ආනය පහළ වීමට පෙර අතීතයේ සිදු වී ඇති යම් දෑ ද විද්‍යාවෙන් නොදියුණු එකල, මැතකදී සොයා ගනු ලැබූ විෂයන් එහි සඳහන් විය හැක්කේ කෙසේ දැ'යි කියා කරුණාකර මොහොතක් සිතා බලන ලෙස ඉල්ලා සිටින්නට කැමැත්තෙමු. එහෙයින් නිවැරදි අවබෝධයකින් යුක්තව අල් කුර්ආනය දෙස අවධානය යොමු කරන ලෙස ගෞරවයෙන් හා කාරුණිකව ඉල්ලා සිටින්නට කැමැත්තෙමු.

**ෆිර්අව්න් (Pharaoh)**

දැනට වර්ෂ 4000 කට පමණ පෙර ඊජිප්තුවේ පාලකයා වු දෙවන රැම්සෙස්ගේ පුත් මෙරනෙප්තා නොහොත් ෆිර්අවුන්ගේ මෘත දේහය දැනට තැන්පත් කර තිබෙන්නේ කයිරෝ නගරයේ තිබෙන ජාතික කෞතුකාගාරයේය.

"එබැවින් අද දින නුඹට පසුව පැමිණෙන්නන්ට නුඹ සංඥාවක් වනු පිණිස නුඹගේ දේහය අපි ආරක්ෂා කරන්නෙමු." (යැයි ෆිර්අවුන්ට පවසනු ලැබීය.) සැබැවින්ම මිනිසුන් අතුරින් බොහෝ දෙනා අපගේ සාධක පිළිබඳව අනවධානීන්ව සිටිති." (අල් කුර්ආන් 10:92)

මුහුදු පතුලෙන් සොයාගෙන කයිරෝ නගරයට ගෙනයන ලද මෙම දේහය සම්බන්ධව 1975 වසරේදී ප්‍රංශ විද්‍යාඥයින්ගේ සංගමයේ සාමාජිකයෙකු වුද ජාත්‍යන්තර කීර්තියට පත් විද්‍යාඥයෙකු වුද මහාචාර්ය මොරිස් බුකෙයිල් විසින් නූතන තාක්ෂණික ශිල්ප ක්‍රම උපයෝගි කර ගනිමින් වැඩිදුර පරීක්ෂණ පවත්වනු ලැබිණි. සියලු පර්යේෂණ අවසානයේදී විශ්මයට පත් ඔහු විසින් පහත සඳහන් ප්‍රකාශනය නිකුත් කරන ලදී.

"නූතන දත්ත අතර ශුද්ධ වූ ග්‍රන්ථ පිළිබඳ සාධක සොයන පිරිස ෆිර්අව්න්ගේ සිරුර පිළිබඳව කුර්ආන් වැකි පවසන අතිශයින් විශ්මය ජනක සාධක දැක ගන්නට නම් කයිරෝ නුවර ජාතික කෞතුකාගාරයේ රාජකීය මෘතදේහ තබා ඇති කාමරයට යා යුතුයි." (ග්‍රන්ථයඃ "The Bible Quran and Modern Science")

ෆිර්අව්න්ගේ සිරුර මුළු මහත් මනුෂ්‍ය වර්ගයාට අවවාදයක් ලෙසින් ආරක්ෂා කරන බව අල් කුර්ආන් හත්වන සියවසේ සඳහන් කළද කුර්ආනය පහළ වන සමයෙහි එම මෘත දේහය කිසිදු පුද්ගලයෙකු වුව ද සොයා ගෙන නොමැත. මෙම තොරතුරු සනාථ වූයේ 19 වන සියවසේ එම සිරුර සොයාගැනීමෙන් අනතුරුවයි. අල් කුර්ආනය විශ්වයේ පරමාධිපති විසින් පහළ කරන ලද පණිවිඩය බවට සහතික කරන්නට තවත් සාක්ෂි අවශ්‍ය දැ'යි ඔබෙන් විමසන්නට කැමැත්තෙමු.

ඔබගේ අවධානය පිණිස තවත් වැදගත් තොරතුරු කිහිපයක් සංක්ෂිප්තව ඉදිරිපත් කරන්නට කැමැත්තෙමු.

**මහ පොළොව හා කඳු**

ලොව බොහෝ විශ්ව විද්‍යාලයන්හි භූ විද්‍යාව හදාරණ සිසුන් භාවිත කරන පෙළපොතක් වන 'පෘථිවිය' (The Earth) ග්‍රන්ථයේ කර්තෘවරයෙකු වූ මහාචාර්ය ෆ්‍රෑන්ක් ප්‍රෙස් (Frank Press) හිටපු ඇමරිකානු ජනාධිපති ජිමී කාටර්ගේ විද්‍යා උපදේශකයාව සිටි අතර ඇමරිකානු ජාතික විද්‍යා ඇකඩමියේ (National Science Academy of U.S.A.) සභාපති ලෙස අවුරුදු 12 ක් කටයුතු කළ අයෙකි. මෙම 'පෘථිවිය' නම් ග්‍රන්ථයේ 435 වන පිටුවේ සඳහන් වන්නේ විශාල කඳු වැටි වලට පොළොව අභ්‍යන්තරයට දිව යන මුල් ඇති බවය. මෙම මුල් ඉතා තදින් පොළොව හා බද්ධ වී ඇති අතර එය කූඤ්ඤයක් (peg) ලෙස කටයුතු කරමින් පොළොවෙහි ස්ථායිභාවයට උපකාරි වන බවයි.

"තවද මිහිතලය නුඹලා සමග කම්පා නොවීමට එහි ස්ථිරසාර දෑ(කඳු) ද නුඹලා මග හඳුනා ගත හැකි වනු පිණිස මංමාවත් ද ගංගාවන් ද ඔහු ඇති කළේය." (අල් කුර්ආන් 16:15)

"මිහිතලය යහනාවක් ලෙස හා කඳු කූඤ්ඤ ලෙස අපි නිර්මාණය නොකළෙමු ද?" (අල් කුර්ආන් 78:6-7)

විශ්වයේ කොටසක් වූ අප පය ගසා ජීවත් වන පෘථිවියේ සැකසුම පිළිබඳව ඇති ඉතාම නූතන විද්‍යාත්මක සොයා ගැනීම් වර්ෂ 1450 ක් පමණ පැරණි අල් කුර්ආනයේ අංශු මාත්‍රයක පරස්පරතාවකින් තොරව සඳහන් වී තිබේ නම් අල් කුර්ආනයේ කර්තෘවරයා හා විශ්වයේ නිර්මාතෘවරයා එක් අයෙකු බව පිළිගැනීමට කාහට නම් අපහසුතාවක් තිබිය හැකි ද?

**මහා සාගරයේ අන්ධකාරය**

මුහුදු පත්ලේ මීටර් 200 ක් පමණ ගැඹුරට ගිය විට අන්ධකාරය ආරම්භ වී මීටර් 1000 ක් ගිය විට එහි සම්පූර්ණයෙන්ම අඳුර පවතින තත්ත්වයක් දැකිය හැක. මේ බව Elder සහ Pernetta විසින් ලියන ලද 'The Oceans' නම් ග්‍රන්ථයේ 27 වන පිටුවේ සඳහන් වේ. මිනිසාට කිමිදුම් උපකරණයන්හි ආධාරය නොමැතිව මීටර් 40 කට වඩා කිමිදිය නොහැකිය. විද්‍යාඥයින් ඉතා මෑතකදී සබ්මැරීන් හා අධිතාක්ෂණ උපකරණයන්හි ආධාරයෙන් ගැඹුරු සාගරයේ මෙම අන්ධකාරය සොයා ගත් අතර එයට අමතරව ගැඹුරු සයුරේ අභ්‍යන්තර ජල රළ ඇති බව ද සොයා ගන්නා ලදී. මේවා සියල්ල නූතන විද්‍යාත්මක සොයා ගැනිම්ය. මේ සම්බන්ධව අල් කුර්ආනය පවසන කරුණු කෙරෙහි අපගේ අවධානය යොමු කරමු.

"නැතහොත් (ඔවුන්ගේ ක්‍රියාවන්) ගැඹුරු සමුද්‍රයෙහි ඇති අන්ධකාරයන් මෙනි. රැල්ලක් එ(ම සමුද්‍ර)ය ආවරණය කරයි. එයට(එම රැල්ලට) ඉහළින් (තවත්) රැල්ලකි. එයටත් ඉහළින් වලාකුළකි. (මෙසේ) බොහෝ අන්ධකාරයන්ය. ඉන් සමහරක් තවත් සමහරකට ඉහළිනි. ඔහු තම අත (එහි) හෙළි කළ විට එය දකින්නට (පවා) නොහැකි තරම් ය. තවද **අල්ලාහ්** කවරෙකුට ආලෝකයක් ඇති නොකළේ ද එවිට ඔහුට කිසිදු ආලෝකයක් නොමැත." (අල් කුර්ආන් 24:40)

අල් කුර්ආනය මිනිසාගේ පියවි ඇසින් නිරීක්ෂණය කොට නිගමනය කර ගැනීමට නොහැකි ආකාරයේ ඉතා සුවිශේෂී තොරතුරු පෘථිවිය අභ්‍යන්තරය හා සාගර පත්ල පිළිබඳ ඉතාම නිවැරදි හා නූතන විද්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කරන්නේ නම් ඔබට එළඹිය හැකි නිගමනය කුමක් ද යන්න කරුණාකර සිතා බලන්න.

මෙම වැකියේ විද්‍යාත්මක ප්‍රාතිහාර්යයට වඩා වැදගත් වන්නේ මිනිස් ජීවිතයේ ආලෝකය අත්පත් කර ගැනීම පිණිස අප විසින් කළ යුතුව ඇති කාර්යයන් පිළිබඳ සිතා බැලීම නොවේ ද?

**කළල විද්‍යාව**

දැනට ලොව ප්‍රධාන පෙළේ වෛද්‍ය විද්‍යාලයන්හි නාරිවේදය පශ්චාත් උපාධිය හදාරණ සිසුන් කළල විද්‍යාව හැදෑරීම සඳහා උපයෝගි කර ගන්නේ කැනඩාවේ ටොරොන්ටෝ විශ්ව් විද්‍යාලයේ මහාචාර්ය කීත් මුවර් (Keith Moore) විසින් ලියන ලද "The Developing Human" යන ග්‍රන්ථයයි. භාෂා අටකට පරිවර්තනය කොට ඇති මෙම ග්‍රන්ථය ඇමරිකානු විද්වත් මණ්ඩලයක් විසින් එක් අයෙකු විසින් ලියන ලද ශ්‍රේෂ්ඨතම විද්‍යාත්මක ග්‍රන්ථය ලෙස තෝරා ගෙන ඇත. එතුමාගේ මෙම ප්‍රකාශනයන් අඩංගු දේශනයට අන්තර් ජාලයේ youtube.com වෙබ් අඩවිය මගින් ඔබට සවන් දීමට ද හැකිය. පසුගිය දශක තුන ඇතුළත විද්‍යාඥයින් විසින් කළලය හා කළලයේ වර්ධන අවධින් සම්බන්ධව සොයා ගත් කරුණු මෙතරම් සවිස්තරාත්මකව හා පූර්ණ නිරවද්‍යතාවකින් යුක්තව ශත වර්ෂ 14 කට පෙර මුහම්මද් තුමා විසින් හෙළිදරව් කර ඇත්තේ කෙසේ ද කියා සිතා ඔහු අතිශයින් මවිතයට පත් විය.

"තවද සැබැවින්ම අපි මැටියෙන් යුත් සාරයෙන් මිනිසාව මැව්වෙමු. පසුව අපි ආරක්ෂක ස්ථානයෙහි (ගර්භාශයෙහි) ශුක්‍ර ධාතුවක් ලෙස ඔහුව පත් කළෙමු. පසුව අපි ශුක්‍ර ධාතුව (ඇලෙනසුලු) ලේ කැටියක් බවට මවා පසුව ලේ කැටිය මස් කැබැල්ලක් බවට මවා පසුව මස් කැබැල්ල අස්ථි බවට මවා පසුව අපි

එම අස්ථි මාංශයෙන් පැලඳුවෙමු. පසුව වෙනත් මැවුමක් බවට අපි එය නිර්මාණය කළෙමු. නිර්මාපකයින් අතුරින් ඉතා අලංකාර අල්ලාහ් අති උත්කෘෂ්ට විය." (අල් කුර්ආන් 23:12-14)

ඉස්ලාමය ලොවේ ඕනෑම කොණක ජීවත් විය හැකි අන්දමින් අධ්‍යාත්මික අංශය පමණක් නොව ලෞකික ජීවිතයේ පවා තමන් මුහුණ දෙන්නා වූ සියලු විෂයන් අන්තර්ගත කර ගනිමින් සර්ව ප්‍රකාරයෙන් වටකර ගන්නා වූ සම්පූර්ණ ජීවන ක්‍රමයකි. උදාහරණ ලෙස කෘෂිකර්මය, සත්ව විද්‍යාව, භූගෝල විද්‍යාව, උද්භිත විද්‍යාව යනාදී විද්‍යාත්මක විෂයන් පමණක් නොව,(අල් කුර්ආන් 56:63/24-45/88:19-20/36:36) මිනිස් ගතිගුණ හා හැසිරීම්[12] සම්බන්ධවද, සෞඛ්‍ය සම්බන්ධවද, ආර්ථිකය[13] සම්බන්ධවද, මිනිස් ප්‍රවේණිය සම්බන්ධවද, මහා පාපයන් සම්බන්ධවද, දේශපාලනය[14] සම්බන්ධවද, යුද්ධය[15] සම්බන්ධවද, අපරාධ නීතිය[16] සම්බන්ධවද, අධ්‍යාපනය[17] සම්බන්ධවද, පවුල් ජීවිතය[18] සම්බන්ධවද, මරණින් මතු ජීවිතය සම්බන්ධවද නිරය හා ස්වර්ගය සම්බන්ධවද, මිනිස් ජීවිතයට අවශ්‍ය සියලු හා අනාගතයේ දී මුහුණ දෙන්නා වූ සියලු විෂයන් සම්බන්ධවද අල් කුර්ආනයේ වැකි 6666 ක් තුළ අන්තර්ගතව තිබෙන බව පවසන්නට කැමැත්තෙමු.

නමුත් අප ඉතා කණගාටුවට පත්වන කරුණක් නම් මෙලෙස විශ්ව කෝෂයක් බඳු අල් කුර්ආනය හා ඉස්ලාමය පිළිබඳ අල්ප මාත්‍රයක දැනුමකින් තොරව යුද්ධය සම්බන්ධ වැකි කිහිපයක් ගෙන ඒවා පොදු නීතියක් යන්නෙන් බොරු ප්‍රචාරයක් එල්ල කිරීමට වෙර දැරීම පිළිබඳවයි. ඇතැමුන් විසින් වෙබ් අඩවි වලින් අහුලා ගත් මෙම විකෘති කරන ලද වැකි කිහිපය හා තවත් බොහෝ ඉස්ලාම් විරෝධීන් විසින් ඉස්ලාමයට එල්ල කරමින් සිටින වැකි සම්බන්ධව බුද්ධිමය කෝණයෙන් බලන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටින්නට කැමැත්තෙමු. එවන් ගැටළු සහගත සියලු ඉගැන්වීම් අප දන්නා බවත් මෙවන් මතභේද අතීතයේ පටන් පැවති බවත් එවැනි සියලු කරුණු වලට කරුණු පහදා දීමට අප සූදානමින් සිටින බවත් දන්වා සිටින්නට කැමැත්තෙමු.

අල් කුර්ආනය විශ්වයේ පරමාධිපති විසින් පහළ කරන ලද පණිවිඩය බවට සහතික කරන්නට තවත් සාක්ෂි අවශ්‍ය දැ'යි විමසන්නට කැමැත්තෙමු. අල් කුර්ආනය මිත්‍යා ප්‍රබන්ධයක් නම් ඒවා එසේ සිදුවිය හැක්කේ කෙසේ ද? එමෙන්ම මෑත කලක දී විද්‍යාඥයින් විසින් සොයා ගනු ලැබූ විද්‍යාත්මක නියමයන් අවුරුදු 1400 කට පෙරම මුහම්මද් තුමාණන්ට අල් කුර්ආනය පිරිනමා ලොවට හෙළි කර තිබේ නම් එහි සත්‍යතාව වසන් කළ හැක්කේ කා හටදැ'යි විමසන්නට කැමැත්තෙමු. එහෙයින් නිවැරදි අවබෝධයෙන් යුක්තව අල් කුර්ආනය දෙස අවධානය යොමු කරන ලෙස ගෞරවයෙන් හා කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

ඉස්ලාමයට හා අල් කුර්ආනයේ ඉගැන්වීම් වලට විරුද්ධව සැලසුම් සහගතව දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රියාත්මක වන විරුද්ධවාදීන් විවිධ මාධ්‍යය ඔස්සේ ද්වේෂ සහගත ප්‍රචාර ගෙන යද්දීත් දිනපතා ලොව පුරා උගත් බුද්ධිමත් පිරිස ඉස්ලාමය කරා පැමිණීමම ඉස්ලාමය පිළිබඳ සියලු චෝදනා සාවද්‍ය බවට ප්‍රබල සාක්ෂියකි. එමෙන්ම ඉස්ලාමයේ ඉගැන්වීම් විවේචනය කරන්නට හෝ විමර්ශනය කරන්නට අවශ්‍ය නම් ඒ සඳහා ඉස්ලාම් විරෝධීන්ගේ වෙබ් අඩවි යොදා නොගෙන සත්‍යය මූලාශ්‍ර අධ්‍යයනය කරන මෙන් ඉතා බැගෑපත්ව ඉල්ලා සිටින්නෙමු.

තමන්ගේ ආගමික හා වාර්ගික අනන්‍යතාව රැක ගනිමින් හා අන් අයගේ ආගමික හා වාර්ගික අනන්‍යතාවට ගෞරව කරමින් කටයුතු කරන ශ්‍රේෂ්ඨ ආදර්ශමත් රටක් ලෙස අපගේ මාතෘ භූමිය යළි ගොඩ නගමු. අන්‍යෝන්‍ය අවබෝධය ගොඩනැගීම පදනම් කර ගෙන සකස් කෙරෙන මෙම ලිපිය අප අවංක ලෙසම අපේක්ෂා කරන්නේ ශ්‍රී ලාංකේය සැමට සුහදත්වය සාමය හා සහෝදරත්වයෙන් සපිරි අලංකාර සමාජ පරිසරයක් ගොඩ නැගීමටය. මෙම උදාර අපේක්ෂාව සාක්ෂාත් කර ගැනීම පිණිස අප සමග අත්වැල් බැඳ ගන්නා ලෙස ඉතා කාරුණිකව හා ගෞරව පූර්වකව ආරාධනා කරන්නෙමු.

---

12) 2:45/ 2:155/ 90:17/ 4:90/ 2:267/ 15:88/ 2:273/ 4:149/ 4:45/ 21:91/ 2:283/ 4:148/ 49:12 යනාදි වැකි.

13) 2:247/ 6:152/ 2:83/ 2:233/ 2:177/ 2:188/ 2:275/ 2:42/ 6:152/ 3:77/ 2:282/ 2:245/ 2:265 යනාදි වැකි.

14) 3:159/ 3:26/ 2:247/ 4:105/ 4:135/ 5:2/ 5:8/ 5:42/ 7:29/ 49:9 යනාදි වැකි.

15) 4:75/ 4:91/ 2:192/ 2:190/ 5:2/ 49:9 යනාදි වැකි.

16) 5:38/ 4:112/ 2:84/ 4:15 යනාදි වැකි.

17) 3:137/ 6:11/ 39:9/ 3:18/ 5:63 යනාදි වැකි.

18) 57:27/ 2:187/ 2:288/ 17:24/ 2:83/ 26:86/ 2:233/ 2:215/ 2:181/ 6:137/ 12:05/ 4:08 යනාදි වැකි.